# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2020.07.21

වර්ෂ 2020 ක් වූ ජූලි මස 21 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ජූලි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සභභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
08. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
09. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
10. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
11. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
12. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
14. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
15. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
16. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
17. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
18. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
19. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
20. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

(ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>01) 2020 වර්ෂයේ ජූනි මස මහා සභා රැස්වීමේ වාර්තාව ( I. පළමු කොටස 2020-06-16, II. දෙවන කොටස 2020-06-23) සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** 2020 වර්ෂයේ ජූනි මස මහා සභා රැස්වීමේ වාර්තාව (I. පළමු කොටස 2020-06-16, II. දෙවන කොටස 2020-06-23) කියෙව්වා සේ සලකා,

විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020 වර්ෂයේ ජුනි මස මහා සභා රැස්වීමේ වාර්තාව (I. පළමු කොටස 2020-06-16, II. දෙවන කොටස 2020-06-23) ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ජුනි මස මහා සභා රැස්වීමේ වාර්තාව (I. පළමු කොටස 2020-06-16, II. දෙවන කොටස 2020-06-23) සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

2020 වර්ෂයේ ජුනි මස මහා සභා රැස්වීමේ වාර්තාව ( I. පළමු කොටස 2020-06-16, II. දෙවන කොටස 2020-06-23) ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා නියමිත වේලාවට මහා සභා රැස්වීම සඳහා සහභාගි වෙන්න කියලා සියලු මන්ත්‍රීවරුන්ගෙන්. ඒක මුල් කාලයේ සිද්ධ වුණා. දැන් එන්න එන්න ඒක ගැන එච්චර සැලකිල්ලක් වෙන්නේ නැති ගතියක් තමයි පේන්නේ. ඒක ආපු අයට කියලා වැඩක් නැහැ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ වර්ෂාපතනය සමඟ පාරවල් යටවීමත් එක්ක මන්ත්‍රීවරුන්ට බාධා ඇති වුණාද දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මට දැනුම් දුන්නේ උප සභාපතිතුමා විතරයි. එහෙම ජලයෙන් යටවීමක් සම්බන්ධව. කෙසේ හෝ මම ඉල්ලා සිටිනවා. ඒක ආපු අයට කියලා වැඩකුත් නැහැ. ආපු නැති අයට තමයි විශේෂයෙන්ම කියන්නත් ඕන. සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා නියමිත වේලාවට මහා සභා රැස්වීම ආරම්භ කරන්න පැමිණෙන්න කියලා.

ඒ වගේම ඔබතුමන්ලා දන්නවා වර්තමානයේ රටේ පවතින කොරෝනා වසංගත තත්ත්වය පිළිබඳව. ඒ කොරෝනා වසංගත සමය තුළ මහා සභා රැස්වීම් සඳහා සහභාගිවීමට සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් මාලාවක් තියෙනවා. ඉතින් ඒ අනුව ඒ කොරෝනා වසංගත සමය තුළ ඒ නියමිත ආකාරයෙන් මහා සභා රැස්වීම් සඳහා සහභාගි වෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මුඛ ආවරණ පැළඳ සිටීම, මීටරයක දුර පවත්වා ගැනීම, ප්‍රාදේශීය සභා පරිශ්‍රයට ඇතුල්වීමේදී සබන් යොදා අත් සේදීම, විෂබීජහරණයට ලක්වීම, ඒ උපදෙස් මාලාව ඔබතුමන්ලාට ලබාදීලා තියෙනවා. ඒ අනුව කටයුතු කරන්න කියලා මම සියලු සභික මහත්ම මහත්මීන්ගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම දන්නවා ඊයේ ඇතිවෙච්ච නොසිතූ ගංවතුරෙන් බෝපෙ පෝද්දල සමහර පැතිවල ජනතාව පීඩා වින්දා. ඒ පිළිබඳව සභාපතිවරයා විදියට මගේ කණගාටුව මෙම අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒ වගේම කියන්න ඕන මේක වෙනදා ගංවතුර වගේ නෙමෙයි. ආවා එහෙමම පැය ගාණකින් වතුර බැහැලා ගියා. අපිට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස්කරන්න වෙලාව තිබුණේ නැහැ. වෙනදා නම් දවස් දෙක තුනක් යනතුරු ඒ මට්ටමම තියෙනවා. ඒකෙදී අපෙන් ඉල්ලීම් කරපු අයට උපදෙස් දුන්නා අපේ තාක්ෂණ නිලධාරීන් යොදවලා යම් යම් ස්ථානවලට. නමුත් සභාවක් විදියට පොදුවේ අපිට ක්‍රියාමාර්ගයක් ගන්න දෙයක් තිබුණේ නැහැ. ඒකෙදි අපි දැකපු දෙයක් තිබුණා. ඒ සුළු වෙලාව ඇතුළත ආපු ගංවතුර තුළ එච්චර හානියක් වුණේ කුඹුරු ගොඩ කරලා තිබීම, ඒ අකාරයෙන් ගත්තම කාණු ගොඩකරලා තිබීම නිසා. ඒක හොඳටම පැහැදිලියි. ඔබතුමන්ලාට පේනවා ඇති ප්‍රථමයෙන්ම ඒ තත්ත්වයට පත්වෙන්නේ ඒ දේවල් කරපු අය. ඒ දේවල් කරපු අය ඒ තත්ත්වයට පත්වුණාට පස්සේ අන්තිමට චෝදනාව එල්ල කරන්නේ සභාවට. තමන් විසින්ම තමයි ඒ හානිය කරගෙන තියෙන්නේ. ගොඩක් පහත්බිම් යටවෙනකොට ඒ පහත්බිම්වල ඉදිකිරීම් කරපු අය තමයි ඒකෙන් මුලින්ම පීඩාවට පත්වෙන්නේ. ඒ පීඩාව තුළ තවත් බහුතරයකට ඒ මාර්ගයේ ගමනාගමන අපහසුතා ඇති වෙනවා. ඒකට මොකක් හරි නිශ්චිත වැඩපිළිවෙලක් මම හිතන්නේ හදන්න ඕන. හැබැයි බද්දේගම පාර පළල්වීමේදී නම් දැන් ඔබතුමන්ලාට පේනවා ඇති ඒකේ විධිමත් කාණු පද්ධතියක් සකස්වෙනවා. ඒක අපි දිගින් දිගට කියලා තියෙන කාරණයක්. නමුත් අතුරු මාර්ග ටිකේ ඒ තත්ත්වය නෙමෙයි තියෙන්නේ. ඒක තුළ තමන් විසින්ම තමයි ඒ හානිය කරගන්නේ. මේක නිතර නිතර අපි කතාකරන කාරණාවක්. අපිටත්

වගකීමක් තියෙනවා ප්‍රාදේශීය සභාව විදියට. අපිත් පුළුවන් තරම් ඒ අවහිරකිරීම් කරන්න ඉඩ දෙන්නේ නැහැ. අපි ගිහින් අපේ උපරිම උත්සාහය දරනවා. දෙවැනි කාරණය නීතිමය පැත්තට යන්න වෙනවා එහෙම නොකරනවා නම්. අපිට බලහත්කාරයෙන් ගිහිල්ලා කඩා බිඳ දාන්න හැකියාවක් නැහැ. ඔය ආකාරයෙන් ගත්තම සමස්තයක් විදියට මේ කාරණය මීට වඩා පුළුල්ව අපි දකින්න ඕන කියන එක තමයි අපේ හැඟීම. එතනදී මහජන නියෝජිතයෝ විදියට අපිට විශාල වගකීමක් තියෙනවා. අඩුම තරමේ මේක 100%ක් නැතත් 75%කින් වත් මේ කාරණය අවම කර ගන්න අපිට වගකීම තියෙනවා. ඒක එක කාරණයක්.

ඊළඟට ආදාහනාගාරය පිළිබඳ කාරණයේදී දැනට භූමිය මැනුම් කටයුතු සිදුකරලා පර්චස් අසූවක් වෙන්කරගෙන තියෙනවා නරාවල සිට්ට්‍රස් වත්තෙන්. ඊට පස්සේ "නර්ඩ්" ආයතනයෙන් ඒකට සැලසුම් හා ඇස්තමේන්තු කටයුතු සකස්කරගෙන යනවා. අපි ඔවුන්ගේ ඇස්තමේන්තු ලබාගෙන කොහොම හරි මේක පුළුවන් තරම් ඉක්මනට සාර්ථකව කරන්න තමයි බලාපොරොත්තු වෙන්නේ. දේශීය ණය අරමුදලෙන් ණය මුදලක් අපි ඉල්ලුම් කරලා තියෙනවා අදාළ කාරණයට. මෙතන කලේගාන පොළ භූමියේ ඉදිකෙරෙන ගොඩනැගිල්ලටත් අපි දේශීය ණය අරමුදලෙන් ණය මුදලක් ඉල්ලුම් කරලා තියෙනවා. එතනදී දැන් ඇස්තමේන්තු පවා සකස්කරලා අවසන්. එකේ සැලසුම සකස්කරලා අවසන් අදියරේ තියෙන්නේ. ඉතින් ඔය කාරණා දෙක තමයි ප්‍රධාන වශයෙන් තියෙන්නේ. මේ ඉදිරි මාස දෙක තුන තුළ මේ වැඩ ආරම්භ කරන්න තමයි අපි සැලසුම් කරලා තියෙන්නේ. එතනදී අදාහනාගාරයට දැන් එන්.බී.ආර්.ඕ ආයතනයෙන් අපි නිර්දේශ ඉල්ලලා තියෙනවා. පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මේක කිරීමට මූල්‍යමය හැකියාවක් අපිට තියෙනවා කියලා නිර්දේශයක් ඕන. ඒ කටයුතු තමයි මේ දිනවල කෙරෙමින් පවතින්නේ. ඒ පිළිබඳව සියලුදෙනාම අවධානයෙන් ඉන්න. මොකද බෝපෙ පෝද්දල ඔබ සියලුදෙනාම මහජන නියෝජතයෝ විදියට දායකත්වය දක්වන්න ඕන කාරණයක් මේක. දිගින් දිගට අපිට ආදාහනාගාරයක් පිළිබඳව අපි කතාවෙන කොටත් විරෝධතා ඇවිල්ලා හැම වෙලාවේම මේක යට ගියපු තත්ත්වයක් තිබුණේ.

ඊළඟට තවත් කාරණාවක් තමයි දැන් ඔබතුමන්ලා දන්නවා අපිට මාස හයක කාලයක් තමයි ලබාදීලා තියෙන්නෙ මොන්රෝවියා වත්තේ කසළ බැහැර කිරීමට. දැන් කොරෝනා තත්ත්වය හින්දා යන්තම් ඒ කාලය දිගුකරා. අගෝස්තු 23 වෙනිදා අධිකරණයේ එම නඩුව විභාග වෙනවා. බොහෝවිට අපිට වාරණයක් එන්න ඉඩ තියෙනවා අධිකරණයේ තියෙන නඩුවේදී. ඒ හින්දා මම ඉල්ලා සිටිනවා තමන්ගේ ප්‍රදේශයේ හරි අපිට කසළ බැහැර කරන්න පුළුවන් ඉඩමක් අපිට මිලදී ගන්න මට්ටමකට හරි, ඉඩමක් තියෙනවා නම් මොකක් හරි වැඩපිළිවෙලක් ඔබතුමන්ලාගේ අදහස් අනුව මැදිහත්වෙලා ඒකට පෙරමුණ ගන්න කියලා ඉල්ලා සිටිනවා. ඒක මට විතරක් නෙමෙයි, පොදුවේ සියලුදෙනාටම එන චෝදනාවක් තමයි කසළ බැහැර කරන්න ස්ථානයක් නොමැති වුණොත්. ඉතින් ඒකේදී ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා මම සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලගෙන් ඉල්ලා සිටිනවා.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා, ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා, ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා  සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඔබතුමා අද හොඳ ආරම්භයක් ගත්තේ. ඇත්තටම ගංවතුර පිළිබඳව කතා කරන්න ඕන. ඒක අපි කාටත් බලපානවා මහජන නියෝජිතයෝ විදියට. මම හිතන්නනේ අපි මේවා ගැන දිගින් දිගට කතාකරා. අපෙන් වෙච්ච අඩුපාඩුව තමයි, සමස්ත සභාව විදියට අඩුපාඩුව තමයි බලපෑවේ මේක මෙහෙම වෙන්න. මම හිතන්නේ අපි යනකොට දන්නවා හොඳටම යටවෙන්නේ හෝළුවාගොඩ වෙල්යාය, නෙළුම්වල ඒ වගේ තැන්. හැබැයි දැන් යටවෙන්නේ කොහේවත් නෙමෙයි හපුගල. මම එනකොට හපුගල මුළු ප්‍රදේශයම යටවෙලා. ඊළඟට බෙලිගහ පැත්තට යනකොට සංසමිත්තේ පැත්ත ඔක්කොම යටවෙලා. මේ තියෙන ඔක්කොම වැරදි ක්‍රියාකාරකම් නිසා සිදුවෙච්ච දේවල්. ඉතින් ඒක නිසා මතක් කරන්න තියෙන්නේ දැන් හරි අපි ඇත්තටම මේකට කෙලින් හිටගමු. කෙලින් හිටගෙන ඒ පිළිබඳව සම්පූර්ණ සහයෝගය ලබා දෙමු. පක්ෂ භේදයකින් තොරව සහයෝගය ලබා දෙනවා කිසි කතාවක් නැහැ. දැන් දැනිලා තියෙනවා. ඒ වගේම ලොකු මහන්සියක් ගරු අමාත්‍යතුමා ගත්තා වගා ව්‍යාපාරය පිළිබඳව. ඒක එක ගංවතුරෙන් ඉවරයි. ඒකට මම හිතන්නේ දැන් තමයි සම්ප්‍රදායික ගංවතුර ඇවිල්ලා තියෙන්නේ. හෝළුවාගොඩ වෙල්යාය පවා දැන් යටවෙලා. එතන එහා කොනේ ඉඳලා එන්න බැහැ දැන් වතුර. ඔක්කොම පැති යටවෙලා. මේකට ඇත්තටම ඇමතිතුමා හරහා සභාවෙන් ඉල්ලීමක් කරන්න. ස්ථිර විසඳුමක් ඕන. මේක එනකොට මෝය කට කපන්න යන්න බැහැ. මෙතන ප්‍රශ්නයක් තියෙනවා. මේ මෝය කට පිළිබඳ ප්‍රශ්නයේදී ඒක පිළිබඳව අපිට තියෙන තාක්ෂණික දැනුම මදි වෙන්න පුළුවන්. නමුත් මේ ගොවියෝ බොහෝ දේ දකිනවා. බෝක්කුව දාන්න ඕන තැන් ඉංජිනේරුවන්ට වඩා දකින්නේ ඒ අය. ඒ අයගේ අදහස් තියෙනවා මෝය කට පළල් කිරීම සම්බන්ධව. ඒක පැහැදිලි දැක්මක්. ඉතින් මම කියන්නේ ඒ අයත්, තාක්ෂණික දැනුම තියෙන අයත් අරගෙන ස්ථිර වැඩපිළිවෙලකට යන්න කියන්න. එහෙම නැත්නම් මේ සභාවෙන් යෝජනා කරන්න. ඇත්තටම එහෙම නොකෙරුනොත් එහෙම මේ වගාව හානි වෙනවා. අද වෙනකොට උක්වත්ත, හෝළුවාගොඩ වෙල්යාය දැවැන්ත විදියට හානිවෙලා. චමින්ද මන්ත්‍රීතුමා එහෙම දන්නවා ඇති හෝළුවාගොඩ වෙල්යායේ මහන්සිවෙලා වැඩ කරපු ඔක්කොම ඉවරයි. ඒකෙ තේරුමක් නැති වෙනවා. පාරවල් නම් සල්ලි තියෙන විදියට කරාට කමක් නැහැ. ටිකක් කරනවා. ඉතුරු ටික සල්ලි ආවම

කරන්නේ. ඇළ මාර්ගවලත් එහෙම කරා ඉස්සර. මම දිගින් දිගටම කියපු එකක් තමයි ඇළවල් නම් එහෙම කරලා වැඩක් නැහැ. කොනකට වෙනකම් කරන්න බැරිනම් වැඩක් නැහැ. මේ පාර මම හිතන්නේ රජය මැදිහත්වීමෙන් කරගෙන ගිය නිසා ඒක කොනකට යන විදියට කරගෙන ගිහිල්ලා තියෙනවා. මම හිතන්නේ මේවා තමයි ප්‍රධාන ප්‍රශ්න.

ඊළඟට ගරු සභාපතිතුමා දැන් බලන්න ඊයේ දවසේ ඔබතුමාලාගේ ගම් ප්‍රදේශයේ රොස්වුඩ් එකේ ඔක්කොම හෝදගෙන ගිහිල්ලා. ඔක්කොම ඉවරයි. දැන් තියෙන කාපට් කරපු පාර පවා ඉවර වෙනවා. ගල් ඔක්කොම ඇවිල්ලා යටත් හාරගෙන යනවා. ඉතින් ඒක හින්දා මම හිතන්නේ මේවා පිළිබඳව ඉතින් එක්කහු වෙලා ගන්න තීන්දුවක්. අර කන්දේ යනකොට පේනවා ඇති. මොකද හේතුව මේ තීන්දු තීරණ නොගත්තොත් ඇත්තටම මේක අවලස්සන තැනකට යනවා.

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒකේ යෝජනාවක් විදියට ඉදිරිපත් කරනවා. අපි කමිටුවක් හැදුවනේ පහුගිය දවස්වල අනවසර ඉදිකිරීම් පිළිබඳව කටයුතු කරන්න. මම කමිටුව හැදුවෙත් මම පැත්තකට තියලා මේකෙ වැඩේ කෙරෙයි කියලා. දැන් ඔබතුමන්ලාටත් වගකීමක් තියෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ ඒ කමිටුව රැස්වෙන්න. ඒ කමිටුවෙන් තීන්දු තීරණ ගන්න. අරගෙන කියන්න මෙන්න මේක වෙන්න ඕන කියලා. මගේ කිසි බලපෑමක් නැහැ. මගේ පුද්ගලික සම්බන්ධකම් තියෙන කිසි කෙනෙක් නැහැ. ඒක මම අවධාරණයෙන් කියනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. ඕනම තීන්දුවක් අරගෙන කියන්න වෙන්න ඕන කියලා. මෙන්න මේ කාණු පද්ධතිය අවහිරවෙලා තියෙනවා, මෙතන බැම්මක් බැඳලා තියෙනවා, මේ කාණුව අවහිර කරලා තියෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ කමිටුව රැස්වෙලා ඒ තීන්දු කියන්න ක්‍රියාත්මක කරන්න කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අබේසේකර මන්ත්‍රීතුමත්, අපිත්, මේ සභාවේ සියලුදෙනාත් මේ ගොඩකිරීම් සහ නායයෑම් පිළිබඳව දිගින් දිගටම කතා කරනවා. සභාපතිතුමා කියන කතාව ඇත්ත. අපි කමිටුවක් හැදුවා. ඒ කමිටුව හැදුවට ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. පහුගිය දවස්වල වෙච්ච සිද්ධිත් එක්ක ඒක හරි. දැන් මේ මැතිවරණයකුත් ඇවිල්ලා තියෙනවා. එතනදී අපිට අපහසුතාවයක් තියෙනවා. හැබැයි ඉදිරියේදී මේ කාරණය ඉෂ්ට කරන්න ඕන. ඒකට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න. අපිට මේ මෝටර් බයිසිකලයෙන් කොට කොට ගිහිල්ලා මේක කරන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. පරණ කැබ් එක දෙන්නම්. පරණ කැබ් එක දැන් අළුත්වැඩියාවට දාලා තියෙන්නේ. ඒක දෙන්නම්. මේවාට කොළඹ යන්න වුණත් මම දෙන්නම් කිව්වනේ. මතක ඇතිනේ. පරණ කැබ් එක මෙතන කාර්යාල කටයුතු නැති දවසක දෙන්නම්. ත්‍රීවිල් එක තියෙනවානේ බැංකු යන්න. අවශ්‍ය දවස් කියන්න. කිසි ප්‍රශ්නයක් නැහැ දෙන්නම්. ඒක හරි.

(ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ වගේම තමයි ගරු සභාපතිතුමා, දැන් අපි නිකන් කිව්වම පස් කපන එක පිළිබඳව දිගටම කතා කරනවා. කවදාහරි දවසක සභා වාර්තාවල් තියාගෙන හිටියොත් අපිට කියන්න පුළුවන් ඉදිරි කාලය තුළදී ඔය කඳුවල තියෙන බිල්ඩිමක් දෙකක් බිමට පහත් වෙනවා. ඒක කාටවත් නවත්වන්න බැහැ. දැන් අර තියෙන ගොඩනැගිල්ල ගැන අපි කියලා තියෙන්නේ ප්‍රසිද්ධියේ. මේක ඇත්තටම මාධ්‍යයට යන්න ඕන. මොකද අපි කියන දේ කරන්නේ නැහැනේ මෙතනදී. ජනතාව මේක පිළිගන්නේ නැහැ. ඉඩම් වෙන්දේසිකරුවන් ඒක පිළිගන්නෙත් නැහැ. අනවශ්‍ය විදියට අංශක හැටට කඳු කපලා ගෙවල් හදනවා. ඒ ගෙවල් පහලට එනවා. මෙතුමා මේ කතා කරන බටුවන්තුඩාවේ ගේ දැනට තියෙනවා. කොයි වෙලාවක හරි ඒක ඇළ වෙනවා. ඒ මිනිස්සු එක්කෝ දැනගන්න ඕන ගෙවල් හදනකොට. ඒක එක කාරණයක්.

ගංවතුර පිළිබඳ ප්‍රශ්නය මටත් තියෙනවා. උදේ ගිහින් බැලුවා. උදේ 06.00 වෙනකොට කෝල් කරනවා ගංවතුර ගලලා මෙහෙමයි කියලා. මම හිතන්නේ අවුරුදු 40ක වගේ කාලයක් තුළ ගංවතුර සම්බන්ධව අපිට අත්දැකීම තියෙනවා. ගිංගඟ ව්‍යාපාරයේ භාගයට වැඩ කෙරුනද මම දන්නේ නැහැ. ඒ ව්‍යාපාරය නිසා කාලයකට හොඳයි. කාලයකට ගංවතුර. අවුරුද්දකට හත් අට වතාවක් ගංවතුරට අපි යටවෙනවා. අපිට තියෙන එකම ප්‍රශ්නය මේක. මේක විශාල ප්‍රශ්නයක්. අපේ බල ප්‍රදේශයේ ගෙවල් දාහක් විතර යටවෙන තත්ත්වයක් තියෙනවා. මේකට පහුගිය රජයේ සම්බන්ධීකරණ රැස්වීමකදී මම දැක්කා අපේ ඇමතිවරු කතා කරනවා නිල්වලා - ගිංගඟ යෝජනා ක්‍රමයක් තියෙනවා කියලා. ඒ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරොත් මේ ගංවතුර නවතීවි කියනවා. අපිට එහෙම හිතන්න පුළුවන්. අපි නෙළුව පැත්තෙන් හරි, කොහෙන් හරි වේල්ලක් දාලා එන වතුර ටික නවත්තගෙන ඒ වතුර තවත් පැත්තකට, එක්කෝ මාතර හම්බන්තොට පැත්තට යන ක්‍රමයක් හැදුවොත් මෙහෙන් බහින වතුර ප්‍රමාණය අඩුවෙලා ඒ ගංවතුරට සහනයක් ඒවී. මේ සියලු සංවර්ධන කටයුතු කරන්න ඕන. හැබැයි මේ පාරවල් හදන්න ඕන. ගුවන් තොටුපල හදන්න ඕන. ඊට අමතරව මේ ගංවතුර වළක්වන්න මේ කාරණාවල් ඇතිවෙන්න ඕන. අපි දැක්කා පහුගිය කාලයේ වයඹ

ප්‍රදේශයේ සංචාරය කරද්දී වැවයි, දාගැබයි, කුඹුරයි. වැව හදලා තියෙනවා. ඊට පස්සේ දාගැබ හදලා තියෙනවා. දාගැබෙන් පස්සේ කුඹුර තියෙනවා. මේ දකුණු පළාතේ ඒක සිද්ධවෙලා නැහැ. දැන් ඒ පළාත් ගංවතුරට යටවෙන්නේ නැහැ. වැව තියෙනවා. දාගැබ හදලා තියෙනවා පස් ටික කපලා. කුඹුරු ටික එහෙන් අස්වද්දනවා. ඉතින් මේ වගේ වැඩපිළිවෙලකට මේක යන්න ඕන. මම දන්නේ නැහැ. අපි ප්‍රදේශීය මට්ටමෙන් මේ ගැන කතා කරනවා අපිට තියෙන දැනුම අනුව. මේවා කෙරෙන්න ඕන දේවල්. මේවා යන්න ඕන දේවල්. මේවා නොකරෙන්න නොකරෙන්න තමයි අපි මේ ගංවතුරට මුහුණ දෙන්නේ. ඒක හින්දා විශේෂයෙන්ම ඉදිරියේදී අපේ රජයක් ආවම, රජයත් එක්ක මේ යෝජනා ක්‍රියාත්මක කරන්න කියලා අපි යෝජනාවක් විදියට කරන්න ඕන. ඉතින් ඒ කාරණය එහෙම කරමු කියලා මම යෝජනා කරනවා.

(ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සමාවෙන්න, විනාඩියක් දෙන්න. ඕන තරම් වෙලා කතා කරන්න අහගෙන ඉන්නම්. ගරු සභාපතිතුමනි, අපේ නායකයා සජිත් ප්‍රේමදාස මැතිතුමා තමයි ගෙනාවේ වැවයි, දාගැබයි, කුඹුරයි සංකල්පය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ නායකයා වෙන්නේ කොහොමද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපේ ඒ කාලේ නායකයා මම ඡන්දය දුන්නට. මම වෙන එකක් කියන්න ගෙනාවේ මේක. මම නම් කියනවා වාසනාවට වෙන්න ඇති එතුමාට ඒ බලය නොගියේ. නැත්නම් මල ඉලව්වේ මෙතන වළවල් හාරාවී. ඒ පාර මේවා හදාවී. මේ හෙන ගහන වැඩක්. වැවයි, දැගැබයි, කුඹුරයි සංකල්පය හරියන තැන් තියෙනවා. ඒ ඇරෙන්න මේක මහා විහිළුවක් වෙනවා වළවල් හෑරුවම. දැන් ඇත්තටම වැවක අවශ්‍යතාවය බොහොම තියෙනවා හෝළුවාගොඩ යායට. හදනවා නම් හොඳයි.

ඒ වගේම ලොකු උස් කඳු මුදුන්වල හදන්නේ නැහැ ජල තටාක. එදා ඒ විශේෂඥයෝ කියපු දේවල් පිළිගත්තේ නැහැ රන්දෙණිගල, අරවා මේවා හදනකොට. ඒවා ඉක්මනට හැදුවා. ඒවායේ ප්‍රයෝජනයක් තියෙනවා. නැතෙයි කියන්න යන්නේ නැහැ. අධිවේගී මාර්ගයේ ප්‍රයෝජනයක් තියෙනවා. හැබැයි ඒකෙදී පළවෙනියට හරිම දේ නෙමෙයි කෙරුණේ. ඒකෙත් අතුරු ප්‍රතිඵල තියෙනවා. ලෝකයේ රටවල් මේ ප්‍රතිඵල වින්දා බොහොම ලස්සනට. ඇමෙරිකාව එහෙම උදාහරණයක්. උඩක හදනකොට ලොකු තටාක හදන්නේ නැහැ. එහෙම ලංකාවේ හදනකොට විශේෂඥයෝ විරුද්ධ වුණා. ඒවා පිළිගත්තේ නැහැ. ඉතින් ඒ අදහස හොඳයි. පොඩි පොඩි තටාක ඒවා එන්න ඕන.

ඒ වගේම මාධ්‍යය මේවා බොහොම පැහැදිලිව සඳහන් කරන්න ඕන. අපේ මාධ්‍යය පහුගිය කාලයේ වාර්තා කරේ අපේ දෙන්නෙක් ගහගත්තොත් විතරයි. මොකක් හරි වුණොත් විතරයි. මේ අනම් මනම් ඒවා. ඒක හින්දා ඉතාම ගෞරවයෙන් කියනවා මේ දේ එහෙම කරන්න. මේ දැන් ගංවතුරට හේතුවෙච්ච, පාදක වෙච්ච දේවල් අපි සභාවක් විදියට දන්නවා. හැබැයි මේ චෝදනාව එනකොට එන්නේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ට. ඒක ගරු සභාපතිතුමාට විතරක් යන්නේ නැහැ. මේ සභාපති නෙමෙයි කොයි සභාපති හිටියත් ඒක යන්නේ එහෙම. හැබැයි මේ වැරැද්ද කරන්නේ වෙන කවුරුවත් නෙමෙයි. සභාපතිවරු, මන්ත්‍රීවරු හා මහජන නියෝජිතවරු. ඉතින් ඇවිල්ලා ඒක එක එක්කෙනාට බලපානවා. නමුත් බලන්න එන්.බී.ආර්.ඕ එක දෙනවා නම් වාර්තාවක්, අර රොස්වුඩ් එකට දෙනවා වාර්තාවක්. බැලූ බැල්මට මේවා කොහොමද කරන්නේ. ඉස්සෙල්ලා දෙනවා මේක නුසුදුසුයි පාර හදන්න විතරයි දෙන්නේ කියලා. වන වගාවක් සඳහා කියලා බොහොම පැහැදිලිව දෙනවා වාර්තාවක්. ඊළඟට රොස්වුඩ් එකේ වතුර ටැංකිය පාරේ පැත්ත පළාතක ගිහිල්ලා නැහැ මධ්‍යම පරිසර අධිකාරියෙන්. මම ඒකයි කිවුවේ. ඒක ගැන කතාකරන්න ඕන. ඔබතුමන්ලා තාම ඒ ලිපි ගොනුව ගෙන්නගෙන නැහැ. ප්‍රගතියට ඒක දෙන්න ඕන. ඉතින් මම කියන්නේ මේකේ දරුණුම වරැද්ද කරන්නේ කවුරුවත් නෙමෙයි. එන්.බී.ආර්.ඕ එක, පතල් හා භූ විද්‍යා එක, නාගරික සංවර්ධන අධිකාරිය. දැන් අද වෙනකොට ඒ අය අත්සන් කරලා දුන්නට පස්සේ කරන්නේ. ඒ අය අත්සන් කරන්නේ නැත්නම්, එන්.බී.ආර්.ඕ එක වාර්තාව දෙන්නේ නැත්නම්, මධ්‍යම පරිසර අධිකාරිය අවසරය දෙන්නේ නැත්නම්, අපිට අවසරය දෙන්න විදියක් නැහැ. සභාපතිවරයාට දෙන්න විදියක් නැහැ. සභාපතිවරයාට දෙන්න බැහැ. මන්ත්‍රීවරුන්ට කොහොමවත් අයිතියක් නැහැ. නමුත් සභාපතිතුමා ඒ කමිටුවේ ඉඳන් අත්සන් කරන්න බැහැ ඒ කමිටුවේ නැත්නම්. ඒ නිසා ගෞරවයෙන් ඉල්ලනවා මේක මාධ්‍යයට දාන්න. මොකද අපේ සුගත් කලංසූරිය මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම වැදගත්. මොකද මේ අය මේ ටික හරියට කරනවා නම් මේ විනාශය වෙන්නේ නැහැ. එතකොට සභාපතිතුමාට අවසරය දෙන්න පුළුවන්කමක් නැහැ. මේ සභාවට දෙන්න පුළුවන්කමකුත් නැහැ. වැරැද්ද කරන්නේ පළමුවෙන්ම පතල් හා භූ විද්‍යා එක. මධ්‍යම පරිසර අධිකාරිය. මේ අය තමයි මේ වැරැද්ද කරන්නේ.

(ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, සුභ උදෑසනක් වේවා. සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මේ හොඳ කතාවක් උදේ පාන්දරම සභාපතිතුමා පටන්ගත්තේ. ඊයේ දවසේ බොහෙම කෙටි පැයක, දෙකක වැස්ස සම්බන්ධයෙන් ඇතිවෙච්ච තත්ත්වය. ඉස්සර දවස් දෙක තුන වැස්සත් ඔහොම දේවල් අපිට වුණේ නැහැ මන්ත්‍රීතුමා. දැන් වෙලා තියෙන්නේ ඔබතුමා සඳහන් කළ පරිදි පුළුවන් තරම් පහත් බිම් ගොඩ කරලා, ඉදිකිරීම් කරලා, සීමාවල් ඉක්මවා ගිහිල්ලා නීතිවිරෝධී විදියට ඉදිකිරීම් කරලා. ඒ අතර දැන් ගොඩක් කරුණු මෙතන කතා කරපු නිසා කතා කරන්න තිබුණත් මම ඊට එහා යන්නේ නැහැ. මෙතන කමිටුවක් පත් කරලා අපිව නම් කරා මේ සම්බන්ධව වාර්තා දෙන්න කියලා. අපි වාර්තා දුන්නට වැඩක් නැහැ අදාළ කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරයා මේක කරන්න බැහැයි කියනවා ඡන්ද ක්‍රමය නිසා හානියක් වෙනවා කියලා. දැන් හොඳම උදාහරණය තිස්ස මන්ත්‍රීවරයාගේ කොට්ඨාශයේ අර ගෙනාපු ප්‍රශ්නය. අපිට වඩා ප්‍රබල, අදාළ ආයතන නිර්දේශ දුන්නත් ඒ නීත්‍යානුකූල ආයතන දෙන නිර්දේශයක්වත් ක්‍රියාත්මක කරන්න බැහැ. මේක මගේ කොට්ඨාශයේ ප්‍රශ්නයක්, එක කොටසක් තරහා වෙනවා. තව කොටසක් මිතුරු වෙනවා. එහෙම කියලා මේකට බාධා කරනවා. මන්ත්‍රීවරු කමිටුවක් විදියට දෙන නිර්දේශ ඔබතුමා ඉල්ලුවට ඒක කරන්න බැහැ. එහෙම නම් අපි කමිටුව කියන්නේ නියෝජනය කරන අය. මන්ත්‍රීවරු ඔක්කොටම කමිටුව කියන්න බැහැ. අපි හැමෝම එක මතයක් වෙන්න ඕන. මමත් කැමති නැහැ මිනිස්සු තරහා කර ගන්න. හැබැයි කාටහරි හානියක්, අසාධාරණයක් වෙනවා නම්, අනතුරක් තියෙනවා නම්, මගේ ඉඩමේ වුණත් මම සතුටු වෙන්න ඕන ඒක වළක්වන එකට. ඒක මගේ යුතුකමක්. මන්ත්‍රීවරයෙක් විදියට මට ඒකට විරුද්ධ වෙන්න බැහැ. මගේ කොට්ඨාශයේ මේක කරන්න බැහැ. මැතිවරණය ඉවර වෙනකම් කල්දාන්න, එහෙම බැහැ. එහෙම යන්න බැහැ. එහෙම අපි ඒ කමිටුවල වාඩි වෙන්නේ නැහැ. ඔබතුමා කිවුවා මගේ ඥාති නෙමෙයි, අම්මා නෙමෙයි, කවුරු වුණත් කරනවා කියලා. ඒක තමයි වෙන්න ඕන. මගේ ඥාති නෙමෙයි, අම්මා නෙමෙයි, සහෝදරයාගේ වුණත් ඉඩමෙන් ඒක හානියක් වෙනවා නම් පහළ ජනතාවට ඒක සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට ගේන්න ඕන. මම ඉන්නේ ඔබතුමා එක්ක. එහෙම නම් ඒ මතයට එන්න ඕන සියලුම මන්ත්‍රීවරු. අපි එතකොට මේ මන්ත්‍රීවරු විරුද්ධ නැත්නම් දෙන්නේ නැහැ කාටවත් හානිකර තීන්දු. මම පෞද්ගලිකව නීතිය 100%ක් ගරු කරමින්, රකිමින් අකුරට කටයුතු කරන කෙනෙක් විදියට මම වාඩිවෙන්නේ නැහැ එහෙම කමිටුවල. එහෙම නම් සියලු මන්ත්‍රීවරු ඒකට කැමැත්ත දෙන්න ඕන. මම කිසිම කෙනෙකුට අබමල් රේණුවක පාඩුවක්, අසහනයක් වෙන තීන්දුවකට නම් කොයි කමිටුවේ හිටියත් සල්ලි වලටත් විකිණෙන්නේ නැතුව ඉන්නවා ඍජු තීන්දුවේ. මන්ත්‍රීවරුන්ගේ ගෞරවය රකිමින් තමයි මම කටයුතු කරන්නේ. එහෙම නම් ඒ කමිටුව රැස්වෙමු. රැස්වෙලා තීන්දු, තීරණ, නිර්දේශ එනකොට මම හරියටම හානිකර සිද්ධියක් වෙනවා නම් එතනදී හිටගනන්වා. ඒ තීන්දුව එක්ක තමයි මගේ නිර්දේශයන් ලැබෙන්නේ. එහෙම නැතුව කිසිම මන්ත්‍රීවරයෙකුට, කිසිම මනුස්සයෙකුට හානිවෙන තීන්දුවලට මම කැමති නැහැ. අවසර දෙන්නේ නැහැ. නිර්දේශ දෙන්නේ නැහැ. එහෙම නම් ඒ තීන්දුව ගන්න අපි ඒ කමිටුවේ වාඩිවෙන්නම්. එහෙම නැතුව බොරුවට නිකන් සුරංගනා කතාවලට රැවටෙන්න එපා. හැමදාම වෙන්නේ ඒක. ඊළඟ සභාපතිවරයාට පැයක් දෙකක්වත් ඔය පුටුවේ වාඩි වෙලා ඉන්න බැහැ. එදා සභාපතිවරු හරි තීන්දු ගත්තා නම් මෙහෙම වෙන්නේ නැහැ. බලන්න අද මාර්ග දිහා. මාර්ගයේ වාහනයක් අයින් කරන්න බැහැ. මාර්ගයේ අන්තිම ගැට්ටට තාප්ප හදලා. ඉතින් මෙවැනි හේතු නිසා තමයි පැයක් දෙකක් වැස්සම මේ තත්ත්වය ඇතිවෙන්නේ. දවස් දෙක තුනක් වැස්සම මීට වඩා උග්‍ර තත්ත්වයකට ඔබතුමන්ලාට මුහුණ දෙන්න වේවි. බලය තියෙන අයට තමයි දැඩි පීඩනය එන්නේ අපිට වඩා. ඒක නිසා ඔබතුමන්ලා දැන්මම ඉඳලා මේවාට නිසි ක්‍රියාමාර්ග ගන්න. ඉදිරියට පත්වෙලා එන සභාපතිවරුන්ට පැයක දෙකක කාලයක්වත් ඕකේ වාඩිවෙලා ඉන්න බැරි වෙනවා. ඒ වගේ විශාල පරිසර හානියක් එක්ක තමයි මේක සිද්ධ වෙන්නේ. එක පැයක වැස්සකට ඔහොම නම් දවසක් දෙකක් වැස්සොත් මීට වඩා උග්‍ර ප්‍රශ්නවලට මුහුණ දෙන්න වේවි. ඒක නිසා ඒ කටයුතුවලට මාගේ පූර්ණ සහාය ලබා දෙනවා. ඔබතුමා කියපු කතාවට මම ගෞරව කරනවා. මගේ ඥාති නැහැ. සහෝදරයෝ නැහැ. ඒක තමයි වෙන්න ඕන. එහෙම තමයි මෙතනට ආවාට පස්සේ වැඩ කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කමිටුව වැඩ ආරම්භ කරන්න කිසි ප්‍රශ්නයක් නැහැ. කමිටුවෙන් නිර්දේශ දෙන්න. ඒ අනුව මම ක්‍රියාත්මක කරන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමා මට චෝදනා නැහැ. මම තුන්වෙනි සභාවාරය මේ ඉන්නේ. කිසි ප්‍රශ්නයක් නැහැ. චෝදනා කරන්න. චෝදනා භාර ගන්නත් කැමතියි. මොනවා හරි වැරැද්දක් මෙතෙක් කල් කරලා තියෙනවා නම් කමිටුවල ඉඳලා හෝ එහෙම නැත්නම් සභාවේ ඉඳලා කියන්න. වැරදි කරලා ඇති. හැබැයි මූණට කිවුවොත් වැරැද්දක් කරලා කියලා, තියෙනවා නම් මම ඒක පිළිගන්නවා. අපි එහෙම තමයි. මේ සභාවේ ඉන්නවා නම් අපි එහෙම කරන්න ඕන. ඔබතුමා කියන කතාව අපි පිළිගන්නවා. ඒක හින්දා අපි ඒක හරියට කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වගේම මතුවෙච්ච කාරණයක් පිළිබඳව සඳහන් කරන්න ඕන. අර හෝළුවාගොඩ එක අපි සාකච්ඡා කරලා අවසන් අදියරේ තියෙන්නේ. රමේෂ් පතිරණ ඇමතිතුමා සමග අපි මන්ත්‍රී කණ්ඩායම හැටියට සාකච්ඡා කරා. හෝළුවාගොඩ අපි දිගින් දිගට මේ වෙනකම් බැලුවා කුඹුරු ටික අස්වද්දන්න ක්‍රමයක්. නමුත් ඊයේ වැස්සෙන් ඒකට ඉඩක් නැහැ පේන විදියට.

කොහොම වුණත් යටවෙනවා. ඊයේ සුළු වැස්සෙනුත් හෝළුවාගොඩ යටවුණා. අපි ගොවි සමිති කැඳෙව්වා. සාකච්ඡා කරා. මේ පසුගිය මාස දෙක තුන තුළ ගොවි සමිති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කීප පාරක් කැඳෙව්වා. නමුත් දැන් අපි තීන්දුවක් අරගෙන තියෙන්නේ වැව් දෙකක් ඉදිකරන්න හෝළුවාගොඩට. ඒ වැව් දෙක ආශ්‍රිතව ළමයින්ට සෙල්ලම් කරන්න පුළුවන් උද්‍යානයක්, ඒ වගේම පාගන බෝට්ටු ක්‍රමයක් හදන්න. ඒ වගේම සභාවට ආදායම හම්බවෙන ක්‍රමයක් හදන්න. ජල ක්‍රීඩා ඇතුළුව සභාවට ආදායමක් එන්න වගේම ජල ගැලුම් ගැටලුවටත් විසඳුමක් හදන්න ඕන. තාම ගාල්ලේ නැහැ එහෙම පවුල් පිටින් ගිහින් සතුටුවෙන්න පුළුවන් ස්ථානයක්. එහෙම සුන්දර ස්ථානයක් තමයි හෝළුවාගොඩ ප්‍රදේශයේ හදන්න බලාපොරොත්තුව. ඉතින් එකේදි අපි දැනට සාකච්ඡා කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ සභාවත් එක්ක සාකච්ඡා කරන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මූලික සාකච්ඡාවක් තිබ්බේ. අපි සභාව විදියට ඒක සාකච්ඡා කරලා ඒකට අවශ්‍ය ඒකට අවශ්‍ය තීන්දු තීරණ ගමු. මම දැනට කිවුවේ අදහසක් මට්ටමේ ඒක ක්‍රියාත්මක වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සභාව ආරම්භයේදීම මම හිතන්නේ න්‍යාය පත්‍රයට උඩින් අපි ප්‍රධාන මාතෘකාවක් මේ මොහොතේ සාකච්ඡා කරේ. මේ මොහොතේ අපිට බලපාලා තියෙන, ජනතාව පීඩාවට පත්කරන මේ ජල ගැලීම් ගැටලුව සම්බන්ධයෙන්. මම හිතන්නේ ඉතාමත් කාලෝචිතයි සහ අපි මේ කාරණය සම්බන්ධයෙන් මම හිතන්නේ ඉතිහාසයේ දිගින් දිගට මේ සභාව ඇතුළේ ඕන තරම් කතා කරලා, ඒවාට සම්බන්ධවෙලා, ඒවා සාකච්ඡා කරලා, ඒ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගන්න සාකච්ඡා කරලා, යෝජනා හදන්න කමිටුවක් පත් කරලා, ඒ කමිටුව හරහා ඒ සම්බන්ධව වඩා විධිමත් ක්‍රියාමාර්ග ගන්න සභාව ඇතුළේ තීන්දු තීරණ ගත්තට ඒ තීන්දු තීරණ ආපහු හමස් පෙට්ටියට වැටිලා අපි අදත් ඒ ප්‍රශ්නය තුළ දිගින් දිගට පීඩාවට පත්වෙලා තියෙනවා. මේ ප්‍රශ්නය හැමදාම හොඳ හොඳ මඩේ දාන වැඩක්. මේ සභාවේ මම කියන්නේ අපි ඉතිහාසය පුරාවට ගනිපු කාරණා සලකා බැලුවම හැමදාම එකම ප්‍රශ්නය දිගින් දිගට, නැවත නැවත කතාකරේ. මම ඒකයි කලින් කිවුවේ හොඳ හොඳ මඩේ දානවා කියලා. ඉතිහාසය පුරාවටම එහෙම කරපු දේවල් බොහෝ තියෙනවා. ඒ නිසා තමයි දැනුත් මේ ප්‍රශ්නය අපි මේ ආකාරයෙන් සාකච්ඡා කරලා කල් මරන්න සිද්ධ වෙලා තියෙන්නේ. ඒ නිසා මම ඉතාම පැහැදිලිව කතා කරන්න ඕන. ඔබතුමා හොඳින්ම දන්නවා කුණු ප්‍රශ්නය සම්බන්ධයෙන්. විශේෂයෙන්ම කැලි කසළ ප්‍රශ්නය සම්බන්ධයෙන්. ඊට පස්සේ ගංවතුර ප්‍රශ්නය සම්බන්ධයෙන්. පාරිසරික හානි සම්බන්ධ කටයුතුවලින් අපි දැඩිව පීඩාවට පත්වෙච්ච කාලවකවානු තිබුණා. ඒ වකවානු වලදී ප්‍රශ්නය එනකොට අනුගත කර ගන්නවා. ප්‍රශ්නය ගියාට පස්සේ අමුඩය ගැලවෙනවා දන්නෙත් නැහැ. මම කියන්නේ එවැනි සභාවක ක්‍රියාමාර්ග ගන්නවා නම් අපි අපේ කාර්යභාරය කොයිතරම් සාර්ථකව මේ සභාව ඇතුළේ ක්‍රියාත්මක කරලා තියෙනවාද කියන එක සම්බන්ධයෙන් සැලකිලිමත් වෙන්න ඕන. ප්‍රධාන කාරණය ඒක.

ගරු සභාපතිතුමනි, මම දැන් එනකොටත් ඔබතුමා දැන් මෙතන විශේෂයෙන් කතා කරපු හෝළුවාගොඩ වෙල්යායේ ප්‍රශ්නය දැක්කා. ඒක ඇත්තටම ඉහළ වතුර පාර එකතුවෙන කොට පහළට ගලා යන්න සහ හෝළුවාගොඩ ඇළෙන් ගිහිල්ලා ගඟට එකතුවෙන ජල පහර ක්‍රමවත්ව, විධිමත්ව ගලා නොයෑම හේතුවෙන් තමයි මේ ප්‍රශ්නය පැන නැගිලා තියෙන්නේ. ඒ නිසා අපි දිගින් දිගටම මේක සාකච්ඡා කළා. අපේ මේ ප්‍රධාන ප්‍රශ්නයක් වෙච්ච වැලි හාරන, ගඟවල් හාරන ප්‍රශ්නය නිසාම ගඟේ පොළව මට්ටම පහතට වැටිලා ගොඩබිම ජල මට්ටම පහතට ගිහිල්ලා, මුහුදු මට්ටම උස්වෙලා මුහුදු ජලය ගොඩට ගලාගෙන එන මට්ටමට පත්වෙලා බොහෝ ප්‍රදේශවල. අපිත් ඒ තත්ත්වයෙන් පීඩා විඳිමින් ඉන්නවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි විශ්වාස කරනවා මේවා ජාතික ප්‍රශ්න. හැබැයි සභාවේ බල ප්‍රදේශයේ ජනතාවට බලපාන ප්‍රශ්න. ඒ නිසා අපි මේක සාකච්ඡා කළ යුතුයි. ප්‍රශ්නය තියෙන්නේ ගිං ගඟේ වතුර බැහැලායාම සම්බන්ධයෙන් පරිපාලන ක්‍රියාමාර්ග ගන්න තියෙන්නේ සභාවට නෙමෙයි. හැබැයි ප්‍රශ්නයෙන් පීඩා විඳින්නේ සභා බල ප්‍රදේශයේ ජනතාව. ඒ නිසා මේක සාකච්ඡා කරන්න අපිට අයිතියක් තියෙනවා.

ඊළඟට අපි විශ්වාස කරනවා ඒවා සම්බන්ධයෙන් බල ප්‍රදේශයේ ජනතාවගේ එන ප්‍රශ්න, යෝජනා, අදහස් සැලකිල්ලට ගනිමින් සභාවේ මේ බල ප්‍රදේශයේ මේවාට මැදිහත්වෙන මන්ත්‍රීවරුන්ට විශේෂයෙන්ම බල ප්‍රදේශයේ ජනතාව එක්ක කතා කරාම එන අදහස් තියෙනවා. ඒවා මෙතනට ගෙනැල්ලා සාකච්ඡා කරලා අපි යම් යෝජනාවක් හදලා ඒක අපි අදාළ තැන්වලට යොමු කරලා ඒවාට විසඳුම් හොයන්න උත්සහ කරනවා නම් ඒක සාධාරණයි. එහෙමයි විය යුත්තේ. සභාවක කාර්යයභාරය සභා පරිපාලන ක්ෂේත්‍රයේ විතරක් අපිට ගන්න පුළුවන් ක්‍රියාමාර්ග තුළ පමණක් හිරවෙන්න අවශ්‍ය නැහැ. බල ප්‍රදේශයේ ජනතාවට බලපාන සියලු ගැටලු බලලා, ඒ ගැටලුවට වග කියන්න ජනතාව නියෝජනය කරමින් පත් කරලා එවපු සභිකයෝ වශයෙන් අපිට තියෙන වගකීම ගැන අපි අවබෝධයක් ගන්න ඕන මුලින්ම. ඒ නිසා මේ වෙලාවේ අපි සාකච්ඡා කළේ මේ කාරණය සම්බන්ධව. මේ වෙලාවේ මම එනකොටත් හෝළුවාගොඩ වෙල් යායේ එක පැත්තක වතුර පිරිලා පාරෙන් උඩට දාලා තියෙනවා. ක්ෂණිකව ඊයේ දවසේ පැය කිහිපයක් ඇතුළත වැහැපු වතුරෙන් එහෙම වුණේ. විශේෂයක් තියෙනවා. ගාල්ල දිස්ත්‍රික්කයට විශාල වර්ෂාපතනයක්

ඇද හැලුණා. මම හිතන්නේ කෑගල්ල දිස්ත්‍රික්කය ඇරුණම ඊළඟට වැඩිම වර්ෂාපතනය තිබුණේ අපිට තමයි. ඒ නිසා ඒකෙ තියෙනවා එතන විශේෂ තත්ත්වයක්. නමුත් ඒ විශේෂ තත්ත්වය අපි මීට කලිනුත් මුහුණ දීලා තියෙනවා. විශේෂයෙන්ම පහතරට තෙත් කලාපයේ දිස්ත්‍රික්කයක් හැටියට ගාල්ල දිස්ත්‍රික්කයට නිරන්තරයෙන් විශාල වර්ෂාපතනයක් ලැබෙනවා. ඒ නිසා අපි ඒක කල් ඇතුව දැනගෙන තියෙනවා. ඒ නිසා අපි කල් ඇතුව ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගන්න සූදානම් වෙන්න ඕන. අවිධිමත් ගොඩකිරීම්, ඉදිකිරීම් සහ ජලය අපවහන පද්ධති ගැන සැලකිලිමත් වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම හිතන්නේ ප්‍රමාණවත් ඔබතුමාට ලබාදීපු කාලය පිළිබඳව. මොකද එකම දේ නැවත නැවත කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එකම දේ නැවත නැවත කියන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැන් ඔබතුමා කරුණාකරලා තීරණය කරන්න. මම දැන් කතා කරන්න පටන් අරගෙන විනාඩි කිහිපයයි. ඔබතුමා මේක මෙතන පටන් ගනිපු වෙලාවේ ඉඳන් ඔය ප්‍රශ්නය තමයි සාකච්ඡා කරේ. ඔබතුමාට පොඩි ප්‍රශ්නයක් තියෙනවා අපි කතාකරනකොට කාලය සම්බන්ධව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා එකම දේ දෙතුන් පාර කතා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එකම නෙමෙයි මේ. ඔබතුමා සභා වාර්තාව අරගෙන බලන්න. සභා වාර්තාවේ තියෙනවා අපි කතා කරපුවා. අපි එකම දේ කිවුවා නම් අරන් බලන්න. ප්‍රශ්නය තියෙන්නේ ඔබතුමාට. අපි කතා කරන දේ තේරුම් ගන්න බැරි ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් ඉතින් ඔබතුමන්ලා කතා කරන දේ බොහෝමයක් කට්ටියන්ට තේරුම්ගන්න අමාරුයි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මටත් තේරුණේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තේරෙන්නනෙ නැහැලු මන්ත්‍රීවරුන්ට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක නොදැනුවත්කම පිළිබඳ ප්‍රශ්නයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ තේරිච්ච නැති එකේ ප්‍රතිඵලය අද ඔබතුමන්ලා විඳිනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ප්‍රශ්නයක් තේරුම් ගන්න බැරි නියෝජිතයින් මේ සභාවට පත්කරලා එවපු ජනතාව තමයි ඒකට කණගාටු වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජනතාව ඔයගොල්ලෝ කියපු දේ තේරුම් ගනිපු නිසා තමයි අද ජනතා විමුක්ති පෙරමුණ තිබුණ තත්ත්වයේ ඉඳන් පසුගිය මැතිවරණයේදී 3%ක් දක්වා අඩුවෙලා තියෙන්නේ. ඔබතුමන්ලා කියන එක අපිට කෙසේ වෙතත් ජනතාව තේරුම් ගන්න එපැයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** 3% න් 90%ක කාර්යයභාරයක් ඉටු කරලා තියෙනවා. ඒ හින්දා 3% ප්‍රශ්නයක් නෙමෙයි තියෙන්නේ. ඒ ආයතන ඇතුළේ, රට ඇතුළේ කරන කාර්යයභාරයට අපේ මැදිහත්වීම මොකක්ද කියන එකයි. ඒක සම්බන්ධයෙන් තමුන්නාන්සේට අවබෝධයක් නැත්නම් ඒක කණගාටුවට කාරණයක්. තමුන්නාන්සේ අවබෝධයෙන් ඉන්න. ඉවසීමෙන් ඉන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා වෙලාවක් කියන්න කරුණාකරලා ඕක ඉවර කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** වෙලාව මෙතන කාටවත් බෙදලා දීලා තියෙනවාද. ඔබතුමා එහෙම කරලා නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ කතාවේ ඉවරයක් නැහැනේ. කවුරුත් ඔය මට්ටමේ කතා කරන්නේ නැහැනේ. පැය භාගයක් විතර ගන්නවා එක දෙයක් කතා කරන්න. දැන් විනාඩි පහළොවක් විතර කතා කරා ඔබතුමා. ඔබතුමා දන්නේ නැහැ කතා කරපු වෙලාව කොච්චරද කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා බාධා කරනවා විනාඩි පහකට වඩා. විනාඩි පහක් කතා කරොත් විනාඩි හතරක් විතර බාධා කරනවා. ඔබතුමාගේ ඔය නරක පුරුද්ද නවත්වගන්න ඉස්සෙල්ලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඔබතුමා ඉවර කරන්නකෝ කරුණාකරලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඔබතුමාට ඉවසීමෙන් ඉන්න බැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා යෝජනාවක් දැම්මත් දාන්නේ ජාතික ප්‍රශ්නයක්. මේකෙ දාන්නේ පැය ගණන් කතා කරන්න පුළුවන් යෝජනාවක් දැම්මත්. කතා කරන්න ගියාමත් එහෙමයි. මේකෙ අනිත් මන්ත්‍රීවරුන්ට කතා කරන්න අවස්ථාව දීලා මේක යන්න දෙන්නකෝ. තාම න්‍යාය පත්‍රයට එන්න බැරිවුණා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** අනිත් මන්ත්‍රීවරු කතා කරාට පස්සේ තමයි මම කතා කරන්න අවස්ථාව ගත්තේ. මෙතන පැනලා ඇවිල්ලා ඩෙගා නටලා ගත්තේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** යසරත්න මන්ත්‍රීතුමා තුන්පාරක් නැගිට්ටා කතාකරන්න. එතුමාට කතා කරන්න බැරි වුණා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** යසරත්න මන්ත්‍රීතුමා තුන්පාරක් නැගිට්ටේ මම කතාකරන කොටද. එතුමාටත් අවස්ථාව ලබා දෙන්න. මෙතන කතා කරන්න අවස්ථාව කාටවත් නොදී හිටියේ නැහැනේ. ඒ නිසා ඉවසගෙන අහගෙන ඉන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ඔබතුමා මන්ත්‍රීවරුන්ට චෝදනා මුඛයෙන් කතා කරාම ඒක හොඳ නැහැ. ඔබතුමා හෙළා දකිනවා මන්ත්‍රීවරුන්ව පත්කරලා එවන එක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** මන්ත්‍රීවරුන්ට චෝදනා කරේ නැහැ. හෙළා දැක්කේ නැහැ. ඒක කිවුවේ මෙතුමා කියපු නිසා. ප්‍රශ්නය තේරුම් ගන්න බැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මෙහෙමයි ඉන්දික මන්ත්‍රීතුමා. කෙටියෙන් මෙච්චරයි. මන්ත්‍රීතුමා ඕකට දෙන්න තියෙන උත්තරය. මේක බෝපෙ පෝද්දලට සීමා වෙච්ච ප්‍රශ්නයක් නෙමෙයි. පළාත් නවයම ඔය වගේ යටවෙනවා. මේක කලින් ප්‍රවිශ්ටයක් ගත්තේ මම. මේක සභාවක් විදියට කරන්න පුළුවන් දෙයක් නෙමෙයි මන්ත්‍රීතුමා. අපි හැමදේම බදාගන්නේ නැතුව සභාවෙන් කරන්න පුළුවන් දේ කරන්න ඕන. මොකක්ද අනවසර ඉදිකිරීම් තියෙන්නේ. කොහෙද තියෙන්නේ. එතනින් වෙන හානිය මොකක්ද, අපි ඒකට කටයුතු කරමු. අපි මේ ජාතික ප්‍රශ්න කතා කරන්න යන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** අපේ බල ප්‍රදේශයේ ජනතාවට බලපාන ගැටලු සම්බන්ධයෙන් තමයි මේ කතා කරේ. දැන් මෙතන කතා කරෙත් ඒක. වචන දෙකක් කතා කරනකොට ඉවසගෙන ඉන්න බැරි වෙනවා නම් සභාපතිවරයා හැටියට හා මූලාසනය හැටියට. මූලාසනයේ කාර්යයභාරය ඔබතුමා තේරුම්ගන්න. අනිත් මන්ත්‍රීවරුන්ගේ අදහස් අරගෙන සාකච්ඡා කරලා ඉවර වෙලා ඒකට අවස්ථාව දීලා වැඩ කටයුතු කරන්න. ඔබතුමා හැමදාම මොකක් හරි එකක් කතා කරන්න ගත්තොත් කඩාකප්පල් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** විනාඩි පහළොවක් විතර කතා කරානේ. මම කතාව කෙටි කරන්න කියලා කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** මම අභියෝග කරනවා. දැන් ටේප් එක තියෙනවා. රෙකෝඩරය තියෙනවා. ගණන් කරලා බලන්න. විනාඩි ගණන ගණනය කරලා බලන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** පක්ෂයේ කාර්යයභාරය පිළිකුලට පත්වෙනවා. කඩාකප්පල් වැඩ කරන්න එපා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** මේ චෝදනා කරන්නේ බොරු චෝදනානේ. මෙහෙමයි දැන් තාක්ෂණය පාවිච්චි කරන්න. රෙකෝඩරය තියෙනවානේ. ඔබතුමා බාධාකිරීම කරන්න කලින් ඉඳලා මම කතා කරපු වෙලාවයි, අනිත් මන්ත්‍රීවරු කතා කරපු වෙලාවයි ගණනය කරලා ඔබතුමා කාලය කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මෙහෙමයි. මම මේක කියන්නම් ඔබතුමාට. ඔබතුමා එකම දේ දෙතුන් පාරක් කිවුවා කියලා මම ටේප් එක දාලා පෙන්වන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** පෙන්වන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා දැන් එකම දේ දෙතුන් පාරක් කිවුවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** එකම දේ දෙතුන් පාරක් කිවුවේ නැහැ. කියපු දේ මේ සභා වාර්තාවට එනවනේ. සභා වාර්තාවට අපි කතාකරන දේවල් දානවනේ. එකම දේ කිවුවා නම් මේ සභා වාර්තාවේ තියේවී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** සභා වාර්තාවට දාන්න බැහැනේ එකම දේ තිබ්බොත්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** බාධා කිරීම් කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මෙහමනේ, ඔය ප්‍රශ්නය අපි කතා කරා ඔබතුමා එන්න කලිනුත්. ඔබතුමා මැදින් ඇවිල්ලා ඉවරවෙලා අපි කතා කරපු ටික නැවත කතා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කතා කරේ මගේ අදහස.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. කරුණාකරලා ඔබතුමා කතා කරලා ඉවර කරන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා බාධා කරනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. බාධා නොකර ඉන්නම්. එකපාර ඔබතුමාගේ තියෙන සියලු ප්‍රශ්න ටික කතා කරලා ඉවර කරන්නකෝ ආයේමත් පැන පැන කතා කරන්නේ නැතුව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** හරි. අවස්ථාව දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. ඔබතුමාට ඕන වෙලාවක් දෙන්නම්. තියෙන ඒවා ඔක්කොම කතා කරන්නකෝ. ආයේමත් මැදින් පැන පැන කතා කරන්න එපා. ඔබතුමා වෙලාව ගන්න ඕන තරම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මැදින් පනින්නේ ඔබතුමා. මම නෙමෙයි. මම මැදින් පැනලා නැහැ. මගේ අවස්ථාවේදී මම කතා කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රගතියේදී කතා කරන ඒවත් එක්ක ඔක්කොටම කාලය ගන්නකෝ දැන්. ඔක්කොම අරගෙන ඔබතුමා කතා කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා මූලාසනය හැටියට සංයමයෙන් ඇහුම්කන් දෙන්න. අපි මේ කතා කරන්නේ අපේ ගෙදර ප්‍රශ්න නෙමෙයි මෙතන ඇවිල්ලා. පෞද්ගලික ප්‍රශ්න කතා කරන්නේ නැහැනේ. ඒ නිසා කරුණාකරලා ඉවසීමෙන් කටයුතු කරන්න.

ඊළඟට මම දැන් කතා කරමින් හිටියේ මම එනකොට මම අත්දැකපු කාරණය. හෝඑවාගොඩ වෙල්යායේ වෙනම ව්‍යාපෘතියක් යනවා. ඒ යන ව්‍යාපෘතිය ගැන මම හිතන්නේ ඔබතුමත් කතා කරා එහෙම අදහසක් සම්බන්ධව. හැබැයි මම කියන්නේ එම ව්‍යාපෘතිය දැන් ආරම්භ කරලා තිබුණට ඒ ව්‍යාපෘතියට අදාළ කරුණු කාරණා සම්බන්ධයෙන් මේ සභාව දැනුවත් කරලාවත් නැහැ. ඒ ප්‍රශ්න අතරට තව ප්‍රශ්නයක් ආවත් ඒකට මුහුණ දෙන්නේ සභා බල ප්‍රදේශයේ ජනතාව. ජනතාවගේ ගැටලු ආපහු එන්නේ ආසන්නම මහජන නියෝජිතවරු විදියට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වෙත. එතකොට ඒ මන්ත්‍රීවරුන්ට තමයි ඒකට මුහුණ දෙන්න වෙන්නේ. එතකොට මේ ව්‍යාපෘතිය සම්බන්ධව පාරිසරික ඇගයීම් වාර්තාවක් කරලා තියෙනවද. එතකොට මේකෙ තියෙන ජල ධාරිතාවය කොයි තරම්ද. එතකොට ඒක ආපහු අඩුකර ගන්න ක්‍රමවේද මොනවද. ඒවා සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කරලා ඒවා සභාගත කරන්න. ඔබතුමාලට අදහසක් විතරයි තියෙන්නේ. නමුත් වැඩේ පටන් අරගෙන. එතකොට අවසානයේ මේ තාවකාලික ක්‍රියාමාර්ගවලින් පීඩාවට පත්වන්නේ මේ බල ප්‍රදේශයේ ජනතාව. ඒ නිසා තමයි අපි කියන්නේ මේවා මීට වැඩිය සැලකිල්ලෙන් කරන්න ඕන.

දැන් යෝජනා කරාට කුඹුරු අස්වද්දන්න බැහැ. ඒ කාරණය කාලයක් තිස්සේ කිවුවා. අස්වද්දන්න බැරි හේතු ගණනාවක් තියෙනවා. ඒ නිසා කුඹුරු අස්වද්දන්න බැරිකමට කළවිටි කරන්න අදහසක් යෝජනා වුණා. ඒක මම කතා කරා ගොවිජන සේවා එකේ නිලධාරීන් එක්ක. ඒ අය කිවුවා මේක ගරු ඇමතිතුමාගේ අදහසක්. ඒ නිසා කළවිටි කරවනවා කිවුවා. ප්‍රශ්නය තියෙන්නේ මෙන්න මේ වගේ අවස්ථාවක කළවිටි ඔක්කොම යටවෙලා ගියාට පස්සේ අර ජලයෙන් පෙඟිලා මඩ ටික ඔක්කොම දියාරු වෙනවා. කළවිටි කරාට කමක් නැහැ කුඹුරු කරන්න බැරි නම්. කුඹුරු අස්වද්දන්න බැරි නම් ලවණ ජලය හෝ වෙන ප්‍රශ්නයක් නිසා අස්වද්දන්න බැරි එකට විකල්ප ක්‍රියා මාර්ගයකට යන්න ඕන. එකේ දෙකක් නැහැ. විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කරාට ගැටලුවක් නැහැ. ප්‍රශ්නය තියෙන්නේ එකේ අතුරු ප්‍රතිඵල. අතුරු ප්‍රතිඵල සම්බන්ධයෙන් කවුද වග කියන්නේ. මම කියන්නේ ඒකයි. ව්‍යාපෘතිය සම්බන්ධව පාරිසරික ඇගයීම් වාර්තාවක් නැහැ, ව්‍යාපෘති වාර්තාවක් නැහැ. කිසිම දෙයක් සභාවට ඇවිල්ලත් නැහැ. වෙනත් ආයතන දන්නෙත් නැහැ. දැන් තාවකාලිකව හිතුමනාපෙට ඡන්දයක් හරි මොකක්හරි ඉලක්ක කරගෙන මේ කරන වැඩවලින් අතුරු ප්‍රතිඵල එනවා. පසුව ගොඩ නැගෙන අතුරු ප්‍රතිඵල වලට ජනතාව මුහුණ දෙනකොට ඒ ජනතාවගේ පැත්තෙන් ඔබතුමාලා ගන්න ක්‍රියාමාර්ග මොනවද තියෙන්නේ. සභාවක් හැටියට, මේ බල ප්‍රදේශයේ ආයතනයක් හැටියට අපි තමයි වැඩිම පීඩාවට පත්වෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේවා සම්බන්ධයෙන් ඒ කරුණු කාරණා සභාගත කරලා ක්‍රියාවට නගන්න.

ඔබතුමන්ලා මැදිහත් වෙන්න මේවාට. සභාවේ මන්ත්‍රීවරු හැටියට අපිට මැදිහත්වෙන්න පුළුවන් සීමාවක් තියෙනවා. ආයතනයේ ප්‍රධානියා ඔබතුමා. මේ ආයතනය මෙහෙයවන පුද්ගලයා ඔබතුමා. නෛතික බලය තියෙන්නේ ඔබතුමා සතුව. ඔබතුමා අපේ යෝජනා කප්පාදු කරන්න විතරක් මේ නෛතික බලය පාවිච්චි කරාට වැඩක් නැහැ. සභාවේ මන්ත්‍රීවරයෙක්ගේ මොකක් හරි යෝජනාවක්නේ. මේකත් දැන් ජාතික තලයේ ප්‍රශ්නයක්නේ. අපි කතා කරන්නේ ඇයි එහෙම නම්. අපේ බල ප්‍රදේශයේ ජනතාවට ප්‍රායෝගිකව බලපාන නිසා. ඒ නිසා කරුණාකරලා ගරු සභාපතිතුමනි යෝජනා කප්පාදු කරන්න විතරක් ඔබතුමාගේ බලය පාවිච්චි කරනවා නම් ඒක වැරදියි. අපි යෝජනා කරලා තිබුණේ ඒ අදහසින් තමයි. බල ප්‍රදේශයේ ජනතාවට බලපානවා. එවැනි යෝජනා මේ. කරුණාකරලා මින් ඉදිරියට එහෙම කරන්න එපා. මම මේ විරෝධතාවය ප්‍රකාශ කරේ. දැඩි විරෝධතාවය යොමු කරනවා. ඔබතුමා මන්ත්‍රීවරුන්ගේ යෝජනා කප්පාදු කරනවා අනවශ්‍ය විදියට. ඒ නිසා ගරු සභාපතිතුමනි, මින් ඉදිරියට මෙවැනි කටයුතුවලින් වළකින්න. අපිට අවස්ථාවක් දෙන්න. අපි යෝජනා කරන්නේ රටට වෙන්න පුළුවන්. ඒක ඇත්ත. ඒ යෝජනාව සාකච්ඡා කරාට පස්සේ වෙන විදියකින් හෝ මාධ්‍යවලින් හෝ අපි යවලා හෝ යාවී. ඔබතුමා මම කරපු යෝජනා තුනක් කප්පාදු කරලා තියෙනවා. ඒ යෝජනා තුළ තියෙන්නේ ජාතික තලයේ ප්‍රශ්න තමයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දහපාරක් හරි අරගෙන සභා වාර්තා අරගෙන බලන්න. මේ කරන එක වැරදියි. අපි කතා කරනකොට එකපාරයිනේ ඉල්ලන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා මම මගේ ප්‍රශ්නය සම්බන්ධව කතා කරන්නේ. මෙතුමා න්‍යාය පත්‍රය හදනකොට ගලවපු යෝජනා මේ. ඉතින් මේක ගැන මෙතන සාකච්ඡා කරන්නේ නැතුව කඩපිල්, හන්දි ගානේ ගිහින් කතාකරලා වැඩක් නැහැනේ. කතා කරන්න ඕන ආයතනය ඇතුළේ. ඒ නිසා බාධා කිරීම් කරන්න එපා. මම කියන්නේ කුහකකමට හෝ මොනයම් දේවල් වලට හෝ බාධා කිරීම් කරන්න සූදානම් වෙන්න එපා.

ගරු සභාපතිතුමනි, ඔබතුමාට මම මේ දීපු යෝජනා තුනෙන් එකක් අධ්‍යාපනය සම්බන්ධව. අනෙක් එක ජීවන වියදම සම්බන්ධව. අනෙක් එක තමයි ව්‍යවසායකයන් සම්බන්ධ ප්‍රශ්නය. ඔබතුමාට මේවා සාකච්ඡා කරන්න සභාවේ ඉඩ දෙන්න බැරි නම් මම හිතන්නේ මේ පනතෙන් බලය පවරලා තියෙන්නේ මෙවැනි දේවල් කතා නොකරන්න නම්, කටවල් වහන්න නම් පනත සම්බන්ධයෙන් ප්‍රශ්නයකුත් තියෙනවා. ඒ නිසා කරුණාකරලා එහෙම කරන්න එපා. ගරු සභාපතිතුමා, මම ඉතාම දැඩිව විරෝධතාවය ප්‍රකාශ කරනවා ඔබතුමාට. මේ මන්ත්‍රීවරුන්ගේ යෝජනා සාකච්ඡා නොකර මෙහෙම කුණු කූඩයට දාන්න ගියාට පස්සේ වෙන්නේ ඔබතුමාගේ අවශ්‍යතාවය හා අභිමතය පිරිදි සිද්ධවෙන කාරණාවක් බවට පත්වෙනවා. කරුණාකරලා මින් ඉදිරියට එවැනි මැදිහත්වීම් නොකරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනා පහෙන් තුනක් මම අයින් කරා. අයින් කරලා අදාළ ආයතන වලට යවලා තියෙනවා. ඔබතුමාටත් එකේ පිටපත් එවලා ඇති. ඔබතුමාට ඕන ඒකනේ. ක්‍රියාත්මක වෙන්න කියලා ඔබතුමාට පිටපත් සහිතව යවලා තියෙනවා. ඒ ජාතික මට්ටමේ යෝජනා. සභාවේ මට්ටමින් කතා කරන්න පුළුවන් යෝජනා දෙක න්‍යාය පත්‍රයට අරගෙන තියෙනවා. ඉස්සරහටත් කරන්නේ ඒක. ඒක මම මේ වෙලාවේ කරන්න ඕන. නැත්නම් ඔබතුමාට ඒ යෝජනා තුනත් කතා කරන්න දුන්නා නම් සවස පහ විතර වෙනකම් සභාව යනවා. ඔබතුමා ඒ යෝජනා තුන ගැන පැය ගාණක් කතා කරනවා. ඔය පේන්නේ නැද්ද දැනුත්. ඉවරයක් නැහැනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ සභාව මට්ටමින් බලපාන යෝජනා තමයි. සභාව මට්ටමින් කතා කරන්න බැරි යෝජනා නෙමෙයිනේ මේවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා මම ලියුමක් එවුවම ඒක යොමු කරන එක නෙමෙයි කරන්න ඕන. එහෙම නම් මටම යවන්න පුළුවන් ලියුම අදාළ ආයතන වලට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා යවනවාට වඩා වටිනාකමක් තියෙනවා. සභාවේ කරත් යවන්නේ සභාවෙන්නේ. ඔබතුමා දැන් මේක කතා කරත් යවන්නේ සභාවෙන්නේ. ඉතින් ඒක හින්දා සභාවෙන් යවලා තියෙනවා. ඕන නම් අනිත් මන්ත්‍රීවරුන්ටත් එකේ පිටපතක් දෙන්නම්. ඔබතුමා කියපු එක යවලා තියෙනවා. ඒක මට තියෙන බලයක්. මට මේක හැල්ලුවට පත් කරන්න බැහැ අනිත් ආයතනවලට. මොකද අපේ ආණ්ඩුවක් නොතිබුණ කාලයේ ඔය එවන ඕන එකක් මට යවන්න පුළුවන්. ඒකත් කියන්න ඕන. නමුත් දැන් අපේ ආණ්ඩුවකුත් තියෙන වෙලාවේ අපිට බේරන්න පුළුවන් ප්‍රශ්න ටික බේරන්න ඕන. ඔබතුමාට යවන්න ඕන ඒවා අපි යවනවා සභාව හරහා. සභාව හරහා යවනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මන්ත්‍රීවරයෙක් දෙන ලියුම යොමු කරන්න නෙමෙයිනේ ඔබතුමා ඉන්නේ. ඒක නෙමෙයිනේ මෙතන අවශ්‍යතාවය. ඔබතුමා සභාපතිවරයා විදියට සභාව ඇතුළේ කරුණු කාරණා කතා කරන්න අවස්ථාව දීලා යවන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට මම දිගින් දිගට කිව්වා. ගිය සභාවේදීත් කිව්වා. සභාවේ කාර්යයභාරය තුළ තියෙන ඒවා විතරයි සභාවේදී කතා කරන්න පුළුවන්. මම දිගින් දිගට ඒක කිව්වා. ඒකම තමයි මට දැන් තියෙන උත්තරය. ඔබතුමාට ඕන තව කාලය ගිහිල්ලා තව ඇද ඇද සභාව යන්න. ඔය දීපු උත්තරය තමයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඇද ඇද යන්න ඕන නැහැ. ඔබතුමාගේ ක්‍රියාමාර්ග නිසා තමයි මේක ඇදෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට ගම්වල කතා කරන්න දේවල් නැද්ද දන්නේ නැහැ. මෙතුමට ගම්වල ප්‍රශ්න නැහැ මට පේන්නේ. කියන්නෙත් නැහැ. වැඩක් නැහැනේ කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තව අමතර යෝජනා තියෙනවානේ අපිට දාන්න. අපෙත් යෝජනා තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව දැම්මනේ. දාලා තියෙනවානේ ඒ යෝජනා. මෙතුමගේ මොනවද යෝජනා තුන තිබුණේ බලමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** බලන්න එතකොට පෙනේවි මොනවද තිබුණේ කියලා. ඒ ගම්වල ප්‍රශ්න, මිනිස්සුන්ගේ ප්‍රශ්න තමයි ඉදිරිපත් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාට යවන ලියුම ඉසුරුපායට දැම්මා. මෙතුමා ඉල්ලපු ඒවාට දාලා තියෙනවා. මෙතුමා ඉල්ලලා තියෙනවා " වසංගත තත්ත්වය හමුවේ අඩාලව ඇති දරුවන්ගේ පාසල් අධ්‍යාපනය නැවත ගොඩනගා පවත්වාගෙන යාමට සුදුසු ක්‍රමවේදයක් විද්‍යුත් නාලිකා සහ අන්තර්ජාලය භාවිතයෙන් සකස්කර ගැනීම සඳහා අවශ්‍යවන ඉක්මන් ක්‍රියාමාර්ග ගෙන අවදානම් සහිත පාසල් විවෘත කිරීමට විකල්ප වැඩ පිළිවෙලක් ක්‍රියාවට නැංවීමට යෝජනා කරමි"

ඉතින් ඒක අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාට මගේ අත්සනින් යුතුව යවලා තියෙනවා සභාවේ ලිපි ශීර්ෂය යටතේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාවට තමයි මන්ත්‍රීතුමා ඉස්කෝල ඇරලා නැවත වහන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉස්කෝල අරින්න කියලා නැහැ. තමන්ගේ දැනුමේ හෝ අවබෝධයේ දිග පළල අනුව කතා කරන්න ඕන මන්ත්‍රීතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කරුණාකරලා මන්ත්‍රීතුමා මේක අපිට කරගෙන යන්න දෙනවද නැද්ද කියලා කියන්නකෝ ඉස්සරවෙලා මට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක විතරක් නෙමෙයි. ජල ගැලීමේ ප්‍රශ්නයට පහුගිය සභාවාර දෙක තුනක යෝජනා කරලා ගත්තා අර කලේගානේ ලක්ෂ්මන් මහත්තයාලගේ ප්‍රශ්නය. ඒක දැන් මෙතනත් කතා කරා. ඔබතුමා මට කිව්වේ ඒ යෝජනාව මම ගෙනාවම ඒක අවුරුදු දහයක් විතර වෙන ප්‍රශ්නයක් කියලා. ඒක මම යෝජනාවක් හැටියට ගෙනාවා. ඒක මාසයක් ඇතුළත විසඳනවා කිව්වා. දැන් ඒ යෝජනාව කරලා තුන්වෙනි මාසය යන්නේ. ලක්ෂමන් මහත්තයාලාගේ ගෙදර වතුරෙන් යටවෙන ප්‍රශ්නය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට දැන් ඕන ඒක විසඳන්නද, නොවිසඳන්නද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** විසඳන්න තමයි කිව්වේ. විසඳන්න කියන්නේ. ඒ මනුස්සයාගේ ගෙදර යටවෙනවා උයාගෙන කන්නත් බැරිවෙන තරමට. ඒ ප්‍රශ්නය තියෙද්දී ඔබතුමන්ලා මේක දිග්ගස්සවන එකයි ප්‍රශ්නය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔබතුමාට ඕන වැඩේ නොකරන්නද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නොකරන්න නෙමෙයි. කරන්නයි ඕන. දැන් නිර්දේශය ඇවිල්ලා තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතුමට ඕන නොකරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අවුරුදු නවයක් ආපු ප්‍රශ්නය මම දැන් විසඳන්න ඕනද, නැද්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** විසඳන්න ඕන. ඒකනේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට ඕන මේක නොකරන්නද

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නෑ. ඔබතුමාට බලය තියෙනවා. නිර්දේශත් ඇවිල්ලා තියෙනවා. සියල්ල තියෙද්දී ඒ මනුස්සයා කතාකරලා කියනවා වැස්සත් එක්ක ඉන්න බැහැ කියලා. යටවෙලා ඉන්නේ එතුමා. ඒක කරුණාකරලා ඉක්මන් කරන්න කියනවා.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** ලක්ෂ්මන් මහත්තයාව හම්බවෙලා බලන්න මොකක්ද වෙලා තියෙන්නේ කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එයා තමයි කිවුවේ.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** අපි ගිහින් නිරීක්ෂණයක් කරා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමන්ලා ගිහින් තිබුණා. ගිහින් තිබුණට ඒ ප්‍රශ්නය තියෙනවා. ඊයේ වැස්සටත් ඒ මනුස්සයා යටවෙලා. ඒ මනුස්සයා කියනවා මට මෙතන ජීවත් වෙන්න බැරි තරමට ප්‍රශ්න කියලා. ප්‍රශ්නය විසඳිලා නැහැනේ මාස තුනක් ගිහිල්ලත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔබතුමා එතන බලන්න ගියාද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම යෝජනාව දැම්මේ ගිහිල්ලා බලලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුද යෝජනාව දැම්මේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** න්‍යාය පත්‍රය බලන්න ඔබතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගිය සභාවට යෝජනාව දැම්මේ ඔබතුමාද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඊට ඉස්සෙල්ලා මම යෝජනා කරේ. ආපහු දැම්මනේ මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මේක මන්ත්‍රීතුමා අවුරුදු නවයක් තිස්සේ ඉඳන් එන ප්‍රශ්නයක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම යෝජනා කරද්දි කිවුවෙනේ මේක සෑහෙන කාලයක ඉඳන් එන ප්‍රශ්නයක්. මේක විසඳුනේ නැහැනේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කතා කරන්නේ මේක විසඳන්න ඕන නැති විදියට. මටත් එහෙම හිතෙනවා සමහර වෙලාවට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක අමාරුවෙන් විසඳන්න ඕන ප්‍රශ්නයක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යසරත්න මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලා ඇතුළු සියලුදෙනාගෙන්ම අවසරයි. ඊයේ ජල ගැල්ම හේතුවෙන් දැනට උළුවිටිකේ, කීනදූව වත්ත, පැල්පොල වත්ත, හෝළුවාගොඩ සම්පූර්ණයෙන්ම යටවෙලා තියෙනවා. ඒ පැති යටවෙන්න ප්‍රධාන හේතුව වෙලා තියෙන්නේ මෙහේ වැස්සට වැඩිය හියාරේ පැත්තෙන් එන වතුර පාර නිසා. දැනටත් වැඩි වෙනවා වතුර. ඒකයි හේතුව. දැන් ඔබතුමා කිවුවා වගේ හෝළුවාගොඩ ජලයෙන් යටවීම වළක්වන්න ගිය රජයෙන් සැලසුම් සකස්කරලා තිබුණා. ඒ සැලසුම් ක්‍රියාත්මක කරන්න යද්දී ආණ්ඩුව මාරුවුණා. ඒවා අද ඊයේ නෙමෙයි. මීට අවුරුද්දකට කලින් ඉඳලම ඒ සැලසුම් හදලා දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටුවලටත් කතා කරලා තිබුණේ. ඒ ජල ගැල්ම සම්බන්ධ ගැටලුව එක්කම කතා කරන්න ගියේ ඉලේපෙරුම මාවතේ කාණුවක් දාන්න ගිහිල්ලා ප්‍රශ්නයක් තියෙනවා. තරංගා මහත්මිය ලියුමක් ඉදිරිපත් කරලා තියෙනවා. ගලියකින් එන වතුර ප්‍රශ්නයක් තියෙන්නේ. පාර කොන්ක්‍රීට් කරද්දී මම ඒ බටේ ගලවලා අයින් කරා. දැනට කාණුවක් දාලා ඒක කාණුව දිගේ යවන්න හදනවා කියලා ලියුමක් ඉදිරිපත් කරලා තියෙනවා. රමේෂ් ඇමතිතුමාට පවා පිටපත් යවලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒ ගැන පොඩ්ඩක් බලලා පරීක්ෂණයක් කරලා මොකක්ද කරන්න ඕන කියලා බලන්න. ගලියක අපද්‍රව්‍යවල දුර්ගන්ධය එනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ස්ථානය මැනගෙන ඇවිල්ලා තියෙනවා කාණුවකට ඇස්තමේන්තුව හදන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** කාණුවක් දාන්න බැහැ ඒකේ. කාණුවකින් ගිහිල්ලා යන්නේ ගලියක වතුර.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රධාන පාරට එන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ප්‍රධාන පාරට ආවම වෙලටනේ දාන්නේ ඒ වතුර ඊළඟට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගෙන් වාර්තාවක් ගන්නවා ගලිවල වතුර එන්නේ නැහැ කියලා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඒ වෙල් යායේ එම මනුස්සයා නෙළුම් හිටවලා ලස්සනට වගා කරලා තියෙනවා. කාණුවක් තියෙනවා. පාර කොන්ක්‍රීට් කරන වෙලාවේ මම ඒ බටේ ගලවලා දාලා තමයි පාර කොන්ක්‍රීට් කරේ. ඊට පස්සේ තමයි මේක කරන්න හදන්නේ. ඒ ගැන පරීක්ෂණයක් කරලා සුදුසු පරිදි කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

(ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මටත් ඊයේ ඇද හැලුණු වර්ෂාව පිළිබඳව කතා කරන්න ඕන. වලවත්ත ප්‍රදේශය සම්පූර්ණයෙන්ම යටවෙලා තියෙනවා මේ වෙනකොට. එතකොට යම් සැලකිය යුතු වතුර ප්‍රමාණයක් තියෙනවා. හැබැයි මේකට අපි ස්වාභාවධර්මයට විතරක් වගකීම පවරන්න ඕන කාරණයක් නෙමෙයි. මොකද වලවත්ත ප්‍රධාන මාර්ගයේ තිබෙන ඇළ මාර්ගයට දැන් වෙලා තියෙන්නේ උඩහ ඉන්න පිරිස අයිනෙන් බැම් බැඳලා තියෙනවා. ගල්වැටි බැඳලා. ඊයේ පෙරේදත් අලුතෙන් බැම්මක් බැඳලා තියෙනවා. ඉතින් ඒ අනුව ඇළ මාර්ගයේ පළල අඩුවෙලා තියෙනවා. ඉතින් ඒ මහා ජලපහර ගලාගෙන යන්න විදියක් නැහැ. අනිත් එක තමයි අධිවේගී මාර්ගයේ සංවර්ධන කටයුතු වලදී ඇළ හරහා දැලක් දාලා තියෙනවා. ගරු සභාපතිතුමනි, ඒ දැලේ කොටුවල කොළ රොඩු ඔක්කොම එකතුවෙලා බැඳිලා එතනින් සම්පූර්ණයෙන්ම අවහිර වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** අපි ගිය සැරෙත් බලන්න ගියා. කිසිම විසඳුමක් ලැබුණේ නැහැ. වලවත්තේ සේරසිංහ කඩේ ගාව. අර බෝක්කුව කඩාගෙන ගිහින් තිබුණේ ගියපාර. එතන ඒ දැලේ ඔක්කොම කුණු ඇවිල්ලා බැඳිලා. ඒ දැල සුද්ධ කරලා වැඩක් නැහැ. ඒ දැල අයින් කරන්න ඕන එතනින්. නැත්නම් හැමදාම වෙන්නේ දැලේ කුණු ටික රැඳිලා එතනින් අවහිර වෙලා පාරට වතුර ටික එනවා.

මම ඊට අමතරව සභාවේ කලින් ජල ගැලීමත් එක්ක යෝජනාවක් දැම්මා ගරු සභාපතිතුමනි, පායන කාලයේදී බැකෝ යන්ත්‍රවලින් කුඹුරුවලට ගිහින් කාණු කපන්න කියලා පාර හරහා තියෙන බෝක්කුවලින් ඇළට සම්බන්ධ වෙන්නේ නැති නිසා. ඒ ටික කෙරුණේ නැහැ. දැන් ඒ තියෙන බෝක්කුවල පටුවීමත් එක්ක වතුර ටික සම්පූර්ණයෙන්ම පාරට දාලා ඊයේ දවසේ වලවත්ත ප්‍රදේශය සම්පූර්ණයෙන්ම යටවෙලා තිබුණා පැය ගණනාවක්ම. සමහර ගෙවල්වල මගේ ඉන මට්ටම දක්වා වතුර තිබුණා. විශාල පීඩාවකට තමයි ජනතාව පත්වෙලා තියෙන්නේ. හැබැයි වලවත්ත ප්‍රදේශයේ ගංවතුර පාලනය කරන්න බැරි දෙයක් නෙමෙයි. නිසි ක්‍රියාමාර්ග ගන්න ඕන ගරු සභාපතිතුමනි. මම ඉල්ලීමක් කරනවා සභාවෙන් ඔබතුමා මැදිහත් වෙන්න නරාවල කොට්ඨාශයේ ජලයෙන් යටවෙන ගෙවල් කීපයක් තියෙනවා. ගෙවල් තිහක් හතළිහක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉස්සෙල්ලා මෙහෙමයි. ඔබතුමයි, අපියි ගිහින් බලලා සැලසුමක් හදමු ඕකට මොකක්ද කරන්න පුළුවන් කියලා. ගොවිජන සේවා එකත් යන්න ඕන.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ගිය සැරෙත් ඔය කටයුතු එකට කරා අපි. අවශ්‍යතාවය ඇතුව පිළිතුරක් ලැබුණේ නැහැ ගරු සභාපතිතුමා. දැන් මම ඉල්ලන්නේ සභාපතිතුමා මැදිහත්වෙලා අපි නරාවල විහාරස්ථානයට හරි එකතුවෙලා ඒ මිනිස්සු ටික, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා එකේ අය කැඳවලා, ගරු ඇමතිතුමාව ගෙන්නාගෙන මේ ප්‍රශ්නයට එවලේ විසඳුමක් දෙන්න ඕන මොකක්ද කරන්නේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හොඳ යෝජනාවක්. එහෙම කරමු.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ ඉන්න මිනිස්සු තමයි දන්නේ වතුර පාර එන්නේ කොහෙන්ද, යටවෙන්නේ කොහොමද කියලා. ඇත්ත කතන්දරය දන්නේ ඒ අය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම වුණත් දැන් මෙහෙම දෙයකුත් තියෙනවා. වතුර දාපු ගමන් යටවෙනවා. මිනිස්සු පුරුදුවෙලා තියෙනවා කවුද ආවේ, අරයා ආවේ නැහැ, කෑම දුන්නේ නැහැ, මුකුත් දුන්නේ නැහැ කියලා කියන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා වලවත්ත ප්‍රදේශයට එහෙම ගැටලුවක් ඇතිවෙලා නැහැ. අතීතය ගැන කතා කරොත් හරි අප්පිරියක් තියෙන්නේ හිටපු කෘෂි නිලධාරීන් ගැන. නම් කියන්න බැහැ. කෘෂි නිලධාරීන් රුපියල් පනස්දහසක් අරගෙන ගෙවල් හදන්න ඇළ ගොඩකරන්න අවස්ථාව දීලා තියෙනවා. මම නම් පවා දන්නවා. ඒ සියල්ල එළි කරන්න පුළුවන්. මේ සභාවේ ගෞරවය ආරක්ෂා කරන්න ඕන නිසා නම් සඳහන් කරන්නේ නැහැ. රුපියල් පනස්දහසක් අරගෙන කෘෂි නිලධාරීන් ඇළවල් ගොඩ කරන්න අවසර දීලා තියෙනවා ඒ තියෙන හිතවත්කම්වලට. ඒ නිසා තමයි අද ගංවතුර තර්ජනයට ලක්වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නිලධාරීන් ඔක්කොටම චෝදනා කරන්න එපා ඉතින්.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඔබතුමා ඉන්නකෝ. ඔබතුමා කතා කරනකොට මම බාධා කරේ නැහැනේ. ඒක නිසා ඒ සියලු දේ නිරාකරණය කරන්න. මම මිනිස්සුන්ට කිවුවා රැස්වීම කැඳෙව්වට පස්සේ ඒ සියලු ප්‍රශ්න ඉදිරිපත් කරන්න කියලා. එතකොට නම් ගම් වුණත් නිලධාරීන් ඉදිරිපිටදීම ඉදිරිපත් කරන්න පුළුවන්. සභාවේ ඉදිරිපත් කරන්න බැරි වුණාට නිලධාරීන් ඉදිරිපිට ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනාව හොඳයි. මැතිවරණයෙන් පස්සේ ඇමතිතුමා ලවා අදාළ ආයතන ටික ගෙන්වාගෙන, ඒ ස්වෙච්ඡා සංවිධාන, ප්‍රජා සංවිධාන, ඒ ටිකත් කැඳවලා අදාළ පුද්ගලයොත් කැඳවලා කරමු. ඔබතුමාට මතක ඇති ඔය විදියටම කියන්න ඕන අපි අර බලෙන් කැපුවා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් කාණුව. හැමදේම නොවුණා කියන්න එපා. එතන අදටත් පොලිසි යනවා. අදටත් මෙහෙට එනවා. භාරලක්ෂ ගාණක හානියක් වුණා කියලා ඒක ඉල්ලගෙන එනවා. ඒක ගෙවන්න කියලා කිය කිය එනවා. ඒ මට්ටමට කියන්න එපා මන්ත්‍රීතුමා. අපි කරපු දේවලුත් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** නොවුන එක නොමෙයි ගරු සභාපතිතුමා, මම කියන්නේ සරල කාරණා කෙරුණේ නැති එක ගැන. මම කිවුවේ පායන කාලේ කුඹුරේ, බෝක්කුවේ තියෙන කාණු ටික අඩි තුනට විතර කපන්න කියලා මම යෝජනා කරා ඇළ දක්වා. මම සඳහන් කරේ එවැනි කාරණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමා, ඒවා කෙරෙන්න ඕන මෙහෙමයි. අර කිවුවා වගේ අපි අදාළ ආයතන ටික කැඳවාගෙන කරමු. උදාහරණයක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට කරන්න පුළුවන් දේවල් තියෙනවා. ගොවිජන සේවා එකෙන් කරන්න පුළුවන් දේවල් තියෙනවා. අපේ සභාවෙන් කරන්න පුළුවන් දේවල් තියෙනවා. අපිට ඒ සියලුම දේ බදාගෙන කරන්න බැහැ. ඇළට යන කාණුව නම් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් හරි, ගොවිජන සේවා එකෙන් හරි කරගන්න පුළුවන්. මම කියන්නේ ඒක නිශ්චිතව ඕන. අහවල් තැන, මේ කාණුව, වගකීම මෙයාට කියලා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒක තමයි ඇත්ත කාරණාව. සභාපතිතුමා අදටත් සභාවට ගෞරවයක් එන තැනක් තමයි කොහොඹනාදෙණියේ කාණුව කපපු එක. ඒක අපි මැදිහත්වෙලා කරේ. හැබැයි ඒකේ බලය තියෙන්නේ, කරන්න තියෙන්නේ කාටද, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට. හැබැයි ඒක සිදුවුණේ නැහැ. හැබැයි අදටත් සභාව මැදිහත්වෙලා නොකෙරුනා නම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඒක කරන්න ඕන කියලා අදටත් කොහොඹනාදෙණිය යටවෙලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වගකීම තියෙන කෙනා ලවා අපි මැදිහත්වෙලා කරගන්න ඕන.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** අපි ඒක කරානේ සභාපතිතුමා. රාජ්‍ය ආයතනවල තියෙන අකාර්යක්ෂමතාවය මත සිදුවෙන්නේ නැති ප්‍රශ්නය තියෙන්නේ. ඇත්තටම සිදුවෙන්නේ නැති කාරණාව තියෙන්නේ. වගකිව යුතු ආයතන එකතුවෙලා කරන්න ඕන. ජනතාව හිතන්නේ අපි මුකුත් කරන්නේ නැහැ කියලා. ජනතාව හිතන්නේ අපි මැදිහත්වෙන්නේ නැහැ කියලා. ගංවතුර ආවම ඇවිත් බලලා යනවා කියලා හිතන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අර විදියට කරමු ඇමතිතුමා හරහා කැඳවලා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ කාරණාවට මැදිහත්වීමක් වෙන්න කියලා ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාගේ අවධානය යොමුකරන්න. පන්විලදූව වත්ත ඊයේ ඉවරයි. ඔබතුමා ගියා නම් පෙනේවි. අපි මැදිහත්වෙන්න ඕන. අර මිනිස්සුන්ගේ වගාවල් ඔක්කොම ඉවරයි. ගිහිල්ලා බලන්න. ඒකට වහාම තීන්දුවක් ගන්න. දැන් කොයි කාලයක් වෙනවද. කාණුව බැන්දා නම් ඉවරයි. දොස්තර මහත්තයා පටන් ගනිපු තැන ඉඳලා තියෙන වැරැද්දනේ යන්නේ.

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මම මෙතනදී වචනයක් කතා කරන්න ඕන යසරත්න මන්ත්‍රීතුමා කරපු යෝජනාවට. නැත්නම් ඒක ලොකු වැරැද්දක් වෙනවා. මම තමයි තාක්ෂණ නිලධාරි මහත්මයත් එක්ක ඉලේපෙරුම මාවතේ කාණුව මනින්න ගියේ. ඒ ප්‍රශ්නය නිසා මිනිස්සු දිගින් දිගට අසරණවෙලා ඉන්නේ වතුර බස්සවන්න මොනවත් ක්‍රමයක් නැති නිසා. අපි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හරහා නිර්දේශයක් අරගෙන ඒ කාණුව හදන්න සැලසුම් කරේ. කිසි කෙනෙකුට ඒකෙන් හානියක් නොවන අයුරින් ප්‍රධාන මාර්ගයේ කාණුව හදලා තමයි වතුර බස්සවන්න අපි තීරණය කරේ. ඒ නිසා කිසිම කෙනෙකුට ප්‍රශ්නයක් වෙන එකක් නැහැ. දිගින් දිගටම ඇදි ඇදී යන ප්‍රශ්නයක් නිසා තමයි මම තාක්ෂණ නිලධාරිව අඬගහගෙන ගියේ ඒ කාණුව බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන පුද්ගලික ආරවුලක ස්වාභාවයක් තමයි දිගටම තියෙන්නේ. එහෙම එකක් තියෙනවා යසරත්න මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ලිපියක් මගින් අපිට දැනුම්දීමක් කරා. කොහොමත් මම ඒක කලිනුත් දැක්කා. වතුර කොහෙන් හරි බහින්න ඕන. ගලි හදනකොට අනුමැතියක් අරගෙන හදන්න ඕන. ගලියේ වතුර උතුරනකොට පාර දිගට යනවා. ගඳයි. යන්න බැරි තත්වයක් තිබුණා. පසුගිය කාලයේ ඒක තිබුණා. කොහෙන් හරි ඒක ඉවර වෙන්න ඕන. ඔබතුමිය කාණුව මැන්නා කියලා නෙමෙයි කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකෙදි යසරත්න මන්ත්‍රීතුමා එක්කෙනයි විරුද්ධ. අනිත් සියලු දෙනා කියනවා එතන ඒ කාණුව දාන්න ඕන කියලා. එක්කෙනයි විරුද්ධ. එයාට එතන ප්‍රශ්නයකුත් නැහැ හැබැයි. එයාට එතන තියෙන ප්‍රශ්නය මට තේරෙන්නේ නැහැ. එයාට එතන ගැටළුවක් නැහැනේ. එයාට ප්‍රශ්නයක් නැහැ. කාණුව සම්පූර්ණයෙන්ම යන්නේ ගේ ඉස්සරහින්.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගේ ඉස්සරහින් යන්නේ. දොරකඩින් යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පාරේ පැති කාණුව. ඒක කාටවත් වළක්වන්න බැහැ. ඔය වගේම එකක් තියෙනවා පන්විල පාරේ. මේ ඔක්කොම එන්නේ එක වගේ ඒවා. තමන්ගේ ඉඩම ඉස්සරහින් කාණුව තියෙන්නේ. නමුත් තමන්ගේ අයිතිවාසිකම් කියනවා. මම මේකට විරුද්ධයි කියලා. තියෙන බෝක්කුව මෙහාට කරන්න දෙන්නේ නැහැ. ඔය වගේ මට්ටමක් තියෙන්නේ ඇත්ත කතාව.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒ කාණුව දිගටම දානවට අපිත් කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දිගටම දානවා. ප්‍රධාන පාර වෙනකම් ගේනවා. වෙල පැත්ත නෙමෙයි. වෙල පැත්තට දාන්නේ නැහැ. එතන අතුරු පාර හරහා අරගෙන කෙළින්ම අයින දිගේ එනවා ප්‍රධාන පාරේ කාණුවට.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ප්‍රධාන පාරේ කාණුවක් නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රධාන පාරේ කාණුවක් තියෙනවා. පාර හරහා බෝක්කුවක් එක්ක කාණුවක් තියෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** පාර හරහා දාලා එහා පැත්තට දාන්න ඕන. මේ පැත්තේ නැහැ කාණුවක්. එහෙම බෝක්කුවක් දාලා හදනවා නම් හරි ඉතින්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, දූව වත්ත ප්‍රදේශයට මේ මොහොත වනවිට වතුර ප්‍රමාණය වැඩිවෙනවා කියලා කියනවා. දූව වත්ත මාර්ගයට යන්න තියෙන්නේ වක්වැල්ලේ තොටුපල පැත්තෙන්. එහෙම නැත්නම් මේ පැත්තෙන් ගිහිල්ලා බටුවන්තුඩාව පැත්තෙන් ගිහිල්ලා ඇතුල් වෙන්න ඕන. ඊයේ රාත්‍රියේ තිබුණට වඩා වතුර ප්‍රමාණය වැඩි වෙලා කියලා මට දැන් දුරකථන ඇමතුමක් ආවා. වතුර දණහිසටත් වඩා තියෙනවා කිවුවා වේල්ලේ එගොඩට යන්න බැරි විදියට. ඒ ස්ථානය ගැන පොඩ්ඩක් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තුසිත මන්ත්‍රීතුමා ඒකට පාරුවක් ලේස්ති කරලා තියෙනවා එතුමාගේ වියදමින්. ඒක අපි අවශ්‍යතාවයට ලබා දෙනවා. තුසිත මන්ත්‍රීතුමා ඒ පාරුව හදලා ඉවරයි දැන්. දැන් ඒක ලබාදෙනවා හෙට හරි අනිද්දා හරි. අද පුළුවන් වුණොත් අද හවස අපි ගිහිල්ලා ලබා දෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, දැන් ඔය සම්බන්ධ ගැටලු සහගත තත්ත්වයන්ට නිර්දේශ අරගෙනත් වැඩ කරන්න බැහැ. දැන් මෙතුමන්ලා ඉදිරිපත් කරපු කරුණු සම්බන්ධව කියන්නේ. දැන් ඔබතුමාට ඒක තනියෙන් බැහැ. අපේ කමිටුවක් තියෙනවානේ. කමිටුවට ඒ ටික දෙන්න. කමිටුව විදියට අපි රැස්වෙලා ගිහිල්ලා බලලා නිර්දේශ දෙන්නම්. එතකොට මේ තාක්ෂණ නිලධාරීන්ටත් ගැටලුවක් නැහැ. සභාවෙන් පත්කරපු මන්ත්‍රීවරු කණ්ඩායමක කමිටුවකින් ලැබිච්ච නිර්දේශයක්. තාක්ෂණ නිලධාරීන්ට හානියක් නොවෙන්න කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි ප්‍රියන්ත මන්ත්‍රීතුමා. දැන් ඉතින් ඔතන කමිටුව කියන එක හැමදේටම නෙමෙයි. දැන් වතුර පාර බස්සවන එක කමිටුවට දාන්න අවශ්‍ය නැහැ. මොකද ඒක තාක්ෂණ නිලධාරි නිර්දේශයෙන් කරන්න පුළුවන්. අපි කමිටුවෙන් බලාපොරොත්තු වෙන්නේ මොකක් හරි අවහිරතා තියෙනවා නම් අනවසරව යනවා නම් වතුර බැසීම හරස්කරලා බැම්මක් ගහනවා නම්, ඒ ආකාරයේ නිර්දේශ. වතුර බහින එකට කාණුවක් දාන්න කමිටු යන්න ඕන නැහැ. ඔබතුමාට වැරැද්දක් කියනවා නෙමෙයි. හැමදේම එහෙම කරොත් කමිටුවෙන් විතරයි සියලු දේ කෙරෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක හරි. මේකෙදි මේ අය කරුණු ඉදිරිපත් කරලා මැනුම් කටයුතුත් සිදු කරලා තිබුණට අද වෙනතුරු විසඳිලා නැති ප්‍රශ්නයක් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇස්තමේන්තු හදලා ඔක්කොම කරලා තියෙන්නේ. ඒක විසඳෙනවා. අපි න්‍යාය පත්‍රයට යමු.

<u>**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ-**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** නව නිවස සාදා ගැනීමට භූමිය සකස්කර ගැනීම සඳහා. (වක්වැල්ල, හපුගල, මවුන්ට්ප්ලසන්ට් වත්තේ පදිංචි ආර්. ඒ. එස්. එච්. ඩබ්. ප්‍රින්ස් පෙරේරා)

මේ බොහොම අසරණභාවයට පත්වෙච්ච පවුලක්. රුපියල් ලක්ෂ හයක රජයේ වියදමින් නිවස සාදා දෙන්න කටයුතු කරනවා. දැන් අඩිතාලම් දාලා තියෙන්නේ බොහොම මෑතක. විශාල ප්‍රමාණයේ ගස් පහක් තිබුණා. ඉතින් ඒ ගස් කපලා තියෙන්නේ. ඒ ගස්වල මුල් ටික ඉවත්කරලා දෙන්න කියලා ඉල්ලනවා. එකේ නිර්දේශ තියෙනවා. ග්‍රාම නිලධාරි නිර්දේශ තියෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිර්දේශ තියෙනවා. සභාවේ බැකෝ යන්ත්‍රය යොදවලා ඒ මුල් ටික ඉවත්කර ගැනීමේ අවසරය ඉල්ලනවා. ඒ ඉල්ලීමට සභාවේ එකඟතාවය අවශ්‍යයි. ඒක මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඕක දැන් මේ හැම මන්ත්‍රීවරයටම ලැබිලා තියෙනවා. අපි කියවලා බැලුවා. අනිවාර්යයෙනම රජයේ මුදල් කියන්නේ අපේ මහජන මුදල්. සභාවේ බැකෝ යන්ත්‍රය යොදවලා ඒ පහසුකම ඒ දිළිඳු පවුලට ඉටුකරදීම සඳහා මම ඒ යෝජනාව ස්ථිර කරනවා. ඒකට අනිත් මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නැතිවෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ගස් ටික කැපුවෙත් එක එක්කෙනාගෙන් මුදල් ඉල්ලගෙන ඒ මට්ටමෙන්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** නරාවල පන්විල මාර්ගය සම්බන්ධව (ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා)

මේක ක්ෂණික යෝජනාවක් චනක මන්ත්‍රීතුමාගේ. මේ මාර්ගය දැනට කාපට් කරගෙන යනවා. එතනදී අවහිරතා කිහිපයක් මතුවෙලා තියෙනවා. ඒකට සභා තීන්දුවක් අපිට ගන්න අවශ්‍ය වෙනවා. එකක් තමයි පන්විල මාර්ගයේ මීටර් 898 ස්ථානයේ බෝක්කුව තාක්ෂණ නිලධාරි මහතා තීරණය කරන පරිදි සකස් කිරීමට එරෙහිව ඇති ගැටලුව.

එතන දැනටතියෙන්නේ පරණ බෝක්කුවක්. ඒක වැහිලා තියෙන්නේ. ඒක අංශක අනූවක් විතර තමයි හැරෙන්න තියෙන්නේ. සිලින්ඩර් දාලා තියෙන්නේ. නමුත් අපි ගියා. තාක්ෂණ නිලධාරි, මම, චනක මන්ත්‍රීතුමා, මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරි අපි ඔක්කොම ගිහින් බැලුවා. නිර්දේශය වුණේ ඊට පොඩ්ඩක් මෙහාට ආවා නම් ඒක දිගේ කුඹුර දක්වා වතුර බස්සවන්න පුළුවන්. ඉතින් ඒකට සහයෝගයෙන් ඉදිරිපත්වෙලා තියෙන්නේ.

දෙවැනි කාරණය පන්විල මාර්ගයේ සංවර්ධනයට බාධා ඇති දුරකථන කණු සහ විදුලි රැහැන් කණු ඉවත්කර ගැනීම.

තුන්වැනි කාරණය මාර්ගයේ පටු ස්ථාන පුළුල්කර ගැනීමේ ගැටලු.

ඔය ගැටලු තුන වනක මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තියෙනවා. ඒකටත් සභා තීන්දුවක් ගන්න එක වඩා හොඳයි කියලා හිතුනා. නැත්නම් කරගෙන යද්දී බාධා එනවා. ඔක්කොම තියෙන්නේ පාරේ. ඔය බෝක්කුව වුණත් කිසි කෙනෙකුට බාධාවක් නැහැ. පාරේ තියෙන්නේ. ඒක අඩි 20ක් විතර ඉස්සරහට ගෙනැල්ලා හදන්නේ. එතකොට අර ගෙදරක මිදුලක් හරහා අංශක අනූවට යන එක වළකිනවා. ඒ අයගේ ඉඩමෙන් දෙනවා. කුඹුරු තියෙන්නේ ඒ අයටමයි. අඩි පහක වුණත් දිගට කාණුවක් කපන්න අවසර දෙනවා. දැනටමත් කපලා තියෙන්නේ. එතකොට බෝක්කුව එක කෙලින් දාන්න තියෙන්නේ. නැත්නම් බෝක්කුව තියෙන්නේ අරහේ. අංශක අනූවකට දැන් යන්නේ. ඒක මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒකට විරෝධතාවයක් තියෙනවා නම් මොකක්ද කියලා දැන ගන්න ඕන. දාන්න එපා කියලා කියනවද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දාන්න එපා කියලා අපිට එක්කෙනයි විරුද්ධ වෙලා තියෙන්නේ. එයා කියන්නේ දාන්න එපා කියලා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එක්කෙනෙක් විරුද්ධ වුණාම ගමේම අවශ්‍යතාවය නවත්වනවද ඔබතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි ඉතින්.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** අවශ්‍ය දේ කරන්න. ඒ යෝජනාව ස්ථිර කරනවා. පොදු දෙයක් කරන්න ඕන. පුළුල් කිරීම අවශ්‍ය නම් ඒක සකස් කරන්න. සභාවේ අනුමැතියක් අරගෙන කරන්න පුළුවන් හැකියාවක් තියෙනවා නම් කරුණාකරලා ඒක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** ගාල්ල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයේ නිර්දේශ පරිදි 125/ඒ, කලේගාන උතුර ග්‍රාමසේවා වසමේ අංක 25/2, වී.සී පාර, කලේගාන ලිපිනයේ පදිංචි එච්. එස්. පී. ලක්ෂ්මන් කරුණාරත්න මයාගේ ඉඩමේ වැසි ජලය බැසයාම සඳහා ක්‍රමවත් කාණු පද්ධතියක් ඉදිකර ප්‍රධාන ඇළ මාර්ගයට ජලය බැහැර කිරීම (බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරු)

කලින් සභාවේදී මේ සභාවට කල් තියපු යෝජනාව තියෙන්නේ. ලක්ෂ්මන් කරුණාරත්න මහතාගේ ප්‍රශ්නය. ඒ ප්‍රශ්නයේදී අපි මන්ත්‍රීවරු කණ්ඩායම විදියට කිහිපදෙනෙක් ස්වෙච්ඡාවෙන් ඉදිරිපත්වෙලා ගිහින් බැලුවා. ඊයෙත් ලක්ෂ්මන් මහත්තයා මට දුරකථනයෙන් දැනුම් දුන්නා අඩි තුන හමාරක් මේ වෙනකොටත් යටවෙලා තියෙන්නේ කියලා. ඉතින් ඒකට අපි ක්‍රියාමාර්ගයක් ගන්න ඕන. කවුරු තරහා වුණත්, මොනදේ වුණත් ක්‍රියාමාර්ගයක් ගන්න ඕන. ඒක බලපු මන්ත්‍රීවරයෙක්ගෙන් ඉල්ලා සිටිනවා ඒ ගැන අදහස් දක්වන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒකට අමුතුවෙන් අදහස් දක්වන්න අවශ්‍ය නැහැ. මේ සුගත් මන්ත්‍රීතුමා කතාකරා. අමුතුවෙන් ඕන නැහැනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඒක සම්බන්ධව කතා කරනවා නම් ඇත්තටම ඇස් දෙක හොඳට පේන, මොලේ චුට්ටක් හරි තියෙන කෙනෙක් එතනට ගියා නම් ඒකට විරුද්ධ වෙන්න අවශ්‍යතාවයක් නැහැ සභාපතිතුමා. එච්චරයි පැහැදිලිව කියන්න තියෙන්නේ. මේක සභා යෝජනාවක් දාන්න දේකුත් නෙමෙයි. වතුර යන්නේ නැහැ උඩ අතට. වතුර ගලන්නේ පහළට. පහළට කාණුවක් කපන එක තමයි අපි කළ යුත්තේ. උඩහ ඉන්නේ කවුද, මොන පක්ෂයේද කියන එක අපිට අවශ්‍ය නැහැ. මම නම් දකින්නේ පක්ෂ පාට නොබලා ඔබතුමාට ලැබුණ බලයෙන්, ඔබතුමාට තියෙන සභාපති බලයෙන් ඒ වැඩේ කරන්න. කිසි ගැටලුවක් නැහැ. ඒකමතිකව එච්චරයි විය යුත්තේ. ඇස් දෙක හොඳට පේනවා නම්, චුට්ටක් හරි මොලේ තියෙනවා නම් ඒ වැඩේ කළ යුතුයි. ඒ යෝජනාව මම එකහෙළා ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒ පිළිබඳව මගෙත් අදහස් දක්වනවා. දැන් අපි ලක්ෂ්මන් මහත්තයාලගේ ළඟ තියෙන භූමි සැලැස්ම අනුව එකේ වතුර බසින කාණුවක් සඳහන් වෙලා තියෙනවා. එතුමා ඒ සැලැස්ම අපිට එවලේ පෙන්නුවා. ඒ ස්ථානයේ අපි කාණුව ඉදිකරන්න ගියොත් ඊට ආසන්න පවුල් හතරක්, පහක් ඊට විරුද්ධ වුණා. ප්‍රසිද්ධියේම විරුද්ධ වුණා. මේක කරන්නෙම දෙන්නේ නැහැ කිව්වා. එතකොට අපි විකල්ප කාණු පද්ධතියක් යෝජනා කරා. අපේ තාක්ෂණ නිලධාරිතුමත් ගියා. ඒකේදී ඒ මාර්ගය පළුදු කරලා පෙට්ටි බෝක්කුවක් දාන්නට අමරතුංග මහත්තයත් එකඟ වුණා. චාමිනි මහත්තයත් එකඟ වුණා එයාගේ වත්තෙන් දෙන්න. දැන් එතන එක ස්ථානයක ගැටලුවයි ඉතුරු වුණේ. චාමිනි මහත්තයාගේ ගෙට ඉස්සරහ ඉඩමේ චන්දන මහත්තයාගේ කැමැත්ත ලැබුණොත් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කැමති නැහැ කිව්වා. උදේ කතාකරා. ඔය චාමිනි මහත්තයා කිව්වා මට ත්‍රීවිල් එක ඉඩම උඩින් ගන්නවටවත් කැමති නැහැ කිව්වා. ඒකටත් කැමති නැහැ කියලා කිව්වා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා** ඃ- එතකොට අපිට විකල්ප කාණු පද්ධතියකට යන්න බැරි වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ පැරණි කාණු පද්ධතිය යන්න වෙන්නේ. හැබැයි සාධාරණයි දෙපැත්තෙන්ම අඩිය අඩිය ගානේ අරගෙන අඩි දෙකක කාණුවක් සභාවේ වියදමින් අපි කොන්ක්‍රීට් කරලා දෙමු.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා** ඃ- ඒක සැලැස්මේ තියෙනවානේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දැන් අවුරුදු පහකට විතර කලින් ප්‍රාදේශීය සභාව විසින් හදපු සැලැස්මක් තියෙන්නේ. ඒක මුලින්ම ආපු සැලැස්මක තියෙන එකක් නෙමෙයි. සභාව මැදිහත්වෙලා සභාවේ වියදමින් හදපු එකක්.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමා, පරණ සැලැස්මක් ගෙනැල්ලා දුන්නා ඒ ගෙදර කට්ටිය. ඒ සැලැස්මේ ඒක තියෙනවා. ඒ තැනට අලුත් කාණුවක් නෙමෙයි හදන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මන්ත්‍රීතුමා ඔබතුමා කියන එක හරි. ඒක පැනකින් ලකුණු කරපු එකක් තිබුණේ. ඔරිජිනල් එකක් අපි දැක්කේ නැහැ. කොහොම හරි වෙනත් විකල්පයක් නැහැ ඔතනට.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා** ඃ- කාණුවක් ඉදිකරන්න වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක කාටත් වාසි වෙන්න පුළුවන්. කාටත් අවාසි වෙන්න පුළුවන්. දෙපැත්තෙන්ම අඩිය අඩිය අරගෙන අඩි දෙකේ කාණුවක් ඉස්සෙල්ලා කපන්න ඕන. ඔතනට මැෂින් එකක් දාන්නත් බැහැ. අපි අතින් කපමු. මට නම් අදටත් කියන්න තියෙන දේ තමයි ඔය විරුද්ධ වෙන පාර්ශවය කාලයකදී කියයි ඔය දේ කෙරුණ එක හොඳයි කියලා. ඒ අයටත් බලපාන ප්‍රශ්නයක් මේක. ඊයේ වැස්සට ඒ අයත් යට වෙන්න ඇති. එතන මැදින් දෙපැත්තෙන්ම අරගෙන කාණු පද්ධතියක් ගියාට පස්සේ දෙපැත්තටම ඕක හොඳයි. මම හිතනවා ඔය අයත් පසු කාලයකදී එකඟ වෙයි ඔය ගනිපු ක්‍රියාමාර්ගය හොඳයි කියලා. ඉතිං ඒක හින්දා අපි ඒ තීන්දුව ගමු.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා** ඃ- ඒක මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ඒක මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, ඒක කළ යුතු කාරණයක්. දෙගිඩියාවක් නැහැ. ඒක නිර්දේශ කරලා තියෙන්නේ.

මම කතා කරන්න හැදුවේ පන්විල මාර්ගයේ මෙතුමාගේ යෝජනාවක් ඉදිරිපත් කරා. ඒකේ මුලින් කතා කරපු කාරණා දෙකක් සම්බන්ධව කතා කරන්න ඕන. දුරකථන කණු ඉවත් කිරීමට අදාළව එම ආයතන දැනුවත් කරලා ඒක කරන්න ඕන. මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගන්න කොට පෞද්ගලික ඉඩම් වලින් අත්පත් කර ගැනීමක් කරන්න වෙනවද, ඒ සම්බන්ධව එකඟතාවයක් සහිතවද කටයුතු කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක අපි කිහිප තැනකින් කතා කරා. පුද්ගලිකව කතා කරලා ඒක බේරගන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ඒක පහසු වෙයි. ඒ ක්‍රියාමාර්ගය ගන්න පුළුවන්. එහෙම නැති වුණොත් තමයි අපිට ඒක ගැටලුවක් වෙන්නේ.

ඊළඟ කාරණය අර බෝක්කුවේ ස්ථානය වෙනස් කරන එක. එතන දැනටමත් පවතින බෝක්කුවක් තියෙනවානේ. ඒක පෙට්ටි බෝක්කුවක්ද, සිලින්ඩර් බෝක්කුවක්ද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- සිලින්ඩර් බෝක්කුවක්. 2005 දී ඔය මාර්ගයේ සියලුදෙනාම පාර මැද ඉඳන් අඩි 10 ගාණේ දෙන්න එකඟ වෙලා තියෙනවා. එකඟතා ලිපි තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- දැන් අඩි 20 පළල නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අඩි 20 පළල නැහැ. අපිට ඕන වෙලාවක අඩි 20 ගන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ප්‍රශ්නයක් නැහැ. පෙට්ටි බෝක්කුවක් නෙමෙයිනම් තියෙන්නේ සිලින්ඩර් දෙක ගලවලා මෙහාට කරා නම් හරි. නැත්නම් අලුත් සිලින්ඩර් දෙකක් දාන එක හරිනේ කරන්න තියෙන්නේ. එතකොට ඒක කාටවත් ගැටලුවක් වෙන්නේ නැහැ. කාටත් අවහිරතාවයක් නැත්නම් වෙන කෙනෙකුට හානියක් නොවන පරිදි ඒක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔතන තියෙන්නේ කාලයක ඉඳලා තියෙන ආරවුලක්. ඒක ඔලුවේ තියාගෙන ඉන්නේ. අපිට එයාලගේ ආරවුල බලපාන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක සභාවක් විදියට අපිට බලපාන්නේ නැහැ. ඒක නිසා ඔබතුමා නිවැරදිව ඒ ක්‍රියාමාර්ගය ගන්න. පෙට්ටි බෝක්කුවක් තියෙනවා නම් අපිට ඒක ගලවලා අයින් කරන්න බැරි කමක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පෙට්ටි බෝක්කුවක් නෙමෙයි සිලින්ඩර් බෝක්කුවක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙම නම් ප්‍රශ්නයක් නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**4.** බෝපෙ එගොඩ කනත්ත ප්‍රජා ශාලාව ඉදිරිපිටින් ඇති මාර්ගය හා කාණු පද්ධතිය සංවර්ධනය කර ගැනීම. (බෝපෙ එගොඩ කනත්ත ප්‍රදේශයේ ගම්වාසීන්)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඉල්ලීමක් කරේ සභාපතිතුමා. ඒක අපි තාක්ෂණ නිලධාරි යවලා පරීක්ෂා කරලා බලමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක අපේ පාරක්ද, මාර්ග සංවර්ධන අධිකාරියේ පාරක්ද

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපේ පාරක්. සභාවට ආවා ඒකේ පැමිණිල්ල. හතර දේවාල පන්සල ඉදිරිපිටින් තියෙන පාර මේ. ලහිරුලගේ ගෙවල් වලට යන පාර. බුද්ධිකා මිස් යන්නෙත් මේ පාරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සුගත් මන්ත්‍රීතුමා සාකච්ඡා කරලා විධිමත් යෝජනාවක් විදියට ඊළඟ සභාවාරයට ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** තව බෝක්කුවක් තියෙනවා. ඒකත් ඒ එක්කම ඉදිරිපත් කරන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක විධිමත් යෝජනාවක් විදියට දාලා, තාක්ෂණ නිලධාරි අධීක්ෂණය යටතේ කරමු.

**05.** ඊ. එල්. ජී. ව්‍යාපෘතියේ පාලන හා නඩත්තු කටයුතු සම්බන්ධවයි. (වරිපනම් අංශය, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය)

ඒකට අනුමැතිය අවශ්‍ය වෙනවා ඉදිරි කටයුතු කරගෙන යන්න. ඒක වරිපනම් අංශයෙන් ඉල්ලන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, දැන් ඒ වරිපනම් එකතු කිරීම සඳහා භාවිතා කරනු ලබන මෘදුකාංගය අයි. සී. ටී. ඒ. ආයතනය මඟින්ද අපිට ලබා දුන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක රාජ්‍ය අනුග්‍රහය සහිත ආයතනයක්. ඒ ආයතනය පෞද්ගලිකරණයට ලක් වෙලා කියලද මේ කියන්නේ. අපිට නිකං දීලා ඉවර වෙලා මෘදුකාංග පද්ධතිය පෞද්ගලික ආයතනයකට දෙනවා කියලද කියන්නේ. රාජ්‍ය අනුග්‍රහය සහිත ආයතනයක් හරහා අප වෙත පවරලා තිබුණේ. ඒක හරියට නිකං නාස් ලණුව දාලා ඉවර වෙලා අනිත් කෙලවර කාටහරි දෙනවා වගේ. දැන් අපිට මේකෙන් ගැලවෙන්නත් බැහැනේ. දැන් අපි මේක ස්ථාපිත කරලා, භාවිතයට නගලා මේ හරහා ක්‍රියාත්මක වෙනවා. ඊට පස්සේ ඒ පද්ධතිය ක්‍රියාත්මක වෙන කොට ඒකේ අයිතිය වෙනත් ආයතනයකට පවරලා තියෙනවා. මේක ගැටලු සහගත ප්‍රශ්නයක්. අපි රාජ්‍ය ආයතනයක් හැටියට වරිපනම් බදු එකතු කරන එක ඇත්ත. ඒක සභා අරමුදලට එකතු වෙනවා. නමුත් මේකට අපි මැදිහත් වෙලා විසඳන්න පුළුවන් ප්‍රශ්නයකුත් නෙමෙයි කියලා තමයි මගේ අදහස තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් ආයතනත් ඒ විදියට තමයි කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නමුත් අපි අපේ විරෝධතාවය ඒ සඳහා දක්වන්න ඕන. අපි අමාරුවේ දැම්මා වගේ වැඩක් මේක. අපිට නිකං දීලා අනිත් පැත්තෙන් විකුණලා තියෙනවා මෘදුකාංග පද්ධතියේ නඩත්තු කටයුතු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිත් විරෝධතාවය දක්වලා තියෙන්නේ. නමුත් වැඩේ කෙරෙන්නේ නැත්නම් අපි මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** විකල්ප ක්‍රම සැලකිල්ලට ගන්න පුළුවන්ද කියලා අයි.සී.ටී.ඒ එකෙන් අහන්න ඕන. එයාලනේ මේක අපිට දුන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කරන්න බැරිතැන තමයි මේක දැම්මේ. දැනට මාස හයක් විතර වෙනවා මේ ප්‍රශ්නය දිගින් දිගට ඇවිල්ලා. මේක තවදුරටත් යන්න බැහැ. බැරිම තැන තමයි මේ තීරණයට ඇවිල්ලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පාරකට වැටුණට පස්සේ ඒ පාරේ මගක් ගිහිල්ලා ඉවර වෙලා ආපහු හැරිලා මුලට එන්න ඕන. එක්කෝ යන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දේකුත් තියෙනවා ඉතිං. වාර්ෂිකව රුපියල් අසූ දාහක මුදලක් යන්නේ. උපදේශකත්වය වගේ තමයි යන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අයි. සී. ටී. ඒ. එක විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේනේ තියෙන්න ඇත්තේ. ඒ යටතේ මේ සඳහා උපදෙස් අර ගත්තා නම් හොඳයි කියලා මට හිතෙන්නේ. ඒකට මොකක් හරි ක්‍රියාමාර්ගයකට යමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ගැටලුව සම්බන්ධව ලේකම්තුමාට සභාව දැනුවත් කිරීම සඳහා කාරක සභා අවස්ථාවක් මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- මෙම ව්‍යාපෘතිය පසුගිය වසරේදී ඇනහිටීම හේතුවෙන් ඒ සඳහා දැක්වූ දැඩි විරෝධතාවය හමුවේ තවත් වසරක් නොමිලේ සේවාව ලබා දුන් බව.
- මේ ගැටලුව සම්බන්ධව අදාළ සියලු ආයතන දැනුවත් කළ බව.
- දකුණු පළාතෙන් අප ප්‍රාදේශීය සභාව පමණක් තෝරා ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවූ බව.
- මෙම ව්‍යාපෘතිය ඉදිරියට සිදු කිරීම නොකළහොත් වරිපනම් මෘදුකාංග පද්ධතිය ඇනහිටීම සිදු වන නිසා නැවත වරිපනම් පොත් නඩත්තු කටයුතු වලට යා යුතු බවත්, එම කටයුත්ත මීට වඩා වියදම් අධික බව.
- මෙම තත්ත්වය හමුවේ කිසිම ආයතනයක් අප ප්‍රාදේශීය සභාව වෙත උපකාර කිරීම සිදු නොකරන බව.
- අන්තර්ජාලය හරහා ගෙවීම් කටයුතුද මේ වන විට ඇනහිට ඇති බව.
- මෙම ව්‍යාපෘතිය ඉක්මනින් ක්‍රියාවට නැගිය යුතු බවත්, මේ සඳහා වෙන විකල්පයක් නොමැති බව.
- මෙම ගැටලුව සම්බන්ධව දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් බව.
- වෙනත් මෘදුකාංගයක් අලුතෙන් නිර්මාණය කර පවත්වා ගෙන යාම සඳහා විශාල මුදලක් වැය වන බව.
- අයි.සී.ටී.ඒ ආයතනය විසින් එම මෘදුකාංගයේ නඩත්තු කටයුතු අදාළ පුද්ගලික ආයතනය වෙත පවරා ඇති බවට අප ප්‍රාදේශීය සභාව දැනුවත් කර ඇති බව.
- මීළඟ ඉදිරි සභාවේදී විධිමත් අනුමැතියක් ලබා ගන්නා තෙක් මෙම කාරණය අනුමත කරන ලෙස ඉල්ලා සිටින බව.
- මෙම ගැටලුව සම්බන්ධව සියලු විස්තර ගරු මන්ත්‍රීවරුන්ගේ දැනුවත් වීම සඳහා ඉදිරියේදී ලබා දිය හැකි බව.
- මීට අමතරව මන්ත්‍රීවරුන්ට ඇති ගැටලු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉන්දික මන්ත්‍රීතුමා මේක දැන් සභාවට දැම්මට විධිමත් යෝජනාවක් ඊළඟ සභාවට දානවා. හදිසි නිසා දැම්මේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාවේ අනුමැතිය ගන්නනේ දාන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා විරුද්ධනම් කරුණාකරලා විරුද්ධයි කියලා කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම විරුද්ධ වෙන නිසා විරුද්ධ වෙන කාරණය කියන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඒකටත් පැයක් ගනීවි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පැයක් ගන්නවද කියන කාරණය නෙමෙයි වැඩේ තියෙන්නේ. තමුන්නාන්සේට ඔව්, නෑ, බෑ තරග තියන්න බැහැ මෙතන. එහෙම තරග තියන්න බැහැ. අහවල් වචන කතා කරන්න තහනම් එහෙම කියන්න බැහැ.

දැන් අපේ සභාව රාජ්‍ය ආයතනයක් එක්ක නොමිලේ ගනුදෙනු කරන්න ලැබුණ වරප්‍රසාදය අහෝසි කරලා තියෙනවා. ඒක අපි දන්නේ නැහැ. මාස හයක් තිස්සේ ක්‍රියාමාර්ග ගන්න උත්සාහ කරලා ඉවර වෙලා අපිට ඉදිරිපත් කරන්නේ දැන් බැරි වුණ නිසා. මාස හයක් තිස්සේ සාකච්ඡා කරන්නේ නැතුව මේක දාන්නේ දැන්. එහෙම නම් සභාව එක්ක සාකච්ඡා කරන්න තිබුණා මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා මොකද කරන්නේ කියලා. විකල්ප ක්‍රියාමාර්ග තියෙනවද කියලා අහන්න තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි දැන් ඔබතුමා මේකට මොකක්ද කරන්න කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ ඕක සාකච්ඡා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ මතය කියන්නකෝ. මම යෝජනා කරනවා මේක සම්මත කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔය විදියට සම්මත කරන එක වැරදියිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔබතුමා මොකක්ද කියන්නේ කියලා කියන්න. ඔබතුමා විරුද්ධයිද, පක්ෂයිද කියලා කියන්න. ඔබතුමා විරුද්ධයි කිවුවොත් බෙදීමකට යනවා එච්චරයි. ඔබතුමාට අද මේක කඩාකප්පල් කරන්න මම ඉඩ දෙන්නේ නැහැ. හැමදාම වගේ මේකේ පැය ගණන් කතා කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ ඔබතුමා මේක මාස හයක් තිස්සේ ලිප්බොක්කේ ගහගෙන ඉඳලා අපෙන් අහනවා ඔව්, නෑ, බෑ කියලා. ඒකනේ ලැජ්ජාව. එහෙම අහන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා උපරිම උත්සාහයක් ගත්තා අන්තිම මොහොත වෙනකම්. නැත්නම් මේක මේ හැංගි හොරා ගේන්න ඕන නැහැ. මේක හදිසි යෝජනාවක් විදියට ගේන්න ඕන නැහැ. ඔබතුමත් රජයේ නිලධාරියෙක්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක දන්න නිසයි කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක වරිපනම් අංශයෙන් ඉල්ලන්න. මම අහන්නේ ඔබතුමා එකඟද, නැද්ද, කියලා. මට ඔබතුමාට කතා කරන්න දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මේ යෝජනාවට විරුද්ධයි. මේ විදියට දානවට අපි විරුද්ධයි. මේ විදියට ප්‍රශ්න විසඳන්න බැහැනේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අනවශ්‍ය ප්‍රශ්නයක් මේ අනවශ්‍ය විදියට ගෙනාවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් ඡන්දයක් විමසනවා.

එම යෝජනාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 13

විපක්ෂව - 02

ඡන්දය දීමෙන් වැළකී සිටි - 02

ඡන්ද විමසීම සිදු කරන විට සභා රැස්වීම් ශාලාවේ නොසිටි - 05

**යෝජනාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබාදුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
06. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
07. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
13. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**යෝජනාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබාදුන් පිරිස**

01. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
02. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**යෝජනාව සම්මත කිරීම සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
02. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය

**ඡන්ද විමසීම සිදු කරන විට සභා රැස්වීම් ශාලාවේ නොසිටි පිරිස**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
04. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැඩි ඡන්ද එකොළහකින් එම යෝජනාව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා, ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**<u>(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත**

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උප සභාපතිතුමාට ජල ගැල්ම හින්දා මහ සභා රැස්වීමට සහභාගි වෙන්න විදියක් නැහැ කියලා මාව දැනුවත් කරා. එතුමාට නිවාඩු අනුමත කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා කලේගාන සතිපොළ නොපැවැත්වීම හේතුවෙන් මැයි මාසය සඳහා බදු මුදල් අය නොකර සිටීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාර්තු හා අප්‍රේල් මාස දෙක සඳහා පොදු තීන්දුවක් අරගෙන තියෙනවා. මැයි මාසය සඳහාත් සහනය ඉල්ලනවා. මැයි මාසයේදී පොළ ආරම්භ කරේ නැහැ. ජුනි මාසයේ ඉඳගෙන තමයි පොළ ආරම්භ කරේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා උපකාරක පන්ති නොපැවැත්වීම හේතුවෙන් වටරැක නැගෙනහිර ප්‍රජා ශාලාව බදු දී ඇති ජී. සම්පත් ඩයස් මහතා වෙතින් මාර්තු හා අප්‍රේල් මාස දෙක සඳහා බදු මුදල් අය නොකර සිටීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා ව්‍යාපාර කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ලබුදූව ජංගම බස් රථ භෝජනාගාරයේ මාර්තු හා අප්‍රේල් මාස දෙක සඳහා බදු මුදල් අය නොකර සිටීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 170 වගන්තිය ප්‍රකාරව මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව 2020-03-26 වන දින පහත සඳහන් වැය ශීර්ෂයන් අතර මුදල් මාරුකර තිබීම අනුමත කරන මෙන් යෝජනා කරමි.

| අනු අංකය | අතිරික්ත වූ වැය විෂයන් | | | ඌනතා වූ වැය විෂයන් | | |
|---|---|---|---|---|---|---|
| | වැය සංකේතය | වැය විෂය | වටිනාකම | වැය සංකේතය | වැය විෂය | වටිනාකම |
| **01** | 103-1 | සැපයුම් ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | රු.300,000.00 | 605-9 | වෙනත් වියදම් | රු.300,000.00 |
| **02** | 105-9-1 | වෙනත් වියදම් | රු.310,000.00 | 605-9 | වෙනත් වියදම් | රු.310,000.00 |
| **03** | 108-9 | විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂිත | රු.1,200,000.00 | 605-9 | වෙනත් වියදම් | රු.1,200,000.00 |
| **04** | 205-2 | සම්බන්ධතා සේවා ඖෂධ | රු.500,000.00 | 605-9 | වෙනත් වියදම් | රු.500,000.00 |
| **05** | 205-9 | වෙනත් වියදම් | රු.500,000.00 | 605-9 | වෙනත් වියදම් | රු.500,000.00 |
| **06** | 603-1 | සැපයුම් ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | රු.200,000.00 | 605-9 | වෙනත් වියදම් | රු.200,000.00 |
| | | මුළු එකතුව | රු.3,010,000.00 | | මුළු එකතුව | රු.3,010,000.00 |

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**05.** කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා ව්‍යාපාරික කටයුතු සිදු නොකිරීම හේතුවෙන් බදු මුදල් අය නොකළ පහත දක්වා ඇති ව්‍යාපාරික ස්ථානවල බදු මුදල් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව පොත්වලින් කපා හැරීමට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපාරික ස්ථානයේ නම | බදු මුදල් අය නොකළ මාස පිළිබඳ විස්තර | | | | ප්‍රමාද ගාස්තුව | මුළු මුදල |
|---|---|---|---|---|---|---|---|
| | | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | | |
| 01 | ලබුදූව වෙළඳ සංකීර්ණය | රු.222,625.00 | රු.222,625.00 | - | - | රු.18,202.50 | රු.463,452.50 |
| 02 | කලේගාන පොළ කඩකාමර | රු.8,100.00 | රු.8,100.00 | - | - | රු.1,195.00 | රු.17,395.00 |
| 03 | ගව මස් කඩ | රු.161,372.50 | රු.161,372.50 | - | - | | රු.322,745.00 |
| 04 | හපුගල ජන සභා ගොඩනැගිල්ල | රු.12,600.00 | රු.12,600.00 | - | - | රු.550.00 | රු.25,750.00 |
| 05 | කලේගාන පොළ | රු.60,850.00 | රු.60,850.00 | රු.60,850.00 | - | - | රු.182,500.00 |
| 06 | ඌරු මස් කඩය (කෘෂිකර්මය) | රු.3,000.00 | රු.3,000.00 | - | - | - | රු.6,000.00 |
| 07 | ලබුදූව ජංගම බස් රථ භෝජනාගාරය | රු.7500.00 | රු.7500.00 | - | - | - | රු.15,000.00 |
| 08 | වටරැක නැගෙනහිර ප්‍රජා ශාලාව | රු.1,815.00 | රු.2,000.00 | - | - | - | රු.3,815.00 |
| 09 | පෝද්දල පොදු වෙළඳ සංකීර්ණය | රු.20,050.00 | රු.20,050.00 | - | - | රු.4010.00 | රු.44,110.00 |
| | | | | | | මුළු එකතුව | රු.1,080,767.50 |

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**06.** ලබුදූව වෙළඳ සංකීර්ණයේ අංක 27 දරණ කඩ කාමරයේ බදු අයිතිය මනෝහාරි ප්‍රභාකුමාරි මායාකඩුව මිය (ජා.හැ.අ 197753604157) වෙතින් රත්නායක මුදියන්සේලාගේ සුබසිංහ බණ්ඩාර මයා (ජා.හැ.අ 591740784V) වෙත පැවරීම සඳහා කරනු ලැබූ ඉල්ලීම අනුව දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ 2010-12-27 දිනැති හා දපපා/පපාකො/2010/01 චක්‍රලේඛයේ 12 වන වගන්තිය අනුව සිදු කිරීමටත් ඒ සඳහා සාධාරණ මුදලක් එක්වන් මුදලට එකතු කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තව සාධාරණ මුදලක් එකතු කරන්න පුළුවන්. මේ සම්බන්ධව ලේකම්තුමාට සභාව දැනුවත් කිරීම සඳහා මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>**කාරක සභා අවස්ථාව**</u>

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවල බදු අයිතිය වෙනස් කිරීම සඳහා ආණ්ඩුකාරතුමාගේ සහ පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ඇතුව කමිටුවක් පත්කර මාස හයක සහන කාලයක් ලබා දුන් බවත්, එහිදී සභාව විසින් තීරණය කරනු ලබන සාධාරණ මුදල රුපියල් පනස්දහසක් කළ බව.
- මෙම කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා රුපියල් තුන් ලක්ෂ පනස් දහසකට ආසන්න මුදලක් සභාවට ගෙවිය යුතු බවත්, මෙම මුදලට අමතරව තවත් සාධාරණ මුදලක් මේ සඳහා සභාවට එකතු කළ හැකි බව.
- මේ සඳහා සාධාරණ මුදලක් සභාවට තීරණය කළ හැකි බවත්, එම මුදල සභාවට ආදායමක් වන බවත්.
- මෙම සිද්ධිය සඳහා පමණක් මෙම සාධාරණ මුදල බලපාන බව.
- මීට අමතරව මෙම සිද්ධිය පිළිබඳව මන්ත්‍රීවරුන්ට ඇති ගැටලු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර වල බදු අයිතිය පැවරීමේ කටයුතු සිදු කිරීම සඳහා සභාවට ගෙවනු ලබන සාධාරණ මුදල රුපියල් ලක්ෂයක් කරන ලෙස මෙම යෝජනාවට මම සංශෝධනයක් එකතු කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම සංශෝධනය මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** පෝද්දල උප කාර්යාලය පුස්තකාලය, ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය හා නඩත්තු සහ සේවා මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය කර පවත්වාගෙන යාමටත්, උප කාර්යාලය මගින් දැනට සිදු කරනු ලබන සියලුම කාර්යාල කටයුතු ප්‍රධාන කාර්යාලය හරහා සිදු කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම පෞද්ගලිකව නම් මේ දේට විරුද්ධයි. පොදු තීන්දුවක් ගන්න. ඒකට හේතුව වෙන දෙයක් නෙමෙයි ගරු සභාපතිතුමනි, ඇත්තටම මේකේ ඉතිහාසය ගත්තම ගම් සභා කාලය වෙනමයි තිබුණේ. බෝපෙ සහ පෝද්දල වෙන වෙනමයි තිබුණේ. අපේ සභා කාලය තුළදීත් අපි මේ දෙපැත්තේම සභා රැස්වීම් පවත්වලා තියෙනවා. හදිසියෙන් හරි එහේ කරලා තියෙනවා. අවුරුද්දකට සභා වාර දෙකක් තුනක් එහේ පවත්වපු කාලවල් තිබුණා. සභාපතිතුමාට මතක ඇති. ඉතිං ඒ නිසා ඇත්තටම මම හිතන්නේ එහෙම කරන එකේ පොඩි ගෞරවයක් එනවා. ඒක නිසා මම විශ්වාස කරනවා ඒක පවත්වාගෙන යන එක හොඳයි කියලා. අපිට තියෙනවානේ තව ඉඩ කඩ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේ යෝජනාව ඉදිරිපත් කරන්න හේතුව මොකක්ද කියලා දැන ගන්න කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රධානම හා එකම කාරණාව තමයි මිනිස්සුන්ට ක්ෂණික විසඳුම් හම්බ වෙන්නේ නැහැ ගොඩක් වෙලාවට. උදාහරණයක් කියන්නම් දැන් මනුස්සයෙක් මෙහේ එනවා. ගොඩක් වෙලාවට එහේ යන්නේ නැහැ. මෙහේ එනවා ලියුමත් අරගෙන. ලියුම අරගෙන ආවහම මම සටහනක් දාලා යවනවා එහෙට. එහෙට ගිහින් තාක්ෂණ නිලධාරි බලලා ආයේමත් මෙහෙට එවනවා. ඒ පාර මම තීරණ අරගෙන ආයේමත් එහෙට යවනවා. ඒ ලියුම හතර පස් පාරක් එහෙට මෙහෙට යවනවා. ඒ පාර මම තාක්ෂණ නිලධාරිට වෙනම දුරකථනයෙන් දැනුම් දීලා කියන්න ඕන මෙන්න මේක එවුවා කියලා. සමහර විට ඒ ලියුම ලැබෙන කොට එයාට අවධානයක් නැහැ මේ පිළිබඳව. අතන මම බැලුවේ නඩත්තු කටයුතු ඔක්කොම කරගෙන යන්න. ප්‍රීමික්ස් ටික ඒ ඔක්කොම එතන කරන්න. පුස්තකාලයයි, ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයයි පවත්වාගෙන යනවා උප කාර්යාලය විදියට. තවත් කාරණයක් තියෙනවා මම දන්නේ නැහැ මේක කියන එක සාධාරණද කියලා. වැඩ නොකරන එකට මමත් වගකියන්න ඕන. මහජන සම්බන්ධතාවය, කාර්යක්ෂමතාවය පිළිබඳව මිනිස්සුන්ගේ චෝදනාවක් තියෙනවා. මට මෙතන තියෙන කොට ඔක්කොම එවෙලේම කරන්න පුළුවන්. තාක්ෂණ නිලධාරීන් ඉන්නවා අදාළ නිලධාරීන් ඉන්නවා. මට එවෙලේම ප්‍රශ්න වලට මොකක් හරි විසඳුමක් දෙන්න පුළුවන්. ඉක්මන් දෙයක් කරන්න පුළුවන්. ඔන්න ඒකයි හේතුව. නැතුව වෙන ප්‍රශ්නයක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අදහස අනුව දැන් එතන තියෙන්නේ පරිපාලන කටයුතුවල ගැටළුවක් නේ. පරිපාලන කටයුතු අන්තර් සම්බන්ධ කරන කොට දුරස්ථභාවයත් එක්ක යම් කාලයක් මේකට ගතවෙන නිසා අපහසුතාවයට පත් වෙනවා. දැන් පැන නැගිලා තියෙන්නේ ඒ ගැටලුව.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වගේම සමහරු මාස තුනකින් විතර ආයෙම ඇවිත් කියනවා සභාපතිතුමා අර ලියුමට එදායින් පස්සේ මුකුත්ම කෙරුනේ නැහැනේ කියලා. දැන් මට මේක එක තැනකින් වෙනවා නම් මට එවෙලේම බලන්න පුළුවන්. මෙහේ ටික දැනටමත් එහෙම කරනවා. මෙහෙන් යන ටික වෙනම රෙජිස්ටරයක දාලා ඒක කරනවා. ඒකට විසඳුමක් හම්බවුණේ නැත්නම් මට ඒක අහන්න බලන්න පුළුවන්. ඒක මෙහෙන් කෙරෙනවා. නමුත් අරහේ ඒක වෙන්නේ නැහැ. හේතුව ඕකයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පොඩි අවස්ථාවක් දෙන්න මේ සම්බන්ධව කතා කිරීමට. ඔබතුමාගේ යෝජනාවේ එක කොටසක් මට පිළිගන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නෙමෙයි. පරිපාලන දේවල් වලට, ඔබතුමාගේ අනුමැතියෙන් දෙන්න ඕන දේවල් කතා කරලා ආපහු මෙතනට අරගෙන ඇවිල්ලා මෙතනින් අනුමත කරලා යනකොට ගතවෙන කාලය අපරාදේ. ඒක ඇත්ත. ඒක කාර්යක්ෂම කරන්න ඕන. විධිමත් කරන්න ඕන. මෙතනට මේක සම්බන්ධ කර ගන්න එක පහසුනම් ඒ පරිපාලන කටයුතු මෙහෙට සම්බන්ධ කර ගැනීම සම්බන්ධයෙන් මම විරෝධතාවයක් දක්වන්නේ නැහැ. නමුත් මෙතෙක් කාලයක් ඒක කෙරුණා. අපි මහජන කටයුතු විමධ්‍යගත කිරීම තමයි නිවැරදි ක්‍රමය. ඒක තමයි හොඳ. ඒ මිනිස්සුන්ට පහසු වෙනවා ඒක. ඒකෙදි ඔය පරිපාලන කටයුතු විමධ්‍යගත කරන කොට අනුමැතිය හා අනෙකුත් කටයුතු එතනින් හමාර කරන්න පුලුවන් නම් ඒක හොඳයි. හැබැයි ඒක වෙන්නේ නැහැනේ. මෙතනටනේ බලය පැවරිලා තියෙන්නේ. ඒ නිසා එම අපහසුතාවය දකිනවා. ප්‍රශ්නය තියෙන්නේ පුස්තකාලය සහ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය කියන දෙක විමධ්‍යගත කරලා තැන් කිහිපයක පවත්වා ගෙන යන එක මහජනතාවට ඉතාමත්ම පහසුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට පුළුවන් නම් අපි එදත් කතා කරේ ලබුදූව, ගොඩකන්ද හරියෙන් තව එකක් දාන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ යෝජනාවට මම සංශෝධනයක් ගේනවා. විශේෂයෙන්ම පුස්තකාලය ගැන කියන්න ඕන. සෑහෙන්න ප්‍රමාණයක පාඨකයෝ පිරිසක් ඒක භාවිතා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ටික තියන්න කියලා මම කිවුවේ. අනිත් ටික විතරයි කතා කරේ. නමුත් දැන් මට හිතෙනවා ඒ යෝජනාව ඉල්ලා අස්කර ගන්න. ඊට වඩා කාර්යක්ෂම ක්‍රමයක් ගැන බලමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක අපි සාකච්ඡා කරලා බලමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට තේරෙනවා ඒකට අපි මොන තරම් උත්සාහයක් දැරුවත් එතන අඩුපාඩුවක් තියෙනවා. තීන්දු තීරණ ගැනීමයි, ලිපි හුවමාරුවයි අතර ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකට විකල්පයක් නැත්නම් කමක් නැහැ. ඔය කියන යෝජනාවේ ඒ කියන කොටස නෙමෙයි ප්‍රශ්නය. අර ආයතන දෙක එතන විධිමත්ව පවත්වා ගෙන යන්න ක්‍රමයක් සකස් කරන්න ඕන. ඒක තමයි සුදුසු කියන එක මගේ යෝජනාව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්නම් ඉතිං වෙනත් ක්‍රම තියෙනවා. තාක්ෂණික ක්‍රම භාවිතා කරලා කරන්න පුළුවන්. ෆැක්ස් එකක් එහෙට දීලා කරන්න පුළුවන්. නමුත් වියදමත් වැඩියි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේල් එකක් ගෙන්න ගන්න එක පහසුයි නේද, උදාහරණයක් විදියට මම මෙහෙම කියන්නම්. ඔබතුමාට අනුමැතියට එවන එකක් තියෙනවානම් ඒක ටයිප් කරලා, ඔක්කොම කරලා මෙතනට අතේ ගෙනත් දෙන්න දවසක් ගත කරන්න ඕන නැහැ. එතන වැඩේ කරලා ඒකට අදාළ ලිපිය ස්කෑන් කරලා මෙහෙට ගෙන්න ගන්න. ඔබතුමා ඒක අත්සන් කරලා යවන්න. ඔබතුමා ඔරිජිනල් එක පස්සේ යවන්න. ඒක ප්‍රශ්නයක් නැහැ. ලිපිගොනුවට පස්සේ දා ගන්න. අර වැඩේ කරන්න එවෙලේ අනුමැතිය අවශ්‍යයි. ආයතනයේ නිල විද්‍යුත් ලිපිනය තියෙනවානේ. ඒ සඳහා ඒක භාවිතා කරන්න. පිට අයට ඒකට සම්බන්ධ වෙන්න බැහැනේ. ඒක ඔබතුමා බලය පවරපු නිලධාරියෙක්ගේ අධීක්ෂණය යටතේ තියෙන්න ඕන. එහෙම කරලා ඒක විධිමත් කරන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය කොහොම හරි මේක ක්‍රමවත් වෙන්න ඕන. මේකෙදි මිනිස්සු අපහසුතාවයට පත් වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව සංශෝධනයක් විදියට හරි ඉදිරිපත් කරන්න. එහෙම නම් පළවෙනි පියවර හැටියට එවැනි විකල්ප ක්‍රියාමාර්ගයක් අපි උත්සාහ කරලා ඒක සම්බන්ධ ප්‍රතිඵල පිළිබඳව අදහසක් අරගෙන ඒ ක්‍රියාමාර්ගයට යමු. නමුත් පුස්තකාලය සහ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය තවත් විධිමත් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් ඒ දෙක තියෙනවා. ඒ දෙකේ වෙනසක් වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ දෙකත් මෙතනට ගේනවා කියලා අදහසක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ දෙක තියෙනවා. ඒ දෙක ඇරලා කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඇත්තටම මේ කුණු ගොඩට කර ගහන්න එපා කියලා. මේක අර වගේ විධිමත් කරන්න පුළුවන්. එහෙම නැත්නම් ඔබතුමාට පුළුවන් එතන වෙනත් අඩුපාඩු තියෙනවා නම් ඒවාට තදින් ඉන්න. ඊළඟට එකක් තියෙනවා ඔබතුමාට පුළුවන් ඇත්තටම සතියට දවසක් නෙමෙයි දවසකට දෙකකට පාරක් එහෙට යන්න. ඔබතුමාට එතන ගිහින් හිටියහම වෙනම ගෞරවයක් තියෙනවා. ඔබතුමාට එතන වෙනම කාර්යාලයක් තියෙනවා. මම හිතනවා වඩා සුදුසු ඒකයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක දැනට මම ඉල්ලා අස්කර ගන්නවා. තව බලමු. තිබුණ දෙයක් නැති කරන එක වැරදි දෙයක්. එතකොට වැරදි දෙයක් කරා කියන හැඟීම එනවා. ඒක හරි. එම යෝජනාව මම ඉල්ලා අස්කර ගන්නවා.

**08.** දෛනික දීමනා පදනම යටතේ කම්කරුවෙකු බඳවාගෙන මාර්ග හා කාණු පද්ධති නඩත්තු කටයුතු සඳහා යොමුකරනු ලබන ස්ථිර හා අනියම් කම්කරුවන්ගේ වැඩ අධීක්ෂණය සඳහා යෙදවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉස්සෙල්ලා මම මේකට හේතුව කියන්නම්. මම මේක කලිනුත් ගෙනාවා. අපි නැවත සාකච්ඡා කරලා ඒක පස්සට ගත්තා. නමුත් දැන් මේක කරන්න සිද්ධ වෙන මට්ටමට ඇවිල්ලා තියෙනවා. අති විශාල චෝදනාවක් වැඩ ක්ෂේත්‍ර කම්කරුවන්ගේ වැඩ කරන තැන් වලින් එනවා. ගියොත් තියෙන ප්‍රසාදය නැති වෙනවා ඇරෙන්න දෙයක් ඇතිවෙන්නේ නැහැ. ඒක එකක්.

දෙවැනි කාරණය දැන් ඉන්න වැඩ පරීක්ෂක මහත්තයාට ඒක පාලනය කර ගන්න බැහැ. එතුමා නිතර දකින කුකුළා වගේ. එතුමාට ඒක පාලනය කර ගන්න බැහැ දැන්. ඒක දෙවැනි කාරණය.

ඊළඟට අපි හිතමු වැඩකට යැව්වොත් වැඩේට යන්නේ විනාඩි 15 නම් දවසටම එච්චරයි වැඩේ. ආයෙත් ඒකෙන් එනවා. ඔබතුමාලා දන්නවාද උදේ 9.00 ට මෙතනින් ගිහිල්ලා මම දැක්කා උදේ 11.00 වෙද්දි වෙලාව බූට් ගෙනල්ලා දාලා යනවා. ඒ එන අප්‍රසාදය එන්නේ මට. මම බැලුවා බැලුවා හරි ගියේ නැහැ. දැන් පිටස්තර කෙනෙක් කම්කරු පත්වීම යටතේ තමයි ගන්නේ. අරගෙන එයාට සම්පූර්ණයෙන්ම උදේ ඉඳගෙන හවස් වෙනකම් අධීක්ෂණය කරන්න දෙනවා. එයාගේ සම්පූර්ණ රාජකාරිය වෙන්නේ ඒක. එයා තමයි සම්පූර්ණයෙන්ම වගකියන්න ඕන. ඒක හින්දා තැන් තුනකට දැම්මත් එයා ඒ ටික බලන්න ඕන. අනිවාර්යයෙන්ම පස්වරු 04.30 වෙනකම් ඉන්න ඕන. නැත්නම් මේක කරන්න බැහැ. මේ ඉන්න අයගෙන් කරන්න බැහැ. මම කීප දෙනෙක්වම දාලා බැලුවා. චන්දනව දාලා බැලුවා බැරි වුණා. ඉන්න වැඩ පරීක්ෂක මහත්තයව දාලා බැලුවා බැරි වුණා. ලලිත්ව දාලා බැලුවා බැරිවුණා. ඒක කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ලලිත්ව දැම්මද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලලිතුත් දැම්මා. දැනට වැඩ මූලික විදියට ලලිත් තමයි අරහේ ඉන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මීපාවල උප කාර්යාලයේ කම්කරුවන් සම්බන්ධව ප්‍රශ්නයක් තියෙනවාද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මීපාවල අයගේ චෝදනා අඩුයි. ඒක අපි පිළිගන්නවා. නමුත් පොදුවේ එන්න ඕන කාරණාව කියන්නම්. දැන් ගියොත් ඇත්නම් කියන්නේ මේ කන වෙලාව. අපිට කන්නත් නැහැ. ඒ ප්‍රශ්නය කියනවා ගම් වල. තේරුණාද, කන්න නැහැ, කන්න විදියක් නැහැ, කන වෙලාවේ තමයි එන්න වුණේ. මේ නිකං වැඩ කරනවා වගේ හැඟීම තියෙන්නේ. මම කියන්නේ කවුරු තරහා වුණත් කමක් නැහැ. මොන සේවකයා තරහා වුණත් කමක් නැහැ. මේකේ චෝදනාව මට විතරක් නෙමෙයි මේකේ ඔක්කොටම එනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා කරන චෝදනාවට ගනිපු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් පොඩි ප්‍රශ්නයක් මතු වෙනවා. ගරු සභාපතිතුමනි ඔබතුමා දැන් මේක සම්බන්ධව පියවරයන් කිහිපයක් ගත්තානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රීමික්ස් වල වැඩ මූලික විදියට ඉන්නේ ලලිත්නේ. ලලිත්ව දාන්න විදියක් නැහැ ඒ නිසා අනිත් අයගේ වැඩ අධීක්ෂණය කරන්න. ප්‍රීමික්ස්වල වැඩේ කෙරෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** උප කාර්යාලයට අපි ගියහම දකින දෙයක් තියෙනවා. ඒ සේවකයෝ හුඟක් වෙලාවට වැඩ කරන තැන්වල වැඩ කරලා එන වෙලාව සාමාන්‍යයෙන් හැන්දෑවේ හතර පහ වෙනවා. මම ගිහින් තියෙනවා. මම ඕෆ් වෙලා එනකොටත් වැඩ. මම දැකලත් තියෙනවා පිට වැඩ කරනවා. එහෙම ලොකු විවේචනයක්, චෝදනාවක් අපිට දැනිලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙමනේ. විජේපාල මහත්තයා විතරයිනේ වැඩ පරීක්ෂක කෙනෙක් විදියට ඉන්නේ. දැන් එයාට වැඩ රාජකාරි ගොඩක් තියෙනවා. අතනට යන්න ඕන, අර මැෂින් එක කැඩුනහම හදන්න ගෙනියන්න ඕන. මේක කරන්න ඕන. වතුර බවුසරය ගැන බලන්න ඕන. වෙන ආයතනයකින් මොනවා හරි ඉල්ලුවොත් ඒ ආයතනයට ඒක සපයන්න ඕන. ඒ සියලු දේ එයා කරනවා. තාක්ෂණ නිලධාරීන්ටත් සම්පූර්ණයෙන් අනිත් රාජකාරි තියෙනවා. ඒ හින්දා විජේපාල මහත්තයාට එතන රැඳෙන්න බැහැ. මේ ගන්නේ පූර්ණකාලීනව එතන රැඳෙන කෙනෙක්ව. ඒ අදාළ වැඩ කරන ස්ථානයේ රැඳෙන කෙනෙක්ව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙතන ප්‍රශ්නය තියෙන්නේ මෙහෙමයි. ඔබතුමා මීට කලිනුත් කීප දෙනෙක්ව යෙදෙවුවානේ. මෙතන හිටපු කට්ටියව යෙදෙව්වා. විජේපාල මහත්තයව යෙදෙව්වා. මීට කලින් ඔබතුමා කිවුවේ එහෙමනේ. ඒ ක්‍රියාමාර්ගය සාර්ථක වුණේ නැහැ කියලානේ කිවුවේ. මට තියෙන ප්‍රශ්නය තමයි ආපහු පිටින් කෙනෙක් ගත්තත්, දැන් එයාවත් කම්කරු තනතුරකට නම් බඳවා ගන්නේ එයා ගිහින් වැඩ අධීක්ෂණය කරන කොට ඔය ප්‍රශ්නයට දෙන විසඳුම සාර්ථක වෙන්නේ නැහැ කියන එක තමයි මගේ අදහස තියෙන්නේ. ඒක ඒ සේවකයොත් කියාවි. තමන්ගේ තනතුරේ කෙනෙක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒක මෙහෙමයිනේ කරන්නේ. සම්මුඛ පරීක්ෂණයක් තියලා ඒ පෞරුෂයක් තියෙන කවුරු හරි තමයි බඳවා ගන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක පෞද්ගලිකව මම දකින්නේ මෙහෙමයි. පෞරුෂයක් තියෙනවා කියලා මොන කතන්දරය කිවුවත් එතන නීත්‍යානුකූලව අනිත් අය දන්නවා අලුත බඳවා ගනිපු කෙනෙක්, අපේ සමාන තලයේ අපිට වඩා කණිෂ්ඨයෙක්නේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මම කට්ටියව කැඳවලා ඒක කියනවා. කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ කතා වැඩක් නැහැ. මෙයාව දාලා තියෙන්නේ මේ වැඩේට කියලා කියනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අතුරු ප්‍රශ්න පැන නගිනවා ගරු සභාපතිතුමනි, මේකෙන් සේවකයෝ හැල්ලුවෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ගාල්ලේ නගර සභාව බලන්නකෝ. වැඩ අධීක්ෂණය කරන්න ඔක්කොම දාලා තියෙන්නේ අලුත් අය. ඔබතුමා බලන්නකෝ මම කියන එක නැද්ද කියලා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මෙතුමා කියන විදියට මේකේ වැඩට සේවකයෙක් ගන්න බැහැ.

(සභාව පැහැදිළි නොවීය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ ගරු සභාපතිතුමනි, ඔබතුමාවත් අපහසුතාවයට ලක්වෙයි අන්තිමට. යන වැඩ ටිකත් නොකෙරුණොත් හොඳ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මීට කලිනුත් ඔය ප්‍රශ්නය ඇවිල්ලා මම පස්සට ගියා. මම පස්සට ගිහින් හරි එහෙම කරමු කියලා ලලිත්ව දාලා බැලුවා. දැන් මේකට වෙන කරන්න දෙයක් නැහැ. කොහොමත් කෙනෙක්ව ගන්න වෙනවා. නැත්නම් එක්කෝ ගනිපු අයවත් අයින් කරලා දාලා මේක ඉවරයක් කරලා දාමු. චෝදනා ඔබතුමාට නෙමෙයිනේ එන්නේ. චෝදනා එන්නේ මට. මූලික චෝදනාව එන්නේ මට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම ඔබතුමාට යෝජනා කරේ මෙහෙමයි. ඔබතුමා මෙවැනිම ක්‍රියාමාර්ගයකින් පත්කරපු දෙන්නා කරෙත් ඕකනේ. නමුත් ඒක සාර්ථක වුණේ නැහැ කියනවානේ. දැන් මේකට වෙනත් විදියක් නැද්ද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කලින් පත්කරපු අයගෙන් විජේපාල මහත්තයට වෙනත් කාරණා වැඩියි. මේ ගන්නේ එතන ඉන්න මිනිහෙක්ව. ඒක තේරුම් ගන්න. දැන් ඔතන එකට වැඩ කරපු කෙනෙක් දාපු ගමන් එයාව යට කර ගන්නවා අරගොල්ලෝ. ඒක තේරුම් ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙම නම් ජ්‍යෙෂ්ඨයෙක්ව බලලා පත් කර ගන්න ඕන. එතකොට ජ්‍යෙෂ්ඨයට ඒ වගකීම තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සාමාන්‍ය පෙළ සමත් කවුරුහරි එහෙම කෙනෙක්ව බලලා, උගත්කමක් තියෙන කෙනෙක්ව බලලා ගන්නවා. එහෙම තමයි කරන්නේ. සම්මුඛ පරීක්ෂණයක් තියලා ගන්නේ. එතකොට ඔය කෙනෙක් දැම්මම අහන්නේ කොහොමද මෙයාව දැම්මේ, කොහොමද මෙයාව නම් කරේ කියලා. ඊට පස්සේ ගත්තම එයාගේ කොන්ද කැඩිලා ඉන්නේ. මොකද ඉන්නේ යාළුවෝ ටික. හරි බං මෙහෙමයි, උඹ සද්ද නැතුව ඉඳපන්, අරගේ ගිහින් එන්නම්, මෙහේ ගිහින් එන්නම් කියලා යනවා. ඔතන වෙන දේවල් දන්නවානේ. මේ ගන්නේ එහෙම නෙමෙයි. මෙයාව ගත්තම මමයි, තාක්ෂණ නිලධාරිනුයි පුද්ගලිකව අනිවාර්යයෙන්ම අල්ල ගන්නේ වැඩ පරීක්ෂකව. එතකොට එයාට ඒ ටික කරන්න වෙනවා. අපි දැන් විගණනය කරන්න කෙනෙක්ව දාලා තියෙන්නේ. අපි ලයිට් වැඩ ටික විගණනයෙන් බලන්න දාලා තියෙන්නේ. කම්කරු වැඩ ටික විගණනයට භාර දීලා තියෙන්නේ. ඒ ටික දැනට කෙරෙනවා. ඒ අයව අධීක්ෂණය වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ කටයුත්ත මෙතන කෙරෙන එක හරි. එවැනි ක්‍රියාමාර්ගයක් මේකට කරන්න බැරිද කියලා අහන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විගණනයට බැහැනේ කෙනෙක් වැඩ කරන තැන් ගිහින් බලන් ඉන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අහඹු ලෙස ඒ ක්‍රියාමාර්ගය ගන්නවා නම් හරි මම කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් වාහන වලට ජී. පී. එස්. හයිකරනවා. එතකොට අපිට දැන ගන්න පුළුවන් වාහනය කොතනද තියෙන්නේ කියලා. ඒවා වෙනවා. ඔබතුමා කතා කරන පරණ ක්‍රමයට එහෙම යන්න බැහැ. මේකට මොකක් හරි කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා කලින් යොදවපු ක්‍රමයටම වගේ පුද්ගලයෙක් යෙදෙවුවම එයා කරන්නේ නැත්නම් ඊළඟට මොකද කරන්නේ කියන එකයි මට තියෙන ප්‍රශ්නය. මේක සාර්ථකද, නැද්ද කියන එක ගැටළුවක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, වෙලාව ඉල්ලා සිටිනවා. මම හිතන්නේ අපේ වැඩ අඩුවෙන් කෙරෙන තව එකක් තමයි අපි සභාවට අදාළ නැති වැඩ තොගයක් කරන එක. අපේ සමාජයේ වෙනදා තිබුණා සාමූහිකත්වයක්. මරණයක් වුණාම ගමේ මිනිස්සු ටික එකතු වෙලා තමයි ඒ වැඩ කරේ. මගුල් ගෙයක් වුණාමත් එහෙමයි කරේ. පන්සලක ඇත්තටම දායකයෝ ඉන්නවා ඒවා කරන්න. දැන් අපි බැලුවම ඇත්තටම ඉස්කෝලවල වැඩටත් දානවා. ඒක නීතියේ පැත්තෙනුත් විරුද්ධයි. මොකද ඒවා වෙන ආයතන. ඉතිං ඒක නිසා මම මේක වෙන ප්‍රශ්නයකට කියනවා නෙමෙයි. ඔබතුමා මේක ගැන හිතන්න. එහෙම යවන කාලය තුළ ඔබතුමා බලන්න පැය කීයක් යනවද කියලා. මාසයකට පැය කීයක් යොදවලා තියෙනවාද බලන්න. අපි කාගේත් ඒවාට සහයෝගය ලබා දෙනවා. ඒවා බලලා ඒ වගේ ගන්න. මොකද හේතුව ඇත්තටම මරණ ගෙයක් කියන්නේ අපි කවුරුත් එකතු වෙන තැනක් එවෙලේම. එකතු වෙලා කරන දේවල් මේ.

ඊළඟට පාරවල් කොනක ඉඳලා සුද්ධ කරගෙන යනකොට මරණ ගෙදර කියලා විශේෂයෙන් සුද්ධ කරන්න ඕන නැහැ. මේක තමයි වෙලා තියෙන්නේ දැන්. ඊයේ වෙනකොට ඕපාතේ මාර්ග සංවර්ධන අධිකාරිය සතු පාර සුද්ධ කරලා තියෙන්නේ පන්සල ගාවින් පොඩ්ඩක් එහාට විතරයි. ඒක අපේ ප්‍රශ්නයක් නෙමෙයි. ඒක උප කොන්ත්‍රාත් දීලා තියෙනවා. ඉතිං කරලා තියෙන්නේ එතනට විතරයි. එතනට විතරක් කරාම අපි බලන්න ඕන මාර්ග සංවර්ධන අධිකාරියට ගිහින් ඇයි මේ පාර සම්පූර්ණයෙන්ම සුද්ධ කරේ නැත්තේ ඇයිද කියලා. නැත්නම් අපිට සල්ලි දෙන්න අපි කරන්නම් කියලා කියන්න. අපිට පුළුවන් ඒක මාර්ග සංවර්ධන අධිකාරියට බැරිනම් කරන්න. අපිට සල්ලි දෙන්න, අපේ මිනිස්සු දාලා කරන්න පුළුවන් කියලා කියන්න. දැන් ඊයේ වෙනකොට ඒක නවත්වලා. එතනින් එහාට යන්න බැහැ. ඕපාත පාර පටුයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ වගේම සභාපතිතුමා මමත් දැක්කා කාරණයක්. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පාර සුද්ධ කරනවා, කාණු කපනවා සභාවේ දෙන්නෙක්. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පාර. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති චන්දිම ගමගේ මහත්තයා. එතුමාට කියලා අපේ ප්‍රදේශයේ තියෙන පාර හදන්න. මේක නරක ආදර්ශයක්. දැන් අපේ කම්කරුවෝ දැම්මම වටරක ඉස්කෝලේ ඉස්සරහ පාර සුද්ධ කරන්න. ඒක දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට

අයිති. ඒ වැඩේ කෙරුණෙත් නැහැ. මට කරපු කෙනා අදාළ නැහැ. මෙහෙම කරාම කොහොමද මේ වැඩේ කරගෙන යන්නේ. අන්තිමට වැඩේ කෙරුණෙත් නැහැ. වැඩේ බාගෙට කරපු නිසා වතුර පිරිලා මදුරුවෝ බෝ වෙනවා ඒකේ. ඒ කාණුව සුද්ධ නොකර හිටියා නම් ඉවරයි. මම කියන්නේ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පාරවල්, මාර්ග සංවර්ධන අධිකාරියේ පාරවල් අපි සුද්ධ කරන්න ඕන නැහැ. ප්‍රාදේශීය සභාවට ඕන තරම් පාරවල් තියෙනවා සුද්ධ කරන්න. මම නම් කවදාවත් එහෙම කරලා නැහැ. පන්සල් පල්ලි වලට දීලත් නැහැ. මරණ ගෙවල්වලට කම්කරුවෝ ඉල්ලන්නෙත් නැහැ. මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කියන්න ඕන. මම දන්නේ නැහැ මොන හේතුවක් හින්දද කියලා. මට අපේ කම්කරුවන්ට දොස් කියන්න බැහැ. හේතුව පසුගිය රජයෙන් මගේ වැඩ කරා. විජේපාල මහත්තයත් ගිහින් හිටියා. මමත් ගියා. මම බලාපොරොත්තු වෙච්ච සම්පූර්ණ වැඩ කොටස කරා. මම දන්නේ නැහැ වැඩ නොකරනවා කියන එකට හේතුව මොකක්ද කියලා. මට හත් දෙනෙක් හම්බ වුණා. මම දෙන්නෙක්ව දැම්මා මහවත්ත සායනයට. අනිත් පස් දෙනාව පියදිගම පාර සුද්ධ කරන්න දැම්මා. වටේම කපලා සුද්ධ කරා.

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි මේකට ප්‍රධාන හේතුව වැඩ අධීක්ෂණය කරන්න හරි හමන් කෙනෙක් නැති එක. ඒක හින්දා ඒකට තමයි මෙම යෝජනාව ඉදිරිපත් කරේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා කවුරුවත් හිත හොඳ කරගෙන මේ ගමන යන්න අමාරුයි. හොඳට වැඩ කරන කම්කරු මහත්වරු ගොඩක් ඉන්නවා. පාරවල් දෙකක් දුන්නොත් මෙහේ කට්ටිය විතරක් කරන පාරකුයි, උප කාර්යාලයේ සේවක මහතුන් කරන පාරකුයි බැලුවම ඒක බොහොම පැහැදිළිව පේනවා. ඇත්තටම ඔබතුමා ගන්නේ කවුද කියලා කියන්න මම දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගන්නේ කවුද කියලා තවම තීරණය කරලා නැහැ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** හැබැයි ඒ ගන්න කෙනා වැඩ පරීක්ෂක විදියට වැඩේ ඉවර වෙනකම් එතන ඉන්න ඕන. සමහර මන්ත්‍රීවරු වැඩේ ඉවර වෙනකම් පාරේ ඉන්නවා. ඉතිං ඇත්තටම අපිට එහෙම ඉන්න බැහැ. එහෙම ඉන්නවානම් ඒ අය වැඩ කරනවා. නැත්නම් මේ පාර කරන්න කියලා ගියාට පස්සේ ඒක ඉවර වෙනකම් හරියට වෙන්නේ නැහැ. ඉතිං ඒක නිසා ඔබතුමාගේ යෝජනාව මම ස්ථිර කරලා තියෙනවා. අනිවාර්යයෙන්ම කෙනෙක් අරගෙන ඒක කරන්න. අනිවාර්යයෙන්ම ඒ කෙනාගෙන් බලාපොරොත්තු වෙන වැඩ කොටස වෙන්නත් ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කරනවා අනිවාර්යයෙන්ම. දෛනික ගෙවීම් පදනම යටතේ ගන්නේ. ඕන වෙලාවක අයින් කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** දෛනික පදනම මත ගන්න. වාසනා මන්ත්‍රීතුමියයි, මමයි දින දෙකක් හුවමාරු කරගෙන සේවක මහත්වරු ගත්තා. නමුත් සේවක මහත්වරු හතර දෙනයි ඉන්නේ. සේවක මහත්වරු දහ දෙනෙක් සේවයට ගත්තට වැඩ කරන්න එන්නේ හතර දෙනයි. මාස දෙකක් තිස්සේ මගේ කොට්ඨාශයේ වැඩට ආවේ හතර දෙනා බැගින්. ඒකත් පොඩි ගැටළුවක්. ඒ නිසා ඒකත් පොඩ්ඩක් බලන්න ඕන. නැත්නම් සේවකයෝ හතර දෙනෙක්ගෙන් වැඩ කරන්න බැහැ. ඊට පස්සේ තණකොල කපන මැෂින් පිළිබඳ ප්‍රශ්නය තියෙනවා. තණකොළ කපන මැෂින් හංගලා යනවද කියලා මම දන්නේ නැහැ. වැඩ කරන්න ආවට තණකොළ කපන මැෂින් නැහැ කියනවා. තණකොළ කපන්න එන්නේ උදැල්ලක් හරි විසිකැත්තක් හරි අරගෙන. උඩ දැල්ල කපලා යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මිල ගණන් කැඳවලා තියෙන්නේ තව තණකොළ කපන මැෂින් දෙකක් ගන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** මේ මොනවා ගත්තත්, මේවා නඩත්තු කරලා කරගෙන යන්න සේවක මහත්වරු ඉන්න ඕන. දවසක් කියනවා සේවක මහත්මයෙක් කලින් දවසේ වැඩ කරපු තැන ගෙදරක තණකොළ කපන මැෂින් ටික දාලා ආවේ අද ගෙදර වහලා තණකොළ කපන මැෂින් ගන්න විදියක් නැහැ කියලා. ඊට පස්සේ මම මොකක්ද දෙන උත්තරය. අන්තිමට මොනවා හරි කියලා බැන්නම මූණ බෙරිකරගෙන වැඩ කරන්නේ නැතුව අත අරිනවා. ඔබතුමාගේ යෝජනාවට මම එකඟ වෙනවා. ගන්නා වූ සේවකයාගෙන් බලාපොරොත්තු වෙන වැඩේ සාර්ථකව කරගන්න ඕන කියන මතයේ මම ඉන්නවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා මටත් පොඩ්ඩක් මේ සම්බන්ධව කතා කරන්න ඕන. පහුගිය දිනයක ඔබතුමාට මේ ගැන දුරකථන ඇමතුම් එන්නත් ඇති. මුලන ප්‍රදේශයේ ක්‍රීඩාපිටිය සුද්ධ කරන්න ගිහිල්ලා විශාල ගැටළුවක් වුණා. තේ දීපු මිනිස්සුන්ටත් බැණලා තිබුණා. වැඩ කරන නිසා තේ දීපු මිනිස්සුන්ට බැණලා කැවේ නැතෙයි, කන්න නැතෙයි වරුවෙන් යන්න ඉඳපු අය කියලා. අපි එතකොට අපහසුතාවයට පත් වෙනවා. ඉතිං මෙවැනි ප්‍රශ්න තියෙනවා. එතකොට ඒකට වගකියන්නේ කවුද, සභාපතිතුමාට කිවුවත් වැඩක් වෙන්නේ නැහැ එතනදී. ඒ ඉන්න සේවකයන්ගෙන් කාටද

කියන්න ඕන. ජ්‍යෙෂ්ඨයටද කියන්න ඕන, අළුත් එක්කෙනාටද කියන්න ඕන. අපිට වැඩ පරීක්ෂකවරයෙක් ඉන්නවා නම් ඒ ගැටළුවට වැඩ පරීක්ෂකවරයාව සම්බන්ධ කර ගන්න පුළුවන්. මේ යෝජනාව හොඳ යෝජනාවක්. ඒක අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒ කම්කරුවන්ට කියන්න දවල්ට කෑම අරගෙන එන්න කියලා. එයාලා දාන තර්කය තමයි අපිට දවල්ට කන්න විදියක් නැහැ ගෙදර යන්න ඕන කියලා කන්න. එහෙම රැකියාවට එන තත්ත්වයක් ඇති වෙලා තියෙනවා මේක තුල. මේක බොහොම පැහැදිළිව කියන්න ඕන. කවුරු තරහ වුණත් ප්‍රශ්නයක් නැහැ. වැඩ කරනවා නම් උදේට කෑම එක අරගෙන එන්න කියලා කියන්න. අපි සමහර වෙලාවට දුර තැන් වල ගිහින් මාස ගණන් රැකියාව කරලා එනවා. ඒ නිසා මේ අයට කරුණාකරලා කියන්න උදේට කාලා දවල්ට කෑම එක අරගෙන එන්න කියලා. හවස හතර වෙනකම් වැඩ කරලා යන්න කියන්න. ඔබතුමා ඒක පැහැදිළි කරලා කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමා මීට කලින් ඔය යෝජනාව ගෙනාවා. එදා ඒක කර ගන්න බැරි වුණා. අපි යම් කිසි නිර්ණායක ඉදිරිපත් කරපු නිසා ඔබතුමා මේක පස්සට ගත්තා. ඔබතුමා දැන් උත්සාහ කරාට වෙන්නේ නැහැ. ඔබතුමා බලාපොරොත්තු වෙන සේවක මහතාව බඳවා ගන්න. හැබැයි මේක කියන්න ඕන සභාවේදී. අපි එක මතයක ඉන්නවානේ. ප්‍රධාන දේශපාලන පක්ෂ වලට තදින් ක්‍රියාකාරී නැති කෙනෙක්ව බඳවා ගන්න. මොකද දන්නවානේ සේවක මහත්වරු කොහෙද, මොකද කරන්නේ කියලා. ඒක එකක්. අනිත් එක තමයි එයාට බලතල දෙන්න ඕන ලිඛිතව. ලිඛිතව දෙන කොට මේ නිර්ණායකයන්, මේ වෙලාවල් දෙන්න ඕන. උදේ අටයි තිහට වැඩ බිමට යන්න ඕන. දවල් දොළහේ ඉඳන් එක වෙනකම් කෑම පැය. කෑම කන්න යන්න පැය දෙකක් තුනක් දෙන්න බැහැ. එහෙම ගියාම හවස හතරයි තිහට, පහට එන්නේ. අපිටත් ඔය මඟ තොටේදී හම්බ වෙනවානේ. කාටවත් පක්ෂග්‍රාහී වෙලා කතා කරනවා නෙමෙයි මම. එතකොට වෙලාව දෙනවා අවසන් වැඩ බිමෙන් එන්න ඕන වෙලාව කියලා. එතකොට එයාට බලතල දෙන්න ඕන. ඔබතුමා මේ අයගෙන් වැඩ ගන්න ඕන. වැඩ කරන්න එකඟ නැත්නම් කරුණු වාර්තා කරන්න ඕන ඔබතුමාට. ඔබතුමාට තියෙන බලතල අනුව එහෙම අයව අයින් කරන්න ඕන. එහෙම අය හිටියොත් අනිත් අයගෙන් වැඩ ගන්න බැහැ. මේ නිර්ණායකයන් ටික නීති රීති මාලාවක් විදියට ලිඛිතව දෙන්න ඕන එයාට. පිටපත් ටික දෙන්න ඕන සේවක මහත්වරුන්ට. වෙන්නේ නැත්නම් ඊට පස්සේ ක්‍රියාත්මක වෙන්න ඕන. ඒ මනුස්සයා ආරක්ෂා වෙන්න ඕන. නීතියක් නැතුව කට වචනයෙන් කරන්න ගිහිල්ලා ඒ මනුස්සයා දැඩි අපහසුතාවයට පත් වෙනවා. ලලිත් මහත්තයා දැම්මට වැඩක් වුණේ නැහැ කිවුවනේ. ඒක මම පිළිගන්නවා. ඒක හරියට වෙන්නේ නැහැ කිවුවනේ. ඒ වෙන්නේ නැත්තේ ඒ කණ්ඩායමත් එක්ක එකට සිගරට් එක බොනවා නම්, එකට යම් කිසි දේවල් පාවිච්චි කරනවා නම් බෑ තමයි. ඔබතුමාගේ වැඩපිළිවෙලට අපි එකඟයි. හැබැයි අපක්ෂපාතිව වැඩ කරන්න පුළුවන් කොන්ද ඇති මිනිහෙක්ව ගන්න ඕන. දේශපාලනයට ක්‍රියාකාරීව, සෘජුව ඉන්න මිනිස්සුන්ව ගන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම අයව නම් හොයන්න බැහැ මේකෙදි. දේශපාලනය කරනවද, නැද්ද කියන එක හොයන්න අමාරුයි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒකෙන් තේරෙනවා ඒ අයගෙන් අනියමින් වැඩ ගන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය අර මොකක්ද එක හොයනවා වගේ තමයි. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

<u>**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ- 09.** ගිංතොට, වැලිව පොදු නාන තොටුපලට යන මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමටත්, පොදු නාන තොටුපල ආරක්ෂිත වැටක් සහිතව සංවර්ධනය කිරීමටත්, කාන්තාවන් සඳහා ඇඳුම් මාරු කිරීම සඳහා ආවරණ කුටියක් ඉදිකිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 10.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සේවක මහතුන්ගෙන් කලේගාන ප්‍රධාන කාර්යාලයේ සේවය කරන අය බෝපෙ කොටසේ සේවයේ යෙදවීමටත්, පෝද්දල උප කාර්යාලයේ සේවය කරන අය පෝද්දල කොටසේ සේවයේ යෙදවීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එතකොට මට මේක දැන ගන්න ඕන. කලේගාන ප්‍රදේශය කිවුවම බෝපෙ පෝද්දලනේ. බෝපෙ කිවුවම බෝපෙට අයිති වෙන්නේ වැලිපිටිමෝදර, වක්වැල්ල, හපුගල, කලේගාන, කිතුලම්පිටිය, කරාපිටිය කියන කොට්ඨාශ හය. මේක වෙන්න ඕන. මේ ගැටළුව ඇති වෙනවා. අපි දහ දෙනෙක් බෝපෙ කොටසට බඳවාගෙන ඉන්නවානේ. වැඩට එන්නේ හත් දෙනෙයි සාමාන්‍යයෙන්. පෝද්දල කම්කරු මහත්වරු කී දෙනෙක් ඉන්නවාද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දැන් කරන්න විදියක් නැහැනේ සුගත් මන්ත්‍රීතුමා. ප්‍රීමික්ස් ව්‍යාපෘතිය වෙනම උප කාර්යාලයෙන් යනවානේ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ප්‍රීමික්ස් දැන් හදන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** මම නම් දැක්කේ නැහැ පහුගිය දවස්වල ප්‍රීමික්ස් දිගටම කෙරෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් කෙරෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** අපිට ඇත්තෙම නැහැ ප්‍රීමික්ස්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවෙන් තීන්දුවක් ගත්තානේ කාගේවත් ඒවාට නෙමෙයි ඉස්සෙල්ලම කැඩිච්ච ටික හදනවා කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ඒකත් සභාපතිතුමා කෙරෙන්නේ නැහැනේ. අපේ පළාත්වල කෙරෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් ඉතිං මුකුත්ම කරලා නැහැ. ඉතිං මන්ත්‍රීතුමා මේක දෙකක්නේ. වතුර වලට කඩපුවා තමයි කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** මම මේ කියන්නේ මේ ප්‍රදේශයේ ඉන්න අයව යවනවා කපුහෙම්පලට. මෙහේ ඉඳන් එහේ වැඩට යන කොට උදේ දහය විතර වෙලා. ඉතිං පැය දෙකයි වැඩ කරන්න වෙන්නේ. ආපහු දවල් දොළහ වෙන කොට මේ පැත්තට කම්කරුවෝ ටික එන කොට වැඩ කරන්න වෙලාවක් හිටින්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ සිස්ටම් එක හදන්න තමයි වැඩ පරීක්ෂක කෙනෙක් ගන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** කොහොම වුණත් මම යෝජනාවක් විදියට ඒක ඉදිරිපත් කරේ. මේක කාර්යක්ෂමව වෙන්න ඕන. ඒක ක්‍රියාත්මක කරන්න වැඩපිළිවෙලක් ඇති කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මා හිතවත් මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න ඕන. අපි ඉතා අසීරුතාවයට පත්වෙනවා. මේ දොර ඇරලා දෙන්න අපිට ගමන් කිරීම සඳහා.

ඊළඟට මෙතුමා කමිටුවේ කතා කරා. මෙතුමා එදා ඔබතුමා පරක්කුයි කියලා නැගිටලා ගියා ඒ කමිටුව වෙලාවේදී.

**11.** කලේගාන, වී.සී පාරේ පදිංචි එම්.එච්. සුමතිපාල මහතාගේ නිවසට යන නව මාර්ගය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන හෝ කුලී පදනම මත ලබා ගත් එකස්කැවේටර් යන්ත්‍රයක් යොදාගෙන මාර්ගයේ පළල අඩි 06ක් වන පරිදි සංවර්ධනය කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** සුමතිපාල කියන මහත්මයා ලිපියක් එවලා තියෙනවා. ඒක ගරු සභාපතිතුමා ඔබතුමාලා, තාක්ෂණ නිලධාරීන් ගිහින් බලන්න. අඩි තුනක පාරක් තියෙනවා. ඒක දෙන්න බැහැ කිවුවම එතුමන්ලට විකල්ප මාර්ගයක් දෙන්නම් කිවුවා. ඒකෙදී පොලිස් ස්ථානාධිපතිතුමා ගෙනැල්ලා

ඒ පාරක් දෙන්න කියලා යොමුකරා. ඊට පස්සේ ඔබතුමත් ගියාට පස්සේ ඒ අවස්ථාව නොලැබුණා. නැවතත් මම පොලිස් ස්ථානාධිපතිතුමාට කතා කරා. කතා කරාම කිවුවා සභාපතිතුමත්, මන්ත්‍රී කණ්ඩායමත් රැස්කරලා ඒ පාර ඉල්ලගමු කියලා යෝජනාවක් කරා. මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ ඒ පාර ලබා ගැනීම සඳහා. ගරු සභාපතිතුමත්, ගරු මන්ත්‍රීවරුන්ටත් මම යෝජනා කරනවා ඒ පාර ගිහින් බලලා ඒකට සහයෝගය දෙන්න කියලා.

අවුරුදු නවයකට පස්සේ කාණුව ලබා ගැනීම සඳහා ඔබතුමන්ලා ලක්ෂ්මන් මහත්තයාට සහයෝගය දැක්වුවා. ඒක නෙමෙයි මම කියන්න යන්නේ. ගෙවල් හයක් අකමැති වෙච්ච නිසා තමයි මම ඒකට විරෝධතාවය දැක්වූවේ. කොහොම වුණත් ඉතින් මම සතුටු වෙනවා අවුරුදු නවයකට පස්සේ මගේ කාලසීමාවේදී ඒක කරන්න ලැබීම ගැන. විකල්ප ක්‍රමයක් යෝජනා කරලා වැඩ කරන්න හැදුවා. ඒකටත් බොහොම ස්තුතිවන්ත වෙමින් ඔබ සියලු දෙනාටම සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තිස්ස මන්ත්‍රීතුමා ඔබතුමාගේ යෝජනාවේ තියෙන්නේ ගෙවල් කිහිපයකට යන පොදු පාරක් සම්බන්ධවද, නැත්නම් අලුත් පාරක් සම්බන්ධවද

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** පොරොන්දු වුණානේ විකල්ප පාරක් දෙන්නම් කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පොදු පාරක්නේ ඒක.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඔව්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 12.** කිතුලම්පිටිය, උදාර පෙදෙස මාර්ගයේ පැති බැම්ම ඉදිකර, එම මාර්ගය සුදුසු පරිදි ප්‍රතිසංස්කරණය කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ යෝජනාව සඳහා ඇස්තමේන්තුවක් පමණයි මේ සභාවෙන් සකස්කරලා ඉල්ලන්නේ. ඒකට අවශ්‍ය සම්පූර්ණ මුදලම මා විසින් සොයාගෙන ඒ කාර්යය ඉටුකරනවා. ඇස්තමේන්තුවක් සකස් කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**<u>ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණියගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ- 13.** නාවින්න, වැලිගොඩවත්ත මාර්ගයේ පළල නොතකා අනවසර ඉදිකිරීම් කර ඇති බැවින් මාර්ගය මැන මායිම් සලකුණු කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද මේ

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** වැලිගොඩවත්ත.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර දූරියන්වත්ත පාර නේද, ඒකේ ප්ලෑන් එකක් තියෙනවද දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඒ පාර දිගටම මනින්න වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගැසට් කරපු පාරක් ඒක.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 14.** කපුහෙම්පල කොට්ඨාශයේ පලිවතුගොඩ ග්‍රාම සේවා වසමේ ග්‍රාම නිලධාරිතුමියට තම රාජකාරිය කරගෙන යාමට අවශ්‍ය කාර්යාලය සඳහා කපුහෙම්පල සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ඇති කාමර දෙකෙන් එකක් ලබා දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඔබතුමා මේ ගොඩනැගිල්ල බලන්න ගියපු වෙලාවේදීත් මම මේ යෝජනාව කරා. මේ ග්‍රාම නිලධාරිතුමිය දැන් ඉන්නේ පස්වෙනි තැන. එතුමිය එක තැනක මාස එක හමාරක් ඉන්නේ නැහැ. සමහර තැන්වල එතුමිය ඉන්නකොට ගමේ මිනිහෙකුට ඒ ඉන්න තැන කියන්න දන්නේ නැහැ. පලිවතුගොඩ වසමේ ඉන්නේ වැඩ බලන ග්‍රාම නිලධාරිතුමියක්. අඹගහවත්තේ ග්‍රාම නිලධාරිතුමියම තමයි පලිවතුගොඩ ග්‍රාම සේවා වසමේ වැඩ බලන්නේ. එතුමියට තේරෙන්නේ නැහැ එතුමිය ඉන්න තැන මිනිස්සුන්ට කියන්න. හරි ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ මේක දැන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කාගෙද වැරැද්ද. එතුමිය ඉන්න තැනවත් දන්නේ නැත්නම් ප්‍රශ්නයක්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එතුමියට ඇත්තටම ඒ ගැන තියෙන අවබෝධය නැතිකමනේ. මම කියන්නේ මේ කාමර දෙක ගැන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය එක්කත් කතා කරලා දෙන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය එක්ක කතා කරන්න දෙයක් නැහැ. ඒක ප්‍රාදේශීය සභාව යටතේනේ තියෙන්නේ. උප සභාපතිතුමා එක්ක සාකච්ඡා කරන්න ඕන.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** උප සභාපතිතුමා නම් හැබැයි මේකට විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හේතුවක් ඇතිනේ. එතුමා හිටියා නම් අපිට මේ වෙලාවේ කතා කරන්න තිබුණා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එදා මම කතා කරපු වෙලාවෙත් එතුමා ඒකට එකග වුණේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා ඉන්න වෙලාවක ඕක සාකච්ඡා කරලා බලමු.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා, ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 15.** ලබුදූව, අලුත් ගෙදරවත්ත නො. 80 නිවසේ පදිංචි ඒ.පී. ගුණපාල මහතාගේ නිවසේ ඉහළින් ඇති මාර්ගයේ නිසි කාණු පද්ධතියක් නොමැති බැවින් වැසි දිනවල මාර්ගයෙන් ගලා එන වැසි ජලය එතුමාගේ ඉඩම හරහා ගලායන බැවින් එම මාර්ගයේ වැටෙන ජලය නිසි කාණු පද්ධතියක් මගින් පහළට ගලා යන ලෙස සකස් කරන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා, ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේ කාණු පද්ධතිය සම්බන්ධව, මේ පාර සම්බන්ධව කියනකොට විශාල වතුර පාරක් එනවා. ඒ නිවස සම්පූර්ණයෙන්ම වගේ යටවෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක මට නම් තේරෙන්නේ නැහැ. මේක ගැන දිගින් දිගටම අපි කතා වුණා. දැන් අබේසේකර මන්ත්‍රීතුමා, අපි කතා කරේ උඩ මේවා එකක් දාලා කියලා. ඔබතුමා කියලා මම ගෙවීම් කරපු එක ගැනත් කතා කරේ. මේක දැන් එකින් එක වෙන වෙන විදියට එනවා. මිනිස්සුත් එක එක්කෙනාට කියනවා ගිහිල්ලා. මට ඕකට දැන් ඇත්තටම උත්තර දීලා එපා වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** දැන් ඕකේ ගැටලුව තියෙන්නේ කොතනද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගැටලුව කියන්නේ, ස්වාභාවිකව වතුර පාර ඇවිල්ලා තියෙන්නේ ඔය කියන අයගේ ඉඩමෙන්. ඒ අය අවුරුදු ගාණකට කලින් එකගතාවයකට ගිහින් තියෙනවා දසනායක ලේකම් මිස් ඉන්න කාලේ එතනින් වතුර බස්සවන්න දෙන්නම් කියලා. දැන් කාණු පද්ධතියත් ඒ අයගේ ඉඩමෙන් මේ අය හදලා තියෙන්නේ. ඒ ඉඩමේ කාණු පද්ධතියක් දැනටත් තියෙනවා. දීර්ඝකාලීනව තිබුණ ප්‍රශ්නයක්. නමුත් පාර කොන්ක්‍රීට් කරානේ අඩි තුනට. ඒ කොන්ක්‍රීට් කරනකොට ඒක වෙනස් වුණා. ස්වාභාවිකව එතනින් වතුර බැහැපු එක වෙනස් වෙලා එහා පැත්තේ මේජර් කෙනෙක්ගේ ගෙදර පැත්තට

වතුර ගියා. ඒපාර මේජර් කරේ එතනින් වැටියක් දැම්මා. පාර හරහා බම්පර් එකක් දැම්මා. දැන් ආයේමත් වතුර පාර යන්නේ අර ස්වාභාවිකව ගියපු තැනට. නමුත් ඒ බම්පර් එක දාපු එක වැරදියි මම දැනට වුණත් කියන්නේ. බම්පර් එක අපි ඉවත් කිරීමට කටයුතු කරනවා. ඔබතුමා ඒක ගිහිල්ලා බැලුවද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඔව්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන කාණුව හදලා තියෙනවානේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** දැන් අර බම්පර් එක නිසා මෙතුමාගේ කුස්සිය ගාවට තමයි වතුර පාර වැටෙන්නේ. විශාල වතුර පාරක් වැටෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කලින් තිබිලා තියෙන්නෙත් එහෙම තමයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හැබැයි ප්‍රශ්නයක් තියෙනවා. මේජර්ට කරදරයක් වුණේ නැහැ. දැන් කරදරයක් වෙලා තියෙනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අන්න ඒක තමයි. දෙපාර්ශවයටම කරදරයක් නොවන විදියට ඒක සකස් වෙන්න එපැයි. සභාව මැදිහත් වෙන්න ඕන එතනදිනේ.

(ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** සභාපතිතුමා, මේ ප්‍රශ්නය නැවත නැවත කතා කරන්න ඕන නැහැ. මේක ආයෙම මුලට තමයි එන්නේ. සභාවේදී මන්ත්‍රීවරු හතර පස් දෙනෙක් ලවා මේ ප්‍රශ්නය කතා කෙරෙව්වා. දැන් අපි සභාවට ගෙන්වලා ඒ අය කතා කරාම කියන්නේ ගෙදර මිදුල උඩින් කාණුව හදන්න දෙන්න බැහැ කියලා. ඔබතුමා ළඟදිත් එදා කිව්වා. ඒ යෝජනාවම, ඒ ප්‍රශ්නයම ආයෙම අනිල් මන්ත්‍රීතුමා හරහා ගේනවා. දැන් අනිල් මන්ත්‍රීතුමාගේ යෝජනාවේ තියෙන්නේ කාණු පද්ධතිය සකස්කරලා දෙන්න කියලා. එතකොට අපි සභාවට කැඳවලා කිව්වම කිව්වේ ගෙදර මිදුල උඩින් දාන්න දෙන්න බැහැ කියලා. ඔප්පුවල සඳහන්වෙලා නැහැ, ප්ලෑන්වල සඳහන්වෙලා නැහැ කිව්වා කාණුවක් තියෙනවා කියලා. මම නම් දන්නේ නැහැ මේ ප්‍රශ්නය කොහොම විසඳන්නද කියලා. මට එක දෙයක් කියනවා. සභාපතිතුමාට එක දෙයක් කියනවා. අබේසේකර මන්ත්‍රීතුමාට තව දෙයක් කියනවා. අනිල් මන්ත්‍රීතුමාට තව දෙයක් කියනවා. ගෙන්වලා තීන්දු තීරණ ගත්තට ඒ අය එකඟ වෙන්නේ නැහැ. ආයේ ආයේ තව කෙනෙක් ලවා සභාවට මේ ප්‍රශ්නය ගේනවා. විසඳුමක් නැහැ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** දෙපාර්ශවයටම කරදරයක් නොවන විදියට ක්‍රියාමාර්ගයක් ගන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** සභාපතිතුමා ගිහින් බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතනට ගියා. ඒක දීර්ඝ කාලයක ඉඳන් ස්වාභාවිකව ගලපු වතුර පාරක් කන්ද පල්ලම පැත්තට. ඒකට වෙනත් විකල්පයක් නැහැ. පාරේ පළල තියෙන්නේ අඩි තුනයි. කොන්ක්‍රීට් කරලා තියෙන්නේ අඩි තුනට. වතුර ටික උඩට යන්නේ නැහැ. කන්ද පැත්තට බහින්නේ නැහැ. වතුර බහින්නේ ඔතනින් තමයි.

එම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා තාක්ෂණ නිලධාරීට අවස්ථාව ලබාදීමට, එතුමා මේ ප්‍රශ්නයේදී දකින දේ ගැන සභාව දැනුවත් කිරීමට. මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි දිනුෂ රත්නප්‍රිය මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- ❖ මෙම ගැටලුව විශේෂ කොමසාරිස් පාලන කාලයේ සිට පැවති බවත්, ඒ සඳහා ප්‍රාදේශීය සභාවෙන් ලබා දිය හැකි විසඳුම පිළිබඳව අදාළ පාර්ශවය දැනුවත්කර ඇති බව.
- ❖ මේ වන විට අදාළ ස්ථානයේ කාණුවක් ඇති බවත් මෙම ගැටලුව නැවත නැවත මතුවන බව.
- ❖ අවට ඇති භාවිතයට ගන්නා ළිංවලට මෙම ගලාගෙන යන ජල පහර එක්වීම වැළැක්විය යුතු බව.
- ❖ අදාළ පාර්ශවය සමඟ සම්බන්ධීකරණය කර දෙනවා නම් මෙම ගැටලුව විසඳිය හැකි බව.
- ❖ මීට අමතරව මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව ඇති ගැටලු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා, ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 16.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව නිවෙස්වලින් ඉවතලන කුණු එකතු කර ගෙනැවිත් දැමීමට සුදුසු ඉඩමක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් වෙන් කරන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඇත්තටම ඉඩමක් නැද්ද එහෙම කුණු දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම තියෙනවා නම් ඉදිරිපත් කරන්න තැනක්. යෝජනා කරන්න. අපිත් බල බල ඉන්නවා අවුරුදු ගානක ඉඳගෙන.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සභා බල ප්‍රදේශයේ එහෙම ඉඩමක් සභාවට නැති නම් සභාවේ කුණු ප්‍රශ්නයට විසඳුම මොකක්ද. ඔබතුමාලාට දැන් කලින් දාපු තැනටත් කුණු දාන්න බැහැයි කියනවානේ. එතකොට කුණු ප්‍රශ්නයට උත්තරයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උත්තරයක් නැහැ. ඒක තමයි කිවුවේ. කොහේ හරි තැනක් හොයලා දෙන්න යෝජනා කරා වගේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** දැන් පෝද්දල කන්දේ පර්චස් හැත්තෑගානක් තියෙනවා කිවුවා නේද.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** කපුහෙම්පල නැද්ද කුණු දාන්න හොඳ ඉඩමක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මගේ යෝජනා පහෙන් දෙකක් ඔබතුමා දාලා තියෙනවා. ඒකට මගේ විරෝධතාවය මුලින් ආයේමත් ප්‍රකාශ කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යෝජනා දෙකක් දාපු එක ගැනද,

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දාලා තියෙන්නේ දෙකයි. තුනක් අයින් කරපු එක ගැන කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම හිතුවා මේ දෙක දාපු එක ගැන විරෝධතාවය ප්‍රකාශ කරනවා කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි මේ වැඩේ කතා කරමු.

**17.** මීපාවල අමරසූරිය විදුහල ඉදිරිපිට බස් නැවතුම අසළ රාත්‍රී කාලයේ අඳුර පැවතීම හේතුවෙන් බස් මගීන් දැඩි අපහසුතාවයට පත්වන අතර බස්රථ බලාපොරොත්තු වන කාන්තාවන් අවට වෙළඳසැල් ඉදිරිපිට රැඳී සිටීම හේතුවෙන් බස්රථය මග හැරීම නිසා අනවශ්‍ය කරදරවලට මුහුණපාන බැවින් බස් මගී ආවරණය අසළ විදුලි කණුව සඳහා විදුලි ආලෝක පහනක් සවි කිරීමට කටයුතු කරන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** මගෙන් එකක් දාලා දෙන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ ලේසියෙන්ම විසඳන්න පුළුවන් ප්‍රශ්නනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතන ඒ අවට ඇත්තටම අඳුරුයි. ඒ බස් නැවතුම්පොළ තියෙන තැන අඳුරුයි. ඒ නිසා ඇඳිරි වැටෙනකොට ළමයින්ට, කාන්තාවන්ට ප්‍රශ්නයක් තියෙනවා. ඒ තැන තියෙන ලයිට් කණුවට විදුලි පහණක් සවි කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ- 18.** ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන වගකීමක් වන ප්‍රදේශයේ කැලි කසළ ප්‍රශ්නය විසඳීම සඳහා කසළ අංගනයක් ඉදිකිරීම සඳහා සුදුසු භූමියක් වෙන්කරවා ගැනීමට මැදිහත්වීමත්, ඒ තුළ කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන් ක්‍රියාවට නැගීමටත් වහාම සැලසුම් සකස් කිරීමට කටයුතු කරන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක මෙතන කතා කරපු කුණු ප්‍රශ්නයට අදාළයි. මේ ප්‍රශ්නය ඔබතුමා කලින් කතා කරා. දැන් කුණු දාන්න තැනක් නැති ප්‍රශ්නය ඉස්සරහට එනවා කියලා කිවුවා. දැන් අපි ඇත්තටම යෝජනා කරලා මැදිහත් වෙච්ච සිට්‍රස් වත්තේ ඉඩමේ ඉතුරු කොටස ගන්න විදියක් ඇත්තෙම නැද්ද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉස්සෙල්ලා අපි බලන්නේ මේ පර්චස් අසූව අරගෙන මේ වැඩේ ඉවර කර ගන්න. ඔක්කොම පටලවා ගත්තොත් කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මේ කාරණය සම්බන්ධව සද්භාවයෙන් කතා කරන්නේ. හේතුව වෙන මුකුත් නෙමෙයි. දැන් අපිට ඉස්සෙල්ලා ප්‍රශ්නය තිබුණේ ආණ්ඩුව එක පැත්තක, සභාව තව පැත්තක. ඒ නිසා ප්‍රශ්නයක් තිබුණා. දැන් මේ වෙලාවේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා මේ ආසනයේ ඔබතුමන්ලාගේ ආසන සංවිධායකවරයා. සමහර ප්‍රශ්න එතුමාට යවන්න බැහැ පුද්ගලිකව සාකච්ඡා කරන්න ඕන කියලා කිවුවානේ. ඒ මට්ටමේ හරි කරන්න කමක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි. නමුත් කාරණා දෙක තුනම එකට පටලවා ගත්තම කරන්න බැහැ. දැනට පර්චස් අසූවක් ගන්න වත්ත එක්ක එකඟ වෙලා ඒ වැඩේ කරගෙන යනවා. දැන් ඒක ඉවර වුණාට පස්සේ තමයි ඊළඟ අදියරට යන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අක්කර පහක් ගන්නනේ කතා කරේ. අක්කර පහක වපසරියක් ගන්නනේ කතා කරේ. ඇයි ඒක පර්චස් අසූවකට බහින්න තරම් සීමා වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වත්තෙන් එකඟතාවය ආවා රමේෂ් පතිරණ මැතිතුමා ඇමතිතුමා වෙන්න කලින්. එතුමා මන්ත්‍රීධූරයේ ඉන්න කොට එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව තියෙන කොට වත්ත එකඟතාවයකට ආවා පර්චස් අසූවක් දෙන්න මෙතුමා කතා කරාම. දැන් ඒ එකඟතාවයෙන් තමයි මේ පර්චස් අසූව ලැබෙන්නේ. ඉස්සෙල්ලා ඒ ප්‍රශ්නය ඉවර කර ගන්න එපැයි. ඉස්සෙල්ලා මූලික ප්‍රශ්නය ඉවර කර ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතුමා ගරු මන්ත්‍රීවරයෙක් විදියට පාර්ලිමේන්තුව නියෝජනය කරමින් විරුද්ධ පක්ෂයේ ඉන්න කොට තමයි ඒ හැකියාව තිබුණේ. එතුමා දැන් අදාළ විෂයභාර අමාත්‍යවරයා. එතකොට නෛතික බලයකුත් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි. අපි බලන්නේ ඒ පොරොන්දු වෙච්ච එක ඉවර කර ගන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ යෝජනාව ස්ථිර කරලා තියමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ස්ථිර කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ යෝජනාවත් එක්කම මේක එකවර කර ගන්න පුළුවන් වෙයි. ප්‍රමාණය වැඩි කර ගන්න විතරයිනේ තියෙන්නේ. එකම තැන. එකම කාර්යය. එකම විෂය. මම කියන්නේ ඔබතුමා විෂයභාර ඇමතිතුමා එක්ක කතා කරලා බලන්න. ඉඩම ගන්න මැදිහත් වෙලා තියෙන වෙලාවේ ඒ එක්කම කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ යෝජනාව කලින් කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඒකට මේකත් එකතු කරලා තියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ නිසා ඔබතුමා මේකට මැදිහත් වෙන්න. මේ දෙකම එකම කාර්යයනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ වෙලාවේ කරන්න ගියොත් කෙරෙන්නේ නැහැ. ඔය දෙන්න හැදුවේත් සුසාන භූමියේ කොටස. එතන සොහොන් කොත් තිබුණා. ඒ පාර තමයි යන්තම් එහා පැත්තේ ඉඩම් කෑල්ලක් ඉල්ලගත්තේ.

මෙහෙම බැරිද, සාමාන්‍යයෙන් වගුරු සහිත වගේ ඉඩමක්, ජනශුන්‍ය ප්‍රදේශයක අක්කර දෙකක විතර ඉඩමක් හොයලා දෙන්න බැරිද මුදලට ගන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අක්කර දෙකක්වත් ඕන තමයි ඇත්තටම. අපි ඒකට උත්සාහයක් දරමු විකල්පයක් හැටියට. මම කියන්නේ මේකටත් ඔබතුමා මැදිහත් වෙන්න. ඒකට තමයි මේක යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා එක යෝජනාවයි කෙටියෙන් කරන්න තියෙන්නේ. ඉස්සෙල්ලා වචනයක් කියන්න ඕන අතීතය මතක් වෙච්ච නිසා. සභාවට ආපු අලුත ඔය ආදාහනාගාරය ගැන කතා කරද්දි අබේසේකර මන්ත්‍රීතුමා පුන පුනා කිව්වා අක්කර පහක් සිට්ට්‍රස් වත්තෙන් වෙන් කරලා තියෙනවා කියලා. මම දන්නේ නැහැ එතුමාට දැන් මේක අමතක වෙලාද කියලා. අක්කර පහක් තියෙනවා නම් ඒක අරන් දෙන්න කියලා මම එතුමාගෙන් ඉල්ලීම කරනවා. ඔබතුමා තමයි මට විරුද්ධ වෙලා උද්ඝෝෂණ කරමු කිවුවේ. සිට්ට්‍රස් වත්තේ කරමු කිවුවා. සිට්ට්‍රස් වත්තෙන් අක්කර පහක් වෙන් කරලා තියෙනවා කිවුවා. ඔබතුමා ඒ වෙන් කරපු අක්කර පහ කොහේද තියෙන්නේ කියලා කිවුවොත් මට වටිනවා.

අනිත් එක තමයි ඉන්දික විජේවික්‍රම මන්ත්‍රීතුමා යෝජනාවක් දාලා තියෙනවා මීපාවල විද්‍යාලය ඉදිරිපිට කණුවට වීදි ලාම්පුවක් සවි කරන්න කියලා. නිතර හම්බ වෙනවා මට. ඕක කිවුවා නම් දාලා දෙන එක පුංචි දෙයක්. මම ලයිට් 150 ක් හයි කරලා තියෙනවා කොට්ඨාශයේ. ඇත්තටම ඒකට කාගෙන්වත් චෝදනාවක් ආවේ නැහැ. ඔය ගැන යෝජනාවක් විදියට ගෙනල්ලා හරි මාව දැනුවත් කරපු එකට දෙවැනි වරටත් ස්තුතිය මම පුද කරනවා.

තුන්වෙනි එක තමයි මේක නැවත නැවත පුන පුනා කිවයුතු නැහැ. මට යම්කිසි ආකාරයක හිතට වේදනාවක් ඇති නිසා මම අදහසක් ප්‍රකාශ කරනවා. එතුමා ප්‍රකාශ කරා මේ ගංවතුර පිළිබඳව. සමාජයේ වෙන විපර්යාස පිළිබඳව ජනතාව පත් කරලා එවන මන්ත්‍රීවරු මේකට කතා කරන්න ඕන කියලා කිවුවා. ජනතාව පත් කරලා එවපු මන්ත්‍රීවරු එකොළොස් දෙනෙක් තමයි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ඉන්නේ. ඔබතුමා ඒක කියපු නිසා මම කියන්නේ. ඒ නිසා ඒ ජනතාව පත් කරලා එවපු එකොළොස් දෙනා ගැන වචනයක් කියන්න එපා. ඒක ඔබතුමා තේරුම් අරගෙන කරන්න කියන ඉල්ලීම කරනවා.

**19.** මීපාවල තැපැල් කන්තෝරුව ඉදිරිපිටින් ඇති මාර්ගයේ ජලය රැඳී පවතින ස්ථානය, ජලය එක්රැස් වීම වළකන ආකාරයට අලුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** මේ මාර්ගයේ එක තැනක වතුර රැඳිලා තියෙනවා. අන්න එතනට කොන්ක්‍රීට් ටිකක් දාලා වතුර රඳා පවතින එක හදලා දෙන්න විතරක් යෝජනා කරනවා. වෙන මුකුත් අවශ්‍ය නැහැ. සභාවක් විදියට ඔබතුමත් ඒක දැක්කා. රමේෂ් පතිරණ ඇමතිතුමත් ඒක දැක්කා. ඒක හදලා දෙන්න කියලා සියලු ගම්වාසීනුත් ඉල්ලා සිටියා. මේ මන්ත්‍රීවරියත් ඒක දැක්කා. ඒකට ලොකුවට වියදම් කරන්න දෙයක් නැහැ. ඒ පාර කම්කරුවන් යොදවලා වතුර රැඳී සිටීම විතරක් නවත්වලා දෙන්න කියන ඉල්ලීම කරනවා. මේක හැබැයි මම ගෙනාවට පස්සේ තව තර්ක ගේන්න පුළුවන් තව මන්ත්‍රීවරු. මේකට කාණුවක් හදන්න හැදුවා අඩි හතරක් ඉඩමකින් අරගෙන. ඒක නවත්වපු එක කියයි මේකට හේතුව කියලා. නමුත් ඒක නෙමෙයි හේතුව. තාක්ෂණ නිලධාරිතුමා ඉන්නවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ. මේ පාර හදන එක වැළැක්වූයේ ඇයිද කියලා හොයන්න කියලා මම ඔබතුමාට කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොන්ක්‍රීට් දැම්මම තියේවි. තාක්ෂණ නිලධාරිතුමාගේ අධීක්ෂණය යටතේ ඒකට අවශ්‍ය දේ කරන්න. ඒක සෘජු ශ්‍රමික පදනම යටතේ වැඩ ටික කරන්න. එදා මම යනකොටත් යන්න බැහැ. ලැජ්ජයි ඇත්ත කතාව. වතුර අඟල් හයක් විතර පිරිලා පාර මැද. අයින දිගේ ගියේ. යන්තම් තාප්පයේ දාරය දිගේ ගියා. ඒක ඔබතුමා බලලා සෘජු ශ්‍රමික පදනම යටතේ ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගන්න.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** චමින්ද මන්ත්‍රීතුමා මම ඔබතුමාට පාරේ කතාව කිවුවේ නැහැ. ඔබතුමාට එදා කිවුවේ කිසි ප්‍රශ්නයක් නැහැ කියලා. මේක අරගෙන කවුද ඉස්සෙල්ලා යෝජනා කරේ කියලා මට අදාළ නැහැ. මට ඕක ඉස්සෙල්ලා යෝජනා කරත් එකයි, ඔබතුමා කරත් එකයි. කවුරුහරි දැන් ඒක කරන එක අතිවිශිෂ්ටයි. වටිනවා. මේක ගැන හොඳටම අහගන්න ඕන. මේක ගැන ගරු සභාපතිතුමාට

අහගන්න පුළුවන්, ඒ පැත්තේ ඉන්න මන්ත්‍රීවරුන්ට ගිහිල්ලා ඇහුම්කන් දෙන්න පුළුවන්. මේකට ඉතාම පැහැදිළිව මැදිහත් වුණේ ජයතිලක මහත්තයා. අහන්න ජයතිලක මහත්තයාගෙන් ගිහිල්ලා. ඊළඟ සභාවේදී අපි ඒක ගැන කතා කරමු. එහෙම දෙයක් වුණාද, ඒක ප්‍රාදේශීය සංවර්ධන කමිටුවටත් ගිහිල්ලා ඒකේ වැඩේ කොටසක් කෙරීගෙන යනකොට තමයි එදා ඒක නැවතුණේ. ඇයි එදා ඒක නැවතුණේ. ඒක නැවතුණ හේතුවක් තිබුණා. ඒ කියන්නේ අපේ දේශපාලන අධිකාරියේ මැදිහත්වීමේ අඩුව තිබුණා. දේශපාලන අධිකාරිය හරියට මැදිහත් වෙනවා නම් හරි. ඒකටත් ඉතින් හේතු තිබුණා. ඒකේ වත්තේ ඉන්න අය එහෙම වුණා. මේක පිළිබඳව විමසන්න. ඔබතුමන්ලාගේ පක්ෂයේ බොහොම හිතවත්, හොඳ මහත්මයෙක් එතුමා මොන පක්ෂයේ හිටියත්. ජයතිලක මහත්මයාගෙන් ඇහුවම විස්තර දැන ගන්න පුළුවන්. මම නෙමෙයි දැන් එපැයි කියන්නේ. ඒ යෝජනාව ඔබතුමන්ලා කරලා ඒක කරන්න. ඒකේ වටිනාකමක් තියෙනවා. හැබැයි ඇත්තටම මේකයි, ඒකයි කලවම්වීමක් නැහැ. මේ වෙලාව තමයි වෙලාව. යකඩය රත් වෙලා තියෙනවා. තලා ගන්න පුළුවන්. ඇමතිතුමත් ඉන්නවා. හෙට අනිද්දාටත් ඒ ඇමතිතුමාම ඒවිනේ. එතකොට ප්‍රශ්නයකුත් නැහැනේ. ඒක හින්දා මේ වැඩේ කරන්න. ඒක වටිනවා. ඒක තමයි හොඳම තැන. කවුද කරේ කියන එක ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**<u>ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණියගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ- 20.** කුරුන්ද කන්ද, රක්ෂිතය අසලින් ඇති මාර්ගය ඉතා පටුවී ඇති බැවින් සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන මාර්ගය පළල් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** සභාපතිතුමා ඒක ගැන මට පැහැදිළි කිරීමක් කරන්න අවශ්‍යයි සියලුම මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස. කුරුන්දකන්දේ ඒ රක්ෂිතය ආශ්‍රිත පාරේ ත්‍රීවිල් එකක්, කාර් එකක් වගේ දෙයක් යනවා නම් බයිසිකලයක්වත් යන්න බැහැ. පයින් ගමන් කරන කෙනෙකුටවත් යන්න බැහැ. මලගෙයක් වුණ වෙලාවක අපිට ඇත්තටම වතුර බවුසරයක් ගෙනියන එකත් ප්‍රශ්නයක් වුණා. වතුර ප්‍රශ්නය කුරුන්දට තියෙනවා. ඒ වගේ කිසිම දෙයක් කර ගන්න බැරි තත්ත්වයක් ඒ පාරෙන් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය පාර කවුරුත් දන්නවා. සමරනායකලගේ ගෙවල් පාර.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** මෝටර් බයිසිකලයක් ඉස්සරහට ආවොත් මීටර් පන්සීයක් විතර රිවස් කරන්න ඕන එන හැම වාහනයක්ම තව කෙනෙකුට ඉඩ දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ එක පැත්තක කණ්ඩියක් තියෙනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගල් වැටක් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනෙක් පැත්තේ රක්ෂිතයේ ගල් වැට දිගට තියෙන්නේ. ඒ පැත්තෙන් ඉඩ ගන්න පුළුවන් රජයේ ඉඩමක් නිසා. ඒ යෝජනාව ඇත්තටම හොඳ යෝජනාවක් විදියට මමත් දකිනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** සභාව හරහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට හරි, අදාළ ආයතන වලට හරි ඉල්ලීමක් කරලා අවසර ලබා ගන්නවා නම් ඒක ලොකු වැඩක් වේවි. ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඒකට අවසර ඉල්ලලා ලිපියක් යවන්න ලේස්ති කරන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, කණගාටුවෙන් වුණත් කියන්න ඕන මේ කාරණාව. මේක මම කලින් දාපු යෝජනාවක්. දැන් අවුරුද්දකටත් වැඩියි. හැබැයි මම අද මේක

යෝජනා කරන්න මගේ නමින් දැම්මේ නැහැ. මම ලිඛිත ඉල්ලීමක් කරා ඔබතුමාට. මේකට මොකක්ද වුණේ, ඇයි මේක වෙලා නැත්තේ කියන ගැටලුව ගැන හොයන්න. මම යෝජනාවක් දැම්මේ නැහැ. මගේ නමින් මේ යෝජනාව න්‍යාය පත්‍රයට එන්න බැහැ. මම මේ විදියට නෙමෙයි මේ යෝජනාව දානවා නම් දාන්නේ. ඒක නිසා මම මේ යෝජනාව දැම්මේ නැහැ. හැබැයි ලිඛිත ඉල්ලීමක් කරලා ඇති මේකට මොකක්ද කරන්න ඕන කියලා. වැඩේ වුණේ නැති නිසා, ක්‍රියාමාර්ගයක් ගත්තේ නැති නිසා. දිගින් දිගට මේක සභාවේ කතා කරලා තියෙනවා නඩු දැම්මේ නැහැ කියන කාරණාව ගැන. තවදුරටත් මේක අලුත් යෝජනාවක් විදියට එකතු කරන්න අවශ්‍යතාවයක් නැහැ. ඉතිං මේක මගේ නමින් තියෙන නිසා මම මේක ඉල්ලා අස්කර ගන්නවා. මම දැම්ම විදියටනේ දාලා තියෙන්නේ. මම මෙහෙම යෝජනාවක් දුන්නේ නැහැ. මම ලිඛිත ඉල්ලීමක් කරා ඔබතුමාට. සමහර විට ඒ ලිඛිත ඉල්ලීම යෝජනාවක් විදියට ගියා වෙන්න පුළුවන්. මම යෝජනාවක් නෙමෙයි දුන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම තමයි වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාවේ න්‍යාය පත්‍රයට එන්න ඕන නැති යෝජනාවක් මේක. මම මේක කලින් යෝජනා කරපු එකක් නේ. දිගින් දිගට අවුරුද්දක් තිස්සේ මේක ගැන කතා කරා. කතා කරපු නිසා ආයේ මම මේකට යෝජනාවක් දාන්න අවශ්‍ය නැහැ. මම ලිඛිතව දුන්නා පරීක්ෂණයක් කරලා මොකක්ද වුණේ කියන කාරණාව බලන්න. මේක සභාවට යෝජනාවක් විදියට අරගෙන කතා කරන්න ඕන කාරණාවක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාවක් මම යෝජනා කරනවා මේ සම්බන්ධව තාක්ෂණ නිලධාරිතුමාට සභාව දැනුවත් කිරීම සඳහා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>කාරක සභා අවස්ථාව</u>**

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි දිනූෂ රත්නප්‍රිය මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- ❖ මෙම ගැටළුව සම්බන්ධව ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් පරීක්ෂණ වාර්තාවක් ඉල්ලා ඇති බවත්, ඉදිරියේදී එම පරීක්ෂණ වාර්තාව සභාවට ලැබීමට සකස්වන බව.
- ❖ මෙම ගැටළුවේදී පාර්ශව දෙකකට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගත යුතු බව.
- ❖ මීට අමතරව මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**<u>(ඊ) කාරක සභාවල වාර්තා ඃ-</u>**

## <u>01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-07-06 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට ඇත්තටම පහුගිය ටිකේ කමිටු රැස්වීම් වලට එන්න වුණේ නැහැ. ඒ විරෝධයක් හරි මොකක් හරි නිසා නෙමෙයි. මට යෙදිච්ච වැඩත් එක්ක එන්න බැරි වුණේ. මීන් ඉස්සරහට අනිවාර්යයෙන්ම එනවා එහෙම විශේෂ දෙයක් නොවුණොත්. මේකේ ගෙවීම් වලදී මම ඔබතුමාට ඉස්සෙල්ලා දෙයක් කියලා තියෙනවා. මේ ගෙවීම් කරලා නැහැනේ තාම. පළවෙනි ඉල්ලීම තමයි සභාවට දාලා මිසක් කමිටුවේ තීන්දු ගත්තට ගෙවන්න එපා. එහෙම ගෙවන්නේ නැහැනේ. එහෙම ගෙවන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි ගෙවන්න බැරි. මුදල් කමිටුවට බලය පවරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කවුද පවරලා තියෙන්නේ. කවුරුවත් පවරලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මහා සභාවෙන් පවරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නැහැ. මහා සභාවෙන් මුදල් කමිටුවට බලය පවරලා ඇත්තේ නැහැ. ගෙවීමක් කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මුදල් කමිටුවේ තීරණ මහා සභාවේ අනුමත වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අනිත් පැත්තට තියෙන කතාවක් කියන්න එපා සභාපතිතුමා වැඩක් නැතුව මේ අවසාන මොහොතේ. මේ ප්‍රශ්නය මීට ඉස්සෙල්ලා ආවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ මුදල් කමිටුවක් තියන්නේ ඇයි. මුදල් කමිටුවේ ගන්න තීරණ, නිර්දේශ මහා සභාවට දාන්න ඕන එක හරි. නමුත් මුදල් කමිටුවේ අනුමත වුණාම මහා සභාවේදී අනුමත වෙයි කියලා හිතලා ගෙවීම් කරනවා. එහෙම නම් මුදල් කමිටුවක් තියන්න ඕන නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මම මේක ඔබතුමාට පැහැදිලි කරන්නම්කෝ. මේ ප්‍රශ්නය මීට ඉස්සෙල්ලා ඇවිල්ලා සාකච්ඡා වුණා. දැන් එහෙම නම් සභාවෙන් වැඩක් නැහැ කමිටුව තිබුණම ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං සභාවට දානවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාවට දාන්න ඕන ගෙවලා නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් ඉතිං කමිටු තියන්න ඕන නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කැබිනට් තීන්දුවක් සම්මත වෙන්නේ කොහොමද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් මේ ඔක්කොම සභාවට දාලා තීන්දු ගන්න පුළුවන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාව විරුද්ධ වුණොත් මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** වැඩක් නැහැනේ. දිනනවනේ ඉතිං.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බලය පවරලා තියෙනවා කමිටුවට. එහෙම නම් කමිටුවක් ඇයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කමිටුවට තියෙන්නේ බොහොම පැහැදිළිව එකින් එක බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවෙන්නේ කමිටුව පත් කරන්නේ. එහෙම නම් කමිටුවක් ඇයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ගන්නකෝ පොඩ්ඩක්. හැබැයි උපදෙස් නොගැනීමේ වැරැද්ද අපිට නෙමෙයි එන්නේ. ඒක ගැන මීට ඉස්සර වෙලා සාකච්ඡා කරලා තියෙනවා. සාකච්ඡා කරපු එක තමයි ඔබතුමන්ලා බැකෝ එකට ගෙවීමක් කරා රුපියල් අනූ එක්දහස් ගාණක. නමුත් එකක් තියෙනවා. එහෙම ගෙවීමක් කරන්න පුළුවන් කමක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තේරුම් ගන්න ඕන. සියලු මන්ත්‍රීවරු පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. මම කියන්නේ මෙහෙමයි. සියලුදෙනා දැන ගන්න ඕන. මුදල් කමිටුව පත් කරන්නේ සභාවෙන්. සභාවේ එකඟතාවය මත තමයි මුදල් කමිටුව පත් කරන්නේ. ඒ නිසා මුදල් කමිටුව අනුමත කරන එකක් සභාව වෙනකම් ගෙවන්න බැහැ කියලා නැහැ. මම අහන්නේ එතකොට මුදල් කමිටුවක් තියන්නේ ඇයි. එතකොට මොකක් හරි දෙයක් කරනවා නම් මාසයක් ඉන්න ඕන ගෙවීම් කරන්න. දැන් මේ මාසයේ සභාවට දාන්න බැරි වුණොත් ලබන මාසයේ සභාවට දාන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මාසයක් ඉන්න ඕන නැහැනේ. දැන් මුදල් කමිටුව තිබුණේ කවදද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හය වෙනිදා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අද විසිඑක් වෙනිදා. මාසයක් තිබුණේ නැහැනේ. කොහෙද මාසයක් වුණේ. ගණන් හදලා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ ගිය සභාවේ ඉඳන්. ඉතිං බලන්න ඕන ගිය සභාවේ ඉඳගෙන. දැන් මේ කියන විදියට මුදල් කමිටු තියලා වැඩක් නැහැ. සභාවට දාලා ඔක්කොම අනුමත කර ගත්තම ඉවරයිනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඔබතුමාට කියන්නේ මේක ගැන තර්කය යන්න ඕන. මම මේක මීට ඉස්සර වෙලා ගෙනල්ලා තියෙනවා. ඒ තමයි අර බැකෝ එකට ගෙවීම පිළිබඳව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා. මුදල් කමිටු තීන්දුව අනුව ගෙවීම් කරනවා. ගෙවීම් කරලා සභාවට දානවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා මම කියන දේට ඇහුම්කන් දීලා පස්සේ උත්තර දෙන්න. මම මේක බොහොම පැහැදිළිව ගෙනාවා මීට ඉස්සර වෙලා බැකෝ එකේ සිද්ධිය සම්බන්ධයෙන්. එතකොට අනිත් එක එකක් තියෙනවා මේ ගෙවීම් වලදී මම විරෝධය පාපු දේවල් තියෙනවා මේ සභාව ඇතුලෙම. මොකද හේතුව මේ කරපු කර්මාන්ත තුනක් තියෙනවා. ඒ කර්මාන්ත තුනම බංගලාවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය අත්සන් කරලා තියෙන්නේ. ඒ අය මේක ප්‍රතික්ෂේප කරලා ලියුමක් දීලා තියෙනවා ඉස්සෙල්ලා. ඒක දීලා තියෙද්දි නැවත ඒක කරලා තියෙනවා. ඒ ගැන අපි ළඟ තියෙනවා විස්තර. ඒකයි මම කිවුවේ. මේ මොනවා වුණත් මම ඉල්ලා සිටිනවා. මේක ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. මේ තත්ත්වය සම්පූර්ණයෙන්ම පැහැදිළි කරමින් උපදෙස් ගන්න. මේක නැත්නම් දිගින් දිගට යනවා. මම කියනවා මේක වැරදියි කියලා. ඒ නිසා උපදෙස් ගන්න පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාවයි, මුදල් කමිටුවයි කොහොමද ගනුදෙනු කරන්නේ කියලා අහන්න. ඒක ගැන අපිව දැනුවත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟ සභාව වෙන කොට ඒක ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක අපි සභාවක් විදියට යන්න ඕන. මුදල් කමිටුවක් තියෙන්නේ තීන්දු තීරණ ගන්න. මුදල් කමිටුවට බලය දීලා තියෙනවා මහා සභාවෙන්. අපි මුදල් කමිටුවෙන් පස්සේ ගෙවීම් කරනවා. ඒ ගෙවීම් කරන්නේ මේ මහා සභාවේ එකඟතාවය ඇතියි කියලා හිතලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මුදල් කමිටුවට වියදම් කරන්න බලය දීලා තියෙනවා කියලා කොහෙද තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයේ සභාවෙන් බලය පවරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාව බලය පැවරුවේ නැහැ. ලක්ෂ දෙකකට ගෙනාවා. පනස් දාහයි ගෙවන්න පුළුවන්කම තිබුණේ. අනූඑක්දාහ ගෙවුවේ එවෙලේ. සභාපතිතුමා මේකට අපි කාලය මිඩංගු කරන එකේ තේරුමක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාලය මිඩංගු කරන්න ඕන. ප්‍රධාන කාරණාවක් නේ. මේ යන විදියට මාසයක් යනකම් මුකුත්ම කරන්න බැහැනේ. එහෙම නම් මුදල් කමිටු ඕන නැහැනේ. එහෙම නම් කමිටුව නොකර ඉමු. කමිටු මොකටද එහෙම නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ තත්ත්වය පැහැදිළි කර ගන්න කොමසාරිස්තුමාගෙන්. එතකොට ඉවරයිනේ. මේකේ ඉල්ලන්නේ බොහො පැහැදිළි දෙයක්නේ. කොමසාරිස්තුමාට කිවුවහම පැහැදිළි කරලා දේවී. හැබැයි ඒ යවන ලියුමේ පිටපතක් අපිටත් එවන්න. මේ පැහැදිළි කරලා යවන්න කියන ලිපියේ පිටපතක් අපිටත් එවන්න. මේකේ එහෙම නම් කැබිනට් එක විතරක් තිබුණම ඇති. කැබිනට් එකේ තීන්දු ගත්තම පාර්ලිමේන්තුවට දාලා අනුමත කර ගන්න ඕන. ඔබතුමා ඒ යවන ලිපියේ පිටපතක් අපිටත් එවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද යවන ලිපිය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** උපදෙස් ඉල්ලලා යවන ලිපිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලියුමක් යවන්න ඕන නැහැ. මොකටද ලියුමක් යවන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇයි සභාපතිතුමා ඔච්චර දඩබ්බර වෙන්නේ. ඔබතුමාලා ගනිපු තීන්දු හරි නම් ඇයි ඒ ලියුම යවන්න බැරි උපදෙස් ඉල්ලලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි උපදෙස් ගන්න ඕනද,

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දන්නේ නැති හින්දානේ ගන්නේ. දැනුමේ තේරුමේ තරමින් මේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ දැනුමේ හැටියට හරි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකට උපදෙස් ගන්න ඕන නැද්ද, අපිට නොතේරෙන දෙයක් ආවම අපි උපදෙස් ගන්න ඕන. අපේ සුපිරියර් විදියට ඉන්නේ කොමසාරිස්තුමා. දැන් මේ යවන්න කියලා කිව්වේ බොහොම සාධාරණ දෙයක් නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** උපදෙස් ගත්තා නම් ඉවරයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උපදෙස් ගන්න එකයි, ලිඛිතව යවන එකයි දෙකක් සුගත් මන්ත්‍රීතුමා. උපදෙස් ගන්න ඕන ඒවාට මම උපදෙස් ගන්නවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ ප්‍රශ්නයට මොකක්ද කරන්න ඕන කියලා උපදෙස් ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ ප්‍රශ්නය අද ඊයේ ආපු එකක් නෙමෙයි. මුළු ප්‍රාදේශීය සභා ඉතිහාසයේම වෙච්ච දෙයක්.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා දුරකථනයෙන් උපදෙස් ගන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දුරකථනයෙන් ඕන නැහැ ලිඛිතව ගන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක තමයි එතකොට විසඳුමක් දේවී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි සුගත් මන්ත්‍රීතුමා මේ හදන්නේ වෙන එකකට නෙමෙයි. ඉන්දික මන්ත්‍රීතුමා ඉස්සෙල්ලා ආවා වෙන පැත්තකින්. දැන් මේ එන්නේ තවත් පැත්තකින්. මේ එන්නේ සභාවේ වැඩ කටයුතු ටික කඩාකප්පල් කරන්න. උපක්‍රමශීලිව කරන්න හදන්නේ ඒක. මම අහන්නේ මෙච්චරයි. ගෙවීම් කරන්නේ නැහැ. සභාවට දාලා නමුත් අපි අනුමත කර ගන්නවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම විරුද්ධ වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් විරුද්ධ වෙන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම විරුද්ධ වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි විරුද්ධ වෙන්නකෝ. සභාවට දාලා අපි අනුමත කර ගන්නවානේ. අනුමත කර ගන්නවා නම් ප්‍රශ්නයක් නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම විරුද්ධයි. ඔය ගොල්ලෝ ඔක්කොම අත් උස්සලා අනුමත කර ගන්න. මට අදාළ නැහැ. මම කියන්නේ නීත්‍යානුකූල නැහැ. අධිභාරයක් ගෙවන්න ආවම ඔක්කොම ගෙවන්න ඕන. හැබැයි එකක් තියෙනවා. දිගින් දිගට මේක යන්න බැහැ. මම මේක ඉදිරිපත් කරපු තුන් හතර වෙනි වතාව මේ. කරුණාකරලා ලිඛිතව උපදෙස් ගන්න කොමසාරිස්තුමාගෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ලිඛිතව යවන්නේ නැහැ. ඔබතුමාලට ඕන නම් ලිඛිතව යවන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පරිපාලන නීති පිළිබඳව විධායකය ඔබතුමා. ඔබතුමාගේ වගකීමක් මේක. මේක ගන්නේ නැත්නම් ඔබතුමා වගකියන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ලිඛිතව ඉල්ලන්න. ඔබතුමා ලිඛිතව කොහොමත් ඉල්ලන එකනේ. ඔබතුමා ඉල්ලන්න කිසි ප්‍රශ්නයක් නැහැ. මට පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් මේකට උපදෙස් ගන්න ඕන නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මමත් මුදල් කමිටුවේ ඉන්න නිසා මේ මතුවෙච්ච කරුණ සම්බන්ධයෙන් කතා කරන්න ඕන. අපි සභාව විදියට බලය දීලා කමිටුවක් පත්කරාම ඔබතුමන්ලා වියදම් සම්බන්ධව නිර්දේශ කරලා අනුමත කරලා යනවා. සභාවෙන් ඒක අනුමත කරලා ගෙවීම් කරත් ප්‍රශ්නයක් වෙච්ච දවසට ඔබතුමා ඇතුළු සභාව ගෙවීම් කරන්න ඕන. දැන් මෙතුමන්ලා කෑ ගහන එකෙත් සාධාරණයක් තිබෙනවා. ඔබතුමන්ලා හොයලා බලන්න. නම් ගම් කියන්නේ නැහැ මම. පහුගිය දවසක ටෙලිකොම් කුළුණු සම්බන්ධව ගනිපු ක්‍රියාමාර්ගයකට ඒ ආයතනය නඩු දාලා කොළඹ උසාවියේ, හිටපු සභාපතිතුමා ඇතුළු මේ අයට රුපියල් පනස් දහසක ඇපයක් තියන්න වෙලා තියෙනවා. මෙතුමා විතරක් නෙමෙයි තව අය ඉන්නවා. ඒක නිසා අනිත් මන්ත්‍රීවරු දැන ගන්න ඕන කමිටුව තියෙනවා, සභාව

තියෙනවා. ඒවා අනුමත කරා කියලා ලැස්ති වෙන්න එපා. ඒ මුදල් සම්බන්ධව වැරැද්දක් වෙලා තියෙනවානම් විශ්‍රාම ගියත් ඒ විශ්‍රාම වැටුපෙන් පවා කැපෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය කියන දේටම වෙනම නඩුවක් දාලා මම දිනුවනේ නඩුව.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක හරි. කවුද කැමති උසාවි යන්න. පෙරකදෝරුවෝ අල්ලන්න කීයද යන ගාන. හැමෝටම ඒක කරන්න බැහැ. 2011, 2012 වැඩ ඒ. ඒවාට නිකං අපිට බලය දීලා තියෙනවා කියලා හැමතිස්සෙම මන්ත්‍රීවරු විදියට එහෙම හැසිරෙන්න ලේස්ති වෙන්න එපා. මුදල් රෙගුලාසි එක්ක කාටවත් සෙල්ලම් කරන්න බැහැ. මුදල් රෙගුලාසි කියන්නේ හිරේ දාන්න පුළුවන් කාරණා. ඒක නිසා අපිට මෙහෙමයි, අරහෙමයි කියලා කර ගන්න පුළුවන් වෙයි කියලා හිතන්න එපා. මේවා සම්පූර්ණයෙන්ම මහා බරපතල සිද්ධි. තමන්ගේ රැකියාව පවා අහිමි වෙන තැන්. විශ්‍රාම වැටුප් පවා අහිමි වෙන ඒවා. ඒක නිසා විධිමත් විදියට කරන්න. දන්නෙ නැත්නම් අහන්න. අපේ ඊළඟ සුප්‍රීම් එක විදියට තියෙන්නේ පළාත් පාලන කොමසාරිස්තුමා. එතනින් ඒ උපදෙස් ගන්න ඕන. තමන්ට හයිය, බලය තිබුණා කියලා ඔහොම පහත් කරන්න එපා. දන්නේ නැති හින්දා අපි මන්ත්‍රීවරු විදියට ඉල්ලන්නේ ඒ උපදෙස් අපිට අරගෙන දෙන්න. අපි කවුරුත් දැනුවත් වෙන්න ඕන. මේ සමහර අය මුකුත් දන්නේ නැහැ. අපේ බලය තියෙනවා, කණ්ඩායම තියෙනවා කියලා අත උස්සන්න ලැස්ති වෙන්න එපා. විශේෂයෙන්ම මුදල් සම්බන්ධ කටයුතු වලදී ලේකම්තුමා ප්‍රධාන පරිපාලන නිලධාරියා විදියට වගකීම ගන්න ඕන. ඒක මම අද සභාවේදී යෝජනා කරනවා. අපි හැමතිස්සෙම හොයන්නේ බලන්නේ නැහැ. අපි අත්සන් කරලා නිර්දේශ දෙනවා. ඒ මතයේ ඉඳගෙන මුදල් ගෙවලා ප්‍රශ්නයක් වුණොත් සභාවේ ලේකම්තුමාට සම්පූර්ණ වගකීම ඇතුවයි ඒ නිර්දේශ මම දෙන්නේ. මේක අනිවාර්යයෙන්ම සභා වාර්තාවට එන්න ඕන. අපිට කවදා හරි උසාවියකට ගියාම සභාවේ ලේකම්තුමාට ඒ බලය තියෙනවා. අපි මොන තීන්දුව ගත්තත් ලේකම්තුමා හරි දේ තමයි කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාවේ ලේකම්තුමාට සම්පූර්ණ වගකීම තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාරක සභා අවස්ථාවක් කරලා අවස්ථාව දෙනවා ලේකම්තුමාට මේ ගැන අදහස් දක්වන්න. මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- සභාපතිතුමාට මුදල් සහ ප්‍රතිපත්ති කමිටුවේ මෙන්ම මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කටයුතු සිදු කළ හැකි බව හා මේ සම්බන්ධව අභිමතය හා බලය සභාපතිතුමාට ඇති බව.
- මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව හැරුණු විට ඇති අනෙකුත් කාරක සභා තුනටද තීන්දු තීරණ ගැනීමේ හැකියාව ඇති බව.
- බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට කළ සේවය වෙනුවෙන් අදාල ගෙවීම් කටයුතු සිදු කරන බව.
- මීට අමතරව මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව ඇති ගැටලු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දැන් යෝජනා කරපු 2020-07-06 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව ස්ථිර කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි විරුද්ධයි ඒකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-07-06 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡේදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 12

විපක්ෂව - 06

ඡන්දය දීමෙන් වැළකී සිටි - 01

ඡන්ද විමසීම සිදු කරන විට සභා රැස්වීම් ශාලාවේ නොසිටි - 03

**යෝජනාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබාදුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
03. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
06. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
10. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
11. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
12. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**යෝජනාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබාදුන් පිරිස**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
04. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
05. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
06. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**යෝජනාව සම්මත කිරීම සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය

**ඡන්ද විමසීම සිදු කරන විට සභා රැස්වීම් ශාලාවේ නොසිටි පිරිස**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** වැඩි ඡන්ද හයකින් එම වාර්තාව සභා සම්මත විය.

**<u>02. තාක්ෂණික සේවා කමිටුව</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** I. 2020-07-06 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ః-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** I. 2020-07-10 දින පැවති නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ః-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. පරිසරය සහ පහසුකම් කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-07-10 දින පැවති පරිසරය සහ පහසුකම් කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(උෟ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ජුනි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ජුනි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ජුනි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. වෙනත් ලේඛන**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව.

මේක සභාගත කරනවා.

**(උෟ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ජූලි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඇත්තටම මේ ප්‍රගතියේදී අපි ඉන්නේ දුර්වල තැනක. ඒ නිසා අපිට හම්බ වෙන්නේ කරපු කර්මාන්ත පිළිබඳ විස්තර පමණයි. ඒ නිසා මේ පාර තියෙන වටිනම දේ තමයි ආදාහනාගාරය සිට්ට්‍රස් වත්තේ හදන්න ගනිපු එක. ඒක තමයි වැදගත් දෙයකට තියෙන්නේ. ඔබතුමාට බොහොම පැහැදිළිව මාස ගණනාවක් තිස්සේ ඉදිරිපත් කරා රොස්වුඩ් වත්තේ ඉඩම පිළිබඳව ඒ ලිපිගොනුව ගෙන්න ගන්න කියලා. ඒක තවම සිද්ධ වෙලා නැහැ. අපි බලමු ඊළඟ සභාව වෙන කොටවත් ඒක ගෙන්න ගන්න.

ඊළඟට අපි යෝජනාවක් කරා. දැන් මේක දවසෙන් දවස, මාසයෙන් මාසය පහුවෙනවා. මේවා ගැන බලන්නේ නැහැ. හැබැයි ඊට පස්සේ මේ සභාවේ මුදල් තමයි මේවාට වියදම් වෙන්නේ. මේ වෙන්දේසි

ඉඩම් වල අවුරුදු පහක් සම්පූර්ණ නොවුණ ඉඩම් පිළිබඳව බලලා ඒ ඉඩම් වලට ගිහිල්ලා ඒවා වහාම ප්‍රතිසංස්කරණය කරන්න කියන එක ඉල්ලා සිටිනවා. මේ මන්ත්‍රීවරු කණ්ඩායමට යන්න පුළුවන් මේවා බලන්න. කරන්නේ නැත්නම් අසාදු ලේඛන ගත කරනවා කියන මට්ටමට යන්න. ඒවා ක්‍රියාත්මක වෙලා නැහැ තව වෙනකම්.

ඊළඟට හපුගල සොහොන් භූමිය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඔබතුමා ඉතාම හොඳ තැනක හිටියා කියන ආරංචිය තියෙනවා. එතන සුද්ධ කරලා පවුලක් පදිංචි කරන්න ගිහිල්ලා තියෙනවා. ඒ වැඩ කරන්න දෙන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඉන්නකම් අපේ ඒවාට ඇතුල් වෙන්න ඉඩ දෙන්නේ නැහැ. මොන දේශපාලන ප්‍රශ්නය ආවත් මම ඒකට ඉඩ දෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට ආරංචිය තියෙනවා ඔබතුමා ඒකට තදින් ඉන්නවා කියලා. ඒක බොහොම හොඳයි. නිවාස ඉදිකිරීම පිළිබඳව ගත්තම ගරු සභාපතිතුමා අනවසරයෙන් නිවසක් හැදුවම, එහෙම නැත්නම් නීතියට එකඟ නැතුව හැදුවම ඒක කඩවන්න ගියහම පොඩි චෝදනාවක් තියෙනවා. ඒක කළ යුතුයි. විශේෂයෙන්ම මේ පොඩි අහිංසකයොන්ගේ ඒවාට නෙමෙයි, ලොකු එකකට දෙකකට තීන්දු ගන්න කිවුවා. තව වෙනකම් ඒක සිද්ධ වෙලා නැහැ. හැබැයි මට පේන දෙයක් තියෙනවා. දැන් මම හිතන්නේ තව මාසයකට වැඩිය නැතුව ඇති අර තට්ටු තුනේ ගොඩනැගිල්ල. ඒක ලොකු ගොඩනැගිල්ලක්. ඒවගේ ඒවා වෙන්න ඕන. මේ ගෙවල් හදාගෙන යනකොට ඇත්තටම අපේ තාක්ෂණ නිලධාරි මහත්වරුන් කරන්න ඕන අධීක්ෂණයක්. ඒ අය දන්නේ නැහැ අන්තිමට මොනවද වෙන්නේ කියලා. ඒ අධීක්ෂණය විතරක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. විශේෂ අවස්ථා තියෙනවා නම් යන්න ඕන. සභාවේ කමිටුවක් දාලා ඒ කමිටුව ගිහිල්ලා හරි ඒක නියමිත ප්‍රමිතියට කරලා තියෙනවාද කියලා බලන්න ඕන ඒ තාක්ෂණ නිලධාරි මහත්වරුන් එක්ක ගිහිල්ලා. එහෙම බලන්න අවස්ථාවක් තියෙන්න ඕන. අපි දකිනවා හුඟක් දුරට එහෙම කෙරෙන දේවල් තොගයක් තියෙනවා. අනුමත කරලා තියෙනවා. මම පොදුවේ කියන්නේ. එක්කෙනා එක්කෙනා නම් කරලා කියනවා නෙමෙයි. ඒ නිසා තාක්ෂණ නිලධාරි මහත්වරුන්ට වගකීමක් තියෙනවා. මේ සභාවෙන් මේක වගකීමක් විදියටම පවරන්න. මම යෝජනාවක් විදියට ඊළඟ සභාවට ගේන්නම්. දැන් හරි මේක අරගන්නම්. මේක යෝජනාවක් විදියට එන්න ඕනත් නැහැ ගරු සභාපතිතුමනි. මේ අනුමැතිය දුන්නට පස්සේ ඒක ගිහිල්ලා බලන්න ඒ කියපු ක්‍රමයට හදනවද කියලා සතියකට දෙකකට පාරක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනුකුලතා සහතිකයෙන් ඒක ආවරණය වෙනවා. අනුකුලතා සහතිකයක් ගන්න ඕනනේ වැඩේ මේ අනුව කරා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොකරමුල්ලගොඩ කඩලා ගියපු ගෙදර අනුකුලතා සහතිකය දීලා තියෙනවාද, නැද්ද, ඒ තාප්පයේ ඉඳලා කැඩිලා ගිහිල්ලා. දැන් ඒ අනුකුලතා සහතිකය දෙනවා කියන එක ඇත්තටම ඔය ඉඩම් හිමියන්ගේ නම් අරගෙන බලාගන්න ඒ අය ඇත්තටම බැංකුවේ ණය මුදල් අරගෙන තියෙනවාද කියලා. ඉතිං ඒක නරක තත්ත්වයක්. මම කියන්නේ මේක තමයි වෙලා තියෙන්නේ. මෙහෙට මේවා වුණොත් අහිංසක මිනිස්සුන්ට පමණයි මේ ඔක්කොම දඩ විඳින්නේ. ඉතිං ඒක හින්දා ගරු සභාපතිතුමා මේ පිළිබඳව, විශේෂයෙන්ම පාරවල් පිළිබඳව බලන්න. එක මාසයක් යනවා කියන්නේ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට තමයි ඒ ප්‍රදේශයේ ඉන්න අය අන්තිමට ඇවිල්ලා වද දෙන්නේ. ඡන්ද දායකයෝ මහජන නියෝජිතයන්ට තමයි ඊට පස්සේ ඇවිල්ලා වද දෙන්නේ. ඊළඟට බොහොම පැහැදිළිව අසාදු ලේඛන ගත කරන්න ඕන පාරවල් ප්‍රතිසංස්කරණය කරලා නොදෙන අයව. ඊළඟ සභාව වෙනකොට ඒක දෙන්න. එතකොට කවුරුත් නිදහස් වෙයි. ඡන්ද සටනත් ඉවර වෙලා තියේවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගෙත් ප්‍රශ්නයක් තියෙනවා ඒ අතරේ සභාවත් එක්ක කතා කරන්න ඕන. පස්මාලුව හරස් පාරේ වෙන්දේසියක් කරා. ඒකේ දැන් ජලය සම්බන්ධව ගැටළුවක් තියෙනවා. ඒ මිනිස්සුන්ට වතුර නැහැ දැනට. පදිංචි වෙලා ඉන්නේ. ඒ මිනිස්සුන්ට වතුර දීලා නැහැ. කොම්පැනියක් හොයා ගන්නත් නැහැ. ඒකත් වහලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක තමයි ප්‍රධානම කාරණය. සුගත් මන්ත්‍රීතුමා එක වෙලාවක ගෙනාවා ප්‍රශ්නයක්. දැන් මේක පිළිබඳව අපෙත් අඩුපාඩුවක් තියෙනවා. ඒක අපිට බලාගන්න බැරි වුණානේ. අපිට ලැබුණ ඉඩම් කැලි මොනවද කියලා බලාගන්න බැරි වුණා. ඔබතුමාගේ තියෙන ලොකුම යුතුකම තමයි, කරන්න පුළුවන් එක තමයි සභාවට අයිති ඉඩම් කැලි ටික වටකරලා වැට ගහලා මේක සභාවේ ඉඩමක් කියලා ගහන්න. එතකොට ඒකේ වටිනාකමක් තියෙනවා. දැන් බලන්න ගැමුණු මාවතේ ඊයෙත් ළමයෙක් තුවාල වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක අපි කලිනුත් කිවුවා. තව එකක ගෙයක් හදනවා කිවුවානේ. ඒක ඉවර කරානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට වික්ලන්ඩ් ටෙරස් එකේ ඉඩම එහෙමම තියෙනවා. ඒ වගේ ඒවා කාගේ කාලෙද, මොකක්ද කියන එක බලන්න එපා. ඒකට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්න ඉදිරි කාලයේදී. මම හිතන්නේ මීට වැඩිය සංවාද කරලා, විවාද කරලා යන්න පුළුවන් වෙයි. එතකම් හැබැයි මේ වැඩ ටික නිලධාරී මහත්වරුන්ට භාර දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාහනය දෙන්නම් ඔයගොල්ලෝ වැඩේ කරන්න. කැබ් එක දෙන්නම් ඕන වෙලාවක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ අඩුපාඩුව වුණා. කිවුවනේ ඒක.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට දැනගන්න ලැබුණා අපේ ප්‍රාදේශීය සභාවේ සේවක මහත්මයෙක් වන ජයන්ත මහත්මයා සහභාගි වෙන අවසන් සභාව අද කියලා. එතුමා විශ්‍රාම යනවා. ඒ වෙනුවෙන් එතුමන්ගේ සේවය අගය කරලා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු විදියට විශේෂ ස්තුතියක් පුද කරනවා එතුමා වෙනුවෙන් මේ සභාවට කරපු සේවාව වෙනුවෙන්. ලොකු දායකත්වයක් ලබා දුන්නා. ඒ වෙනුවෙන් විශේෂ ස්තුතියක් පුද කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම ජයන්ත මහත්මයා මේ සභාවේ සෑහෙන්න කාර්යයභාරයක් කරා දීර්ඝ කාලයක තිස්සේ. ඉතාමත්ම නිහඬ චරිතයක්. කිසි කෙනෙක්ගෙන් බැනුම් අහන්නේ නැතුව, කිසි කෙනෙක්ගේ චෝදනාවට ලක් වෙන්නේ නැතුව නිහඬ සේවයක් කරේ. ඒ පිළිබඳව ඔබතුමා මතුකරපු එක හොඳයි. ඒ පිළිබඳව සභාපතිවරයා විදියට සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා වෙනුවෙන් ලේකම්තුමා ප්‍රධාන නිලධාරි මණ්ඩලය වෙනුවෙන් එතුමාගේ විශ්‍රාම ජීවිතයට සුභ ප්‍රාර්ථනා එක් කරනවා. ඒ වගේම විශ්‍රාම දිවිය සර්වප්‍රකාරයෙන්ම සාර්ථකව, නිදුක් නිරෝගීමත්ව ගත කරන්න හැකියාව ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2020.08.18 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.